# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018** අප්‍රේල් **03** වන අඟහරුවාදා
2018 சித்திரை 03 செவ்வாய்க் கிழமை
Tuesday 03rd April 2018

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.34 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.34 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.34 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

## සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"සභා රැස්වීම් පැවැත්වෙන දිනයක් ලෙස, මීත් පෙර තීරණය කර තිබූ 2018.04.17 දින සභා රැස්වීම නොපැවැත්වීමටත්, අද දින සභා රැස්වීමෙන් පසුව 2018.05.08 වන දින සභා රැස්වීම පැවැත්වීමටත් සුදුසු බව පසුගිය සභා කටයුතු කාරක සභාවේදී එකඟතාවයකට පැමිණියා. ඒ අනුව සභාවේ රැස්වීම සම්බන්ධ යෝජනාවක් අද දින න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති අතර, න්‍යාය පත්‍රයේ එම විෂයට පැමිණි විට ඒ පිළිබඳව නිශ්චිත තීරණයක් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත පූර්ව දැනුම් දීමක් ලෙස දන්වා සිටිනවා."*

*ii*

*"පසුගිය සභා රැස්වීම් දිනවල මෙන්ම, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව, එතුමාගේ අසනීප තත්ත්වය සලකා බලා තාවකාලිකව අද දින තුළදීද එතුමාට පහසු ආසනයක් හා අදාළ පහසුකම් ලබා දීමට කටයුතු කර තිබෙනවා. එම ආසන පහසුකම් ලබා දීම ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා ලබා දුන් සහයෝගය මම නැවත වරක් ඉතාම ගෞරවයෙන් අගය කරනවා."*

## කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018.03.21 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී යමක් ප්‍රකාශ කරන්න තිබෙනවා. මේ හැන්සාඩ් වාර්තාව හා සම්බන්ධව. 2017 දෙසැම්බර් මස 06 වන දින මම මගේ කථාවේදී ප්‍රකාශ කළා පළාත් සභා ලේකම් කාර්යාලයේ, ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා පළාත් භාණ්ඩාගාරයේ නිලධාරීන්ට 1/3 දීමනාව ලබා දීම ගැන. ගරු ආණ්ඩුකාරතුමා ඒ ගැන අවධානය යොමු කරලා තිබෙනවා. ඉතා හොඳයි. සතුටට කාරණයක්. ගරු ආණ්ඩුකාරතුමා අවධානය යොමු කරලා ඒ කෙරෙහි මේ සම්බන්ධයෙන් කටයුතු කරනවාය කියලා කියලා තිබෙනවා. ඒ වාගේම මේක පිටපත් කරලා තිබෙනවා, ප්‍රධාන ලේකම්තුමාට. නමුත් ඇත්ත වශයෙන්ම මේකට මැදිහත් වුණු කෙනා හැටියට මට පිටපතක් එවලා තිබුණේ නැහැ. මට වෙනත් ක්‍රමයකට ලැබුණා. මම ඉල්ලීමක් කරනවා ඔබතුමා මාර්ගයෙන් සභා ලේකම්තුමාත්, ප්‍රධාන ලේකම්තුමාත් එකතු වෙලා මේ කටයුත්ත ඉක්මණින් ක්‍රියාත්මක කරනවා නම් හොඳයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තූතියි. ඔබතුමාට අපි ඒ ලිපියේ පිටපතක් එවන්නම්.

# පෙත්සම්
PETITIONS

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, වත්තල, මීගමුව පාර, අංක 530/8 ජී හි පදිංචි එම්.වයි. ෂිහාබ්දීන් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මහබෙල්ලන, තොටුපල පාර, ප්‍රින්කෝට්වත්ත, අංක 51/ඩී හි පදිංචි ප්‍රියන්ත ජයලත් ආරච්චි යන අය විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, සභාගත කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා නොපැමිණ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, එතුමා සූදානම් සභාගත කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ආ ඉන්නවා. සමාවෙන්න. මම අර දිහා බැලුවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් ළඟට ඇවිල්ලා ඉන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ප්‍රමෝෂන් එකක් දීලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් අතනත් ප්‍රකාශයක් කරනවා, ඔබතුමාගේ උත්තරය දැන ගන්න අවශ්‍යයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම එතුමාට උත්තර දෙන්න බැඳී නැහැ. මම උත්තර දෙන්න බැඳී ඉන්නේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා පොඩි ඉල්ලීමක් කළේ. ඔබතුමාට පුළුවන් කැමැති නම් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ ඉල්ලීම කරන්න සභාපතිතුමා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම නම් ඉතින් සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම මේ කථා නොකර වාඩි වෙන්නම්. මොකද, රීති ප්‍රකාරව එතුමාට එහෙම බලයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, එතුමා ලැහැස්තියි සභාගත කරන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම ගරු සභාපතිතුමාගෙනුත් සමාව ඉල්ලනවා. ගරු මන්ත්‍රීතුමාගෙනුත් සමාව ඉල්ලනවා. මම උත්තර දෙනවා. මට මේ වෙන දේවල් බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ලැහැස්තියි සභාගත කරන්න. ඔබතුමා ඒකට කැමැතිද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. උත්තර ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් කියන්න කෝ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතුමා සභාගත කරන්න හැදුවේ මම නැහැයි කියලා හිතාගෙන තමයි -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම උත්තර දෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතුමා මම නැහැයි කියලා හිතාගෙනයි සභාගත කරන්න හැදුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගෙන් උත්තර බලාපොරොත්තු වෙනවා.

01.

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :** **(ප්‍ර/**vi/(1)/18/07)

- අ. බස්නාහිර පළාත් සභාවෙන් පාලනය වන පාසල්වල රාත්‍රී මුරකරු තනතුරේ කොපමණ සංඛ්‍යාවක් සේවය කරන බව ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?
- ආ. ඔවුන් බඳවා ගනු ලැබූ ක්‍රියා පටිපාටිය කුමක්ද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?
- ඇ. එසේ රාත්‍රී මුරකරු සේවයේ සේවය කරනු ලබන සමහර අය රාත්‍රී කාලයේ එකී පාසල්වල සේවය නොකරන බව ඔබතුමා පිළිගන්නෙහිද?
- ඈ. රාත්‍රී මුරකරුවන්ගෙන් සමහරුන් සේවය නොකර පැමිණීමේ ලේඛනයට අත්සන් යොදා තම වැටුප ලබා ගන්නා බව ඔබතුමා පිළිගන්නෙහිද?
- ඉ. අදාළ විදුහල්වල බලධාරීන්ගේ අනුග්‍රහය ද සහිතව, මෙලෙස පවතින නීති රීතීන්ට අනුකූලව, රාජකාරිය නොකිරීම සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත්. ඔවුන් නියමිත පරිදි රාජකාරියේ යෙදවීමට ඔබතුමා ගනු ලබන පියවර කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?
- ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

- අ. 942 කි.
- ආ. පුරප්පාඩු වැඩි ප්‍රමාණයක් ඇති අවස්ථාවලදී රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. (2006 වර්ෂයේ මෙම ක්‍රමයට බඳවා ගන්නා ලදී.) පුරප්පාඩු සුළු ප්‍රමාණයක් ඇති අවස්ථාවලදී රාජ්‍ය ආයතනවල දැන්වීම් පුවරුවේ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කර ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ඇ. වාර්තා වී නොමැත.

ඈ. එසේ වාර්තා වී නැත.

ඉ. වාර්තා වුවහොත් විනයානුකූලව කටයුතු කළ හැක. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු මේ සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කළ හැක.

ඊ. අදාළ නැත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය. මේ පිළිබඳව මට උදාහරණ කිහිපයක් කියන්න පුළුවන්. එකක් තමයි හීන්කෙන්ද ප්‍රාථමික විදුහල. අනික් එක කුරුකුලාව ප්‍රාථමික විදුහල. මේ විදුහල් දෙකේම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම කිව්වේ, උදාහරණ දෙකක් පමණයි. එතකොට ඒ අනුව මේ පාසල්වල රාත්‍රී මුරකරු සේවය කරන අය ඒ කටයුත්ත නොකර වෙනත් කටයුතුවල යෙදෙන බවට මට වාර්තා වෙලා තිබෙනවා. ඔබතුමා, මම මේ සඳහන් කරපු උදාහරණත් එක්ක අනෙකුත් පාසල් පිළිබඳවත්, මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කරන්න අවශ්‍ය පියවර ගන්නවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඒ ඉල්ලීම මම භාර ගන්නවා. මේ සභාව ඉවර වෙන්න ඉස්සෙල්ලා මම ඒ පාසලට දැන් මගේ නිලධාරීන් යවනවා. ගිහිල්ලා විදුහල්පතිවරයා එක්කත් කථා කරලා තත්ත්වය බලනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ පාසල් පමණක් නොවෙයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මගේ ගෙවල් ළඟ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, පොදුවේ සියලුම පාසල් පරීක්ෂාවට ලක් කරනවා. දැන් මේ කාරණාවට අදම ප්‍රමුඛතාවය දීලා කටයුතු කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. අහන්න අවසර දෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කැමැති නම් අහන්න පුළුවන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කමක් නැහැ. ඉඩ දෙනවා. තව දෙකක් තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා දීපු මේ උත්තරයට අදාළව. අපට දැන ගන්න කැමැතියි මේ මුරකරු රාත්‍රී හෝ දිවා මුරකරු තව ඇබෑර්තු තිබෙනවාද කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඇබෑර්තු තිබෙනවා. අපි ඉක්මණින් කටයුතු කර ගෙන යනවා සහෝදරාත්මකව -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තිබෙනවා නම් කොපමණ ප්‍රමාණයක් තිබෙනවාද? කොහොමද ගන්නේ කියන එක කියන්න කෝ. මේක අධ්‍යාපන උපදේශක කාරක සභාවේ දැන් අවුරුද්දක් තිස්සේ -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේක ප්‍රකාශයට පත් කළාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැහැ. විවාදයක් නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, මගෙන් අසාධාරණයක් වෙන්නේ නැහැ. භය වෙන්න එපා. මේක ප්‍රකාශයට පත් කළාම ගණන පුළුවන්. හැබැයි, අපට කාඩර් එකක්, නැත්නම් නියමිත සේවක සංඛ්‍යාව කියලා එකක් තිබෙනවා. ඒකට බඳවා ගැනීම අවසන් අදියරට ඇවිල්ලා තිබෙන්නේ. අපි ඉක්මණින් කටයුතු කරලා තමුන්නාන්සේලාට දෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි අවුරුදු දෙකක්ම දැන් බලාගෙන හිටියා. ඒකයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

භය නැතිව ඉන්න. තව පොඩි දවසක් ඉන්න. හේතුව, අපට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරය, භාණ්ඩාගාර ලේකම්, ඊට ඉහළ අයගේ අනුමැතිය අවශ්‍ය වුණා. මට තනියෙන් කරන්න බැහැ ඒක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඔබතුමාට කීයක් ඕනැද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මට එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එපාද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයටම අදාළව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ එහෙම කරන්න බැහැ. ඉවරයි. ඒක කරන්න දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම අහන්නේ රාත්‍රී මුරකරු කියලා බඳවා ගැනීමේ පටිපාටියේ තිබෙනවාද? ගැසට් එකේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සභා රීති තිබෙනවා. එහෙම එක එක්කෙනාගෙන් අහන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රාත්‍රී මුරකරු කියලා ගැසට් එකේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 02 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය යොමු කරනවා.

**02.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :** **(ප්‍ර/vi/(1)/18/08)**

අ. බස්නාහිර පළාත් සභාවෙන් පාලනය වන පාසල්වල කම්කරු තනතුරේ කොපමණ සංඛ්‍යාවක් සේවය කරන බව ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ආ. ඔවුන් බඳවා ගනු ලැබූ ක්‍රියා පටිපාටිය කුමක්ද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ඇ. එසේ කම්කරු තනතුරේ සේවය කරන සමහර අය දිනපතා එකී පාසල්වල සේවය නොකරන බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඈ. කම්කරු තනතුරේ සේවය කරන සමහර අය දිනපතා සේවයට නොපැමිණ පැමිණීමේ ලේඛනයට අත්සන් යොදා තම වැටුප ලබා ගන්නා බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඉ. අදාළ විදුහල්වල බලධාරීන්ගේ අනුග්‍රහය ද සහිතව, මෙලෙස පවතින නීති රීතීන්ට අනුකූලව, රාජකාරිය නොකිරීම සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත්, ඔවුන් නියමිත පරිදි රාජකාරියේ යෙදවීමට ඔබතුමා ගනු ලබන පියවර කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. දැනට පාසල්වල පාසල් කම්කරු තනතුර නොමැති අතර, මේ වන විට ඇත්තේ පාසල් කාර්ය සහායක තනතුරයි. එහි 2200 ක් සේවයේ යෙදී සිටී.

ආ. පුරප්පාඩු වැඩි ප්‍රමාණයක් ඇති අවස්ථාවලදී රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගිනි. (2006 වර්ෂයේ මෙම ක්‍රමයට බඳවා ගන්නා ලදී.) පුරප්පාඩු සුළු ප්‍රමාණයක් ඇති අවස්ථාවලදී රාජ්‍ය ආයතනවල දැන්වීම් පුවරුවේ ප්‍රසිද්ධ දැන්වීමක් පළ කර ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

ඇ. එවැනි තත්ත්වයක් වාර්තා වී නැත.

ඈ. එසේ වාර්තා වී නැත.

ඉ. වාර්තා වුවහොත් විනයානුකූලව කටයුතු කළ හැක.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු මේ සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කළ හැක.

ඊ. අදාළ නැත.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ඇමතිතුමනි, ඉහත සඳහන් කරපු පාසල් දෙකේම මේ පාසල් කාර්ය සහායක තනතුර දරන අය එම රාජකාරිය නොකරන බව ඔබතුමාට වාර්තා වෙලා නැහැ, මේ කියන විධියට. නමුත් මට වාර්තා වෙලා තිබෙනවා. ඒ පිළිබඳව විමර්ශනයක් කරනවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම්තුමා සිටිනවා. විජේතුංග මහත්මා. මම එතුමාට මේ එක්කම නියෝගයක් දෙනවා, වහාම දැන් ඒ කටයුතු ගිහිල්ලා සොයලා බලලා ඉක්මණින් අපට වාර්තාව දෙන්නය කියලා. ඉදිරියේදීත් අපි මේක - මමත් ඔබතුමාගේ අදහසට කැමැති කෙනෙක්. මොකද, මම අවංකව මෙතැනදී එකක් කියන්න ඕනෑ. අපි මේ සම්බන්ධව අවවාද කරලා තිබෙනවා. මේ ළමයි හරියට වැඩ කරන්නේ නැති බව. ඇත්තකුත් තිබෙනවා. අවසාන වශයෙන් මේ පිළිබඳව සානුකම්පිතව පොඩ්ඩක් අපි වැඩිපුර එලෙව්වේ නැති බව මම වුණත් පිළිගන්නවා. නමුත් අද ඉඳලා අපි දැඩි නීතියක් පනවනවා. අනිවාර්යෙන්ම සේවයට වාර්තා කරන්නය කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විශේෂයෙන්ම ගරු ඇමතිතුමනි, පසුගිය මැතිවරණ කාල සීමාව තුළම මේ අය වැඩ කළේ නැහැ. පසුගිය මැතිවරණ කාල සීමාවේ ඔවුන් කළේ ඇත්තටම මැතිවරණ කටයුතුවලට සම්බන්ධ වෙන එක. ඒ ඒ පක්ෂවල. ඔවුන් පත් කරපු. ඒ නිසා ඔබතුමා සියලුම පාසල්වල මේ පිළිබඳව පුළුල් විමර්ශනයක් කරලා ඒ අය නිසි ලෙස රාජකාරිවල යොදවන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි. ඒක ඉතාමත් අවංකව භාර ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 03 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 04 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development) [On Behalf of Chief Minister]

සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 05 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා. මේ ප්‍රශ්න එවපු ලිපියේ පොඩි පොඩි අඩුපාඩුකම් ටිකක් තිබෙනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, අපි අවුරුදු තුනක් විතර පෙරුම් පුරලා, පෙරුම් පුරලා මේ පළාත් පාලන ආයතනවල ඡන්ද කොට්ඨාශ ක්‍රමයට තියන්න ඕනෑ කියලා ඉවර වෙලා, කොහොම හරි කරීකාවකට ඇවිල්ලා දැන් ඡන්දයත් පැවැත්වුවා. නමුත් ඒ ඡන්දය පවත්වලා ඉවර වුණාට පස්සේ තමයි මෙවැනි කොට්ඨාශ ක්‍රමයට ඡන්දය ඉල්ලපු, ඒ වෙනුවෙන් පෙනී සිටපු, ඒ වෙනුවෙන් නීති රීති සම්පාදනය කරපු අයට පවා තේරුණේ මේක මොන තරම් අසාර්ථකද? අසාධාරණද කියලා. කලින් තිබුණේ සමානුපාතික ක්‍රමය. ඇත්ත වශයෙන්ම අර කුලල් කා ගැනීම, අධික මුදල් වියදම් කිරීම, තාන්න මාන්න දීම, ලාභ ප්‍රයෝජනවලට මන්ත්‍රී ධූර අරවා මේවා යනවාය කියලා කතන්දර තිබුණු නිසා තමයි මේ කොට්ඨාශයට වග කියන මන්ත්‍රීවරයෙක් තෝරන්න ඕනෑය කියලා හිතලා මේ පිළිබඳව කටයුතු කළේ. දැන් ඒ ඡන්දය තිබ්බාට පස්සේ ඒ වෙනුවෙන් පෙනී සිටි අයට පවා තේරිලා තිබෙනවා, මොන තරම් ව්‍යාකූල තත්ත්වයක් මේ පළාත් පාලන

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා]

ආයතනවල පැන නැගුනාද කියලා. විශේෂයෙන්ම කොළඹ මහ නගර සභාව ගත්තොත් මන්ත්‍රීවරු 119 ක් ඉන්නවා. දැන් දවස් දෙක තුනකට ඉස්සෙල්ලා ගරු නගරාධිපතිතුමියව හම්බ වුණා. රැස්වීම් ශාලාවක් නැහැ, ඒ 119 දෙනාව තියන්න. ඉතින් එවැනි ගැටළු තිබෙනවා. උදාහරණක් වශයෙන් ගත්තොත් වත්තල ප්‍රාදේශීය සභාවේ 1991 දී මම සභාපතිවරයා වශයෙන් සිටින කාලයේ, ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමා තමයි විපක්ෂ නායකවරයා හැටියට හිටියේ. එතකොට හිටියේ මන්ත්‍රීවරු 23 දෙනයි. ඒ 23 දෙනා හිටියේ මීගමුවේ තලාහේන පේරුවත් එක්ක. ඊට පස්සේ ඒක 19 ට අඩු වුණා. ඒ 19 අද 35 කට වැඩි වෙලා තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඉතින් ඒක හදන කොට කියන්න එපැයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හදන කොට තමයි කිව්වේ. දැන් ඒක හැදුවේ කවුද? තමුන්නාන්සේ දන්නවාද අඩු ගණනේ ඒක හැදුවේ කවුද කියලා. මම වෙන කථාවලට පැටලෙන්නේ නැහැ. මගේ මාතෘකාව ඒක නොවෙයි. (බාධා කිරීම්) ගියවර වත්තල ප්‍රාදේශීය සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පෞද්ගලික ප්‍රකාශවලට බාධා කරන්න බැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

වැඩේ වුණාට පස්සේ තමයි තේරුණේ මේකේ හැටි. කොට්ඨාශ 29 යි. 19 ක් යූ.එන්.පී. එක දිනුම්. නමුත් නගරාධිපති වෙන කොහේවත්. සල්ලිවලට විකිණෙන සමාජයක් මේක. හරි කමක් නැහැ. මගේ ප්‍රශ්නය ඒක නොවෙයි. ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය තිබෙන්නේ, වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය සඳහා නුසුදුස්සෙකු පත් වුණාය කියන කාරණාව පිළිබඳව. 1988 දී මේ පළාත් සභාවට වත්තල ප්‍රාදේශීය සභාව නිතරඟයෙන් තේරී පත් වුණේ. ඊළඟට පසුගිය වතාවේ, ඒ කියන්නේ 2010 දී මේ ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයට පත් වුණේ ත්‍යාගරත්න අල්විස් කියලා මහත්මයෙක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. නමුත් ඊට කලිනුත් එතුමා එක්සත් ජාතික පක්ෂයෙන් 2002 දී මේ ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයට පත් වුණා. ඒ 2002 දී සභාපති ධූරයට පත් වෙලා ටික දවසක් යන කොට තමයි මේ සභාව නියෝජනය කරපු සුනිල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමාව ඝාතනය වෙන්නේ. ඒ ඝාතනයේ පළමුවැනි විත්තිකාරයා විධියට අදටත් ඒ නඩුව තිබෙනවා. දැන් තව මාස හතර පහකින් ඒ නඩුවේ තීන්දුව දෙනවා. මට ඒක අදාළ නැහැ. නමුත් පසුගිය සභා වාරයේදී එතුමා සභාපති ධූරය දරන කොට ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු වන කේ.එන්.ආර්. නිමල් පෙරේරා මහත්මයා පළාත් පාලන කොමසාරිස්තුමියට පෙත්සමක් ඉදිරිපත් කරනවා. සභාපති ධූරයේ කටයුතු කරද්දී වුණු එතුමාගේ තිබෙන යම් යම් ක්‍රියාකලාප පිළිබඳව. ඒ පිළිබඳව විශේෂ කොමිෂන් සභාවක් පත් කරලා ඉවර වෙලා ඒකට තීන්දුවක් දුන්නා. පළාත් පාලන කොමසාරිස්තුමිය. මේ තිබෙන්නේ ලිපිය. ඒ කමිෂන් සභාවේ වාර්තාව අනුව අවසානයේ තිබෙන්නේ මෙන්න මෙහෙමයි. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අධීක්ෂණ ප්‍රඥප්තිය යටතේ සභාපති ත්‍යාගරත්න අල්විස් මහතාට එරෙහිව කටයුතු කිරීමට නිර්දේශ කරමි. එරෙහිව කටයුතු කිරීමට. මොනවාද තිබෙන්නේ? පමුණුගම දැලතුර ක්‍රීඩා පිටිය භූමිය තුළ ඉදි කර තිබූ ක්‍රීඩා මණ්ඩපය කඩා ඉවත් කිරීමට සභා තීරණයක් ගෙන නොතිබියදී කඩා ඉවත් කිරීමට ඉඩ දීම හෝ ඉඩ හැරීම සම්බන්ධව.

දෙවැනි කාරණය, පළාත් නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ රුපියල් මිලියන 10 කට ප්‍රධානයක් ලෙස මාතෘ සායන ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ප්‍රාදේශීය සභා මූල්‍ය රීති 178 වගන්තියේ අංක 05 උප වගන්තිය ප්‍රකාරව රුපියල් ලක්ෂයකට වැඩි ව්‍යාපෘතියක් සඳහා බල ප්‍රදේශයේ බෙදා හරින දේශීය පුවත්පත් දෙකක පළ කරන කොන්ත්‍රාත් ඉංජිනේරු තෝරා ගෙන අවිධිමත් ආකාරයට කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන ගිවිසුම් ගත වීමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පළමු ගෙවීම් වාර්තාව අනුමත කිරීම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය නම් අවසානයි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මට තව විනාඩියක් දෙන්න. මේක වැදගත් දෙයක්. ඉවර කරනවා. මට බාධා කළා. ඒකයි වුණේ. වත්තල ප්‍රාදේශීය සභාවට අයත් පමුණුගම වෙළඳසැල් භූමියේ බාහිර පාර්ශවයන්ට කඩ කාමර ඉදි කිරීමට ඉඩ දීම. ඊළඟට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගේ අංක 3/1/19 හා 2014.02.19 දිනැති අතිරේක ලේකම් (සංවර්ධන) අබ්දුල් මජීඩ් මහතාගේ ලිපියෙන් ලබා දුන් උපදෙස් පරිදි වත්තල ප්‍රාදේශීය සභාවට ලබා දුන් ගැල්වනයිස් බඩ 432 ක් ගබඩාවට භාර දී ලැබීම් නියෝග මේ දක්වා අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු නොකිරීම.

දැන් මේවාට විරුද්ධව චන්ද්‍රානි සමරකෝන් මහත්මිය ලිපියක් එවලා තිබුණා, කටයුතු කරන්න කියලා. පසුගිය පළාත් සභාවේදීත් අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ ගැන උනන්දුවක් දැක්වුවේ නැහැ. දැන් මෙපමණ චෝදනා එල්ල වෙලා මේ පිළිබඳව කටයුතු කරන්න කියන සභාපතිවරයාම තමයි නැවත වතාවක් මේ ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට පත් වෙන්නේ. ඉතින් මම දන්නේ නැහැ මේක කොපමණ දුරට සදාචාර සම්පන්නද කියලා. මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලනවා. තමුන්නාන්සේ සභාපති ධූරය දරන පෙත්සම් කාරක සභාවේ තීන්දුවකුත් මෙතැන තිබෙනවා. වෙලාව මදි නිසා මම ඒක කියන්න යන්නේ නැහැ. ඒ පෙත්සම් කාරක සභාවේ තීන්දුව දුන්නාම සත පහකට මේ ප්‍රාදේශීය සභාවේ ගණන් ගත්තේ නැහැ. එතකොට මේ පළාත් සභාව ඇතුළේ තිබෙන පෙත්සම් කාරක සභාවේ තත්ත්වය මොකක්ද? කවුරු මේකේ සභාපති වුණත් මට කමක් නැහැ. නමුත් මේ විධියට නීත්‍යානුකූලව - යූ.එන්.පී. ද ශ්‍රී ලංකාද කියන එක අවුලක් නැහැ. කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා කරුණාකරලා මේ නීතිය ක්‍රියාත්මක කරන්නය කියලා මම ගරු ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. මේ වාගේම මන්ත්‍රීවරයෙකු කථා කළා, මීට අවුරුදු දහයකට ඉස්සෙල්ලා. කථා කරලා සති දෙකයි. වෙඩිල්ලක් පත්තු වුණා. ඒකටත් මුහුණ දෙන්න බලාගෙන තමයි මේ ප්‍රකාශය කරන්නේ. කරුණාකරලා නීතිය ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ගොඩක් කාලය ලබා දුන්නා. ගරු මන්ත්‍රීතුමා, මම දැක්කා අද පත්තරේ දාලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයේ තුන් දෙනෙකු ඡන්දය දීලා අද දින විනය පරීක්ෂණ තියනවා කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කෝටි ගණන්වලට විකිණෙන සමාජයක්. ඒක හොඳට මතක තියාගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පත්තරේ තිබෙනවා දැක්කා. ඒකයි කිව්වේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, මේ ඡන්ද ක්‍රමය වැරදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළඟ කාරණාවත් ඒකම තමයි. චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ගරු සභාපතිතුමනි, මේ රටේ පළාත් පාලන ක්‍රමය වෙනස් කරලා අලුත් ක්‍රමයකට, කොට්ඨාශයකට වග කියන නියෝජිතයන් පත් කර ගැනීම සඳහා පෙබරවාරි 10 වැනිදා මේ මැතිවරණය පැවැත්වුවා. මෙතැනදී මම විශේෂයෙන්ම මතක් කරන්නේ, මේ තත්ත්වය දැන් සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කථා කළා වාගේම මේ රටේ හැම තැනකම බොහෝ තැන්වල මේ ක්‍රියාවලිය සිද්ධ වෙලා, මේ ක්‍රියාවලිය තුළින් දැන් අයහපත් ප්‍රතිඵල ලැබෙමින් පවතිනවා. විශේෂයෙන්ම මම මේ වෙලාවේ කථා කරන්නේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සිදු වුණු ක්‍රියාවලියක් පිළිබඳව. මේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ බල සංයුතිය තිබුණේ පොදු ජන එක්සත් පෙරමුණට මන්ත්‍රීධූර 26 යි. ඒ වාගේම අනෙකුත් සියලුම කණ්ඩායම්වලට, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ශ්‍රී ලංකා

[ගරු චන්ද්‍රසෝම සරණලාල්]

නිදහස් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ කණ්ඩායමට මන්ත්‍රීවුර 27 යි. මෙතැනදී නිශ්චිතව කොයි පක්ෂයකටවත් බලය දීලා තිබුණේ නැහැ. සභාපතිවරයා පත් කර ගැනීමේදී. එතැනදී සභාපතිවරයා පත් කර ගැනීමේ කර්තව්‍ය බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමියගේ, චන්ද්‍රානි සමරකෝන් මැතිනියගේ මූලිකත්වයෙන් සිද්ධ කළා. ඒ කරන අවස්ථාවේදී දෙපාර්ශවයෙන් යෝජනා දෙකක් ආවා. දෙන්නෙක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට යෝජනා වුණා. මේ අවස්ථාවේදී පනතේ 66 දෙවැනි වගන්තියෙන් කියවෙන්නේ එවැනි අවස්ථාවක සභිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නම් නගරාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා යෝජනා කොට ස්ථිර කරනු ලැබූ අවස්ථාවක තෝරා පත් කර ගැනීමේ ක්‍රමය පැමිණ සිටින සාමාජිකයන් විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලබන විවෘත හෝ රහස්‍ය ඡන්දයක් මගින් විය යුතුය. එවැනි අවස්ථාවකදී රහස් ඡන්දයකට ගියේ නැහැ. එතුමිය ප්‍රකාශ කළා පැහැදිලිවම. විශේෂයෙන් මේ සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලීමක් කළා. මොකද, එතුමිය රහස් ඡන්දයක් පැවැත්වීම පිළිබඳව - විවෘත ඡන්දයක් ගන්න කටයුතු කළා. එතැනදී ඒකට විරුද්ධ වුණා.

ගරු සභාපතිතුමනි, රහස් ඡන්දයක් ඉල්ලන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි. අවුරුදු හතරකට සභාව පත් වෙන්නේ. එතකොට එතැනදී විවෘතව ඡන්දයක් දීම තුළ ඒ අයට ඉදිරියේදී කටයුතු කර ගෙන යන්න බැහැ. මේක ආරක්ෂා කර ගැනීමක් හැටියට තමයි රහස් ඡන්දයක් ඉල්ලුවේ. ඒකට පළාත් පාලන කොමසාරිස්තුමිය අවස්ථාව ලබා දුන්නේ නැහැ. ඉතාමත් පක්ෂග්‍රාහී විධියට කටයුතු කරලා, එතැන සාධාරණත්වයකින් තොරව තමයි අද සභාපතිවරයා පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් හැටියට අපේ මහ ඇමතිතුමාට වගකීමක් තිබෙනවා, මේ අවස්ථාවේදී මේ සඳහා මැදිහත් වෙලා ඒ යම් අසාධාරණයක් වෙලා තිබෙනවාද කියන එක පිළිබඳව සොයා බලා කටයුතු කිරීමේ අවස්ථාව එතුමාට තිබෙනවා. මම මේ සභාවේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම අපේ මන්ත්‍රීවරු 104 දෙනාටත් මේ පිළිබඳව අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම කරමින් මට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ කාරණාවේදී ගරු මහ ඇමතිතුමාට මොකුත් කරන්න බැහැ. ඒක මහජන මතයෙන් පත් වුණු මන්ත්‍රීවරු ගන්න තීන්දු ඒවා. නියෝග. අපට මොකුත් කරන්න බැහැ.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ඒක වැරදියි. ඒ බලය පළාත් පාලන කොමසාරිස්ට තිබෙන්නේ. තිබෙන්නේ. මැතිවරණ කොමසාරිස්ට බලයක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

මැතිවරණ කොමසාරිස් පළාත් පාලන කොමසාරිස්ට දීලා තිබෙන බලයක් මිස ඒක මම දීපු බලයක් නොවෙයි.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ඒක තමයි. ඒක වැරදියි. මේ පනත උල්ලංඝනය කරලා තිබෙන්නේ.

**ගරු අශෝක දයාරත්න**
Hon. Ashoka Dayarathne

ගරු සභාපතිතුමනි. ඉතාමත් වැරදි ලෙස කොමසාරිස්තුමිය නොමග යවලා මේගොල්ලෝ ඡන්ද ප්‍රකාශ කරන්න ගත්තා. නමුත් ඉතාමත්ම සාර්ථකව, ඉතා හොඳින් කොමසාරිස්තුම එදා ඒ වැඩේ ඉෂ්ට කළා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඔය සම්බන්ධයෙන් පළාත් පාලන විෂය භාර ඇමතිවරයා හැටියට මට බලතල නැහැ. මැතිවරණ කොමිෂන් සභාවෙන් දුන්න නියෝග අනුව තමයි ලංකාවේම පළාත් පාලන කොමසාරිස්වරු ගියේ. ආසන්නම උදාහරණය තමයි, කෝට්ටේ නගර සභාව

උදාහරණයකට ගත්තොත් කෝට්ටේ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂයේ නායකයා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ ලියුමක් අරගෙන තිබෙනවා. ඒක එහෙම ගන්න බැහැ. මොකද, ඒ දයාරත්න මන්ත්‍රීතුමා කියන කෙනා අවුරුදු ගණනක් නගර සභාවේ මන්ත්‍රීවරයෙකු හැටියට හිටියේ. එතකොට එයාගේ ලියුම එයාට ගිහිල්ලා දෙන්න ඕනෑ. මට ලියුමක් ගන්න බැහැ. ගාමිණී තිලකසිරි ඇමතිතුමාගේ පළමු රැස්වීම කැඳවපු ලියුම මට භාර ගන්න බැහැ. ඒ වාගේ ටෙක්නිකල් ඉෂූස් තිබිලා තිබෙනවා. දැන් මෙතැනත් වෙලා තිබෙන්නේ, පළාත් පාලන කොමසාරිස්තුමියට චෝදනා කරන්න බැහැ. එතුමිය කොමිෂන් සභාව. දැන් සමහර තැන්වලදී අපි උපදෙස් දුන්නත් එතුමිය කිව්වා, ඔබතුමාගේ උපදෙස් අනුව ක්‍රියා කරන්න බැහැ. මට තිබෙන බලය අනුව තමයි කටයුතු කරන්න වෙන්නේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් ගරු ඔබතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වෙනවා. මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම ගැන. ඔබතුමා දන්නවා දේශපාලන ජීවිතයේ ඉතාමත්ම වේදනාත්මක තීන්දු තීරණත් ගන්න සිද්ධ වෙනවා. මේක ඉතාම වේදනාත්මක තීන්දුවක්. මොකද, අපි සියලු දෙනා දන්නවා අධ්‍යාපන උපදේශක කාරක සභාව කියලා කියන්නේ, අපි ඉතාම ආශාවෙන් සහභාගී වෙන්න කැමැති වන උපදේශක කාරක සභාව. ඒ නිසා තමයි උපදේශක කාරක සභාවලට නම් කරද්දී අපි පළමුවැනි යෝජනාව විධියට අධ්‍යාපන උපදේශක කාරක සභාවට අපිව ඇතුළත් කරන්නය කියන ඉල්ලීම කරන්නේ. ඒකට ප්‍රධානම කාරණාව තමයි පළාතේත් මේ රටේත් සියලු දෙනාගේ ඉතාම සංවේදී කාරණාවක් අධ්‍යාපනය. අද මේ රටේ දෙමව්පියෝ, මේ රටේ පුරවැසියෝ වැඩියෙන්ම උනන්දු වන කාරණාව අධ්‍යාපනය. මේ රටේ අහිංසක මිනිස්සු දන්නවා, තමන්ගේ දරුවන්ට අධ්‍යාපනය නිවැරදිව දී ගන්න බැරි වුණොත් ඒ පවුල්වලට ගැලවීමක් නැහැයි කියලා. ඒ නිසාම තමයි අපි අධ්‍යාපනය වෙනුවෙන් උනන්දු වෙන්නේ. ඒ අධ්‍යාපනය වෙනුවෙන් උනන්දු වන නිසාම තමයි අපට බොහෝ ඡන්ද ලැබෙන්නේ. අපි ඡන්දවලදී අධ්‍යාපනය කරන කාර්යභාරය හරහා තමයි අපේ මැතිවරණ ව්‍යාපාර දියත් කරන්නේ. නමුත් අද අධ්‍යාපන උපදේශක කාරක සභාව විතරක් නොවෙයි. බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයම ඉතාම අවාසනාවන්ත තත්ත්වයට වැටිලා තිබෙනවා. අද අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළට ගියාම මූණ ගැහෙන්න කෙනෙකු නැහැ. පෞද්ගලික කාර්ය මණ්ඩලයේ කිසි කෙනෙකු නැහැ. අධ්‍යාපන උපදේශක කාරක සභාව එහෙම්පිටින්ම විහිළුවක්. අධ්‍යාපන උපදේශක කාරක සභාවට යන මන්ත්‍රීවරුන්ට කවදාවත් ආයිත් අධ්‍යාපනයේ වැඩ කරන්න හිතෙන්නේ නැති ඉතාම කාලකණ්ණි තැනකට ඒ උපදේශක කාරක සභාව දාලා තිබෙනවා. ඒ නිසා ඒ උපදේශක කාරක සභාව -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, රීති සංග්‍රහය -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මෙහෙම කථා කරන්න බැහැ. මම මේ පෞද්ගලික ප්‍රකාශයක් කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

36(1) යටතේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

වාඩි වෙන්න කියන්න. ඊට පස්සේ කථා කරන්න කියන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

36(1). පොඩ්ඩක් ඉන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

36(1) කථා කරන්න මගේ ප්‍රකාශයෙන් පස්සේ. මේ පෞද්ගලික ප්‍රකාශය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, ඔබතුමාට අවස්ථාව දෙන්නම්. මෙතුමාට තව විනාඩි තුනයි තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට දැන් අවස්ථාව එපා. මේගොල්ලොන්ගේ කාලයේ කරපු බලු වැඩ එකක්වත් මගේ අමාත්‍යාංශයේ දැන් කරන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මට මගේ වෙලාව සම්පූර්ණයෙන්ම ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මෙයා Acting Chief Minister. ඒ කාලේ කරපුවා දැන් කරන්නේ නැහැ. කරන්න දෙන්නේත් නැහැ. අපි කිසි වරදක් මේ පළාත් සභාවේ කරලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඉතාම කාලකණ්නිම උපදේශක කාරක සභාව බවට අධ්‍යාපන උපදේශක කාරක සභාව පත් වෙලා තිබෙන්නේ. දැන් අධ්‍යාපන ඇමතිතුමා කියනවා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ වාගේ දෙයක් පටන් ගන්නවා. මෙතුමාට ඕනෑ විධියට පළාත් සභාව කරන්න බැහැ. මේක හොර මැරකම් නැති, කැත වැඩ නැති අමාත්‍යාංශයක් බවට අපි පත් කළා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මගේ කථාව කළාට පස්සේ මෙතුමාගේ කථාව කරන්න කියන්න. එතුමාට එහෙම සදාචාරයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, ඔබතුමාට අවස්ථාව දෙන්නම්. කරුණාකර වාඩි වෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

නැහැ. එහෙම පුද්ගල අපහාස කරන්න බැහැ. ඔබතුමා වගකියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම පුද්ගලික අපහාසයක් - මට නම් තවම දැනුවත් වුණේ නැහැ පුද්ගල අපහාසයක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

කට තිබුණු පළියට එහෙම නිකම් විවේචනය කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා අමාත්‍යාංශය ගැන කථා කළේ. ඔබතුමාට වචනයක්වත් කිව්වේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ රීති සංග්‍රහය සංශෝධනය කරන්න කිව්වා. ඔබතුමා රීති සංග්‍රහය මේ සභාවේ සභාගත කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඔබතුමාට වචනයක්වත් කිව්වේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ රීති සංග්‍රහය මේ සභාවේ සභාගත කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගෙන් කිසිම පුද්ගලික අපහාසයක් මෙතැන සිද්ධ වුණේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ රීති සංග්‍රහය තුළ අපිත් ඉල්ලීමක් කළා, මේ වාගේ විශේෂ ප්‍රකාශ කරන කොට අපට ඇමතිවරයාට ඉඩ දෙන්න කියලා. .

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඇමතිවරයාට ඉඩ තිබෙනවා. මගේ ප්‍රකාශයෙන් පස්සේ ඔබතුමාගේ ප්‍රකාශය කරන්න. ගරු සභාපතිතුමනි, මම ඉතාම කරුණාවෙන් කියනවා, එදා අධ්‍යාපන ඇමතිවරු ඔහොම කළේ නැහැ. අද අහිංසක දරුවෝ අති විශාල ප්‍රමාණයක් ගෙවල්වල ඉන්නවා පාසල්වලට යන්න බැරිව. පාසල ආසන්නයේ දරුවෝ ඉස්කෝලයට දා ගන්න බැහැ. හැබැයි, මම වගකීමෙන් කියනවා. ගිය සතියට එහා සතියේ -පාදුක්ක අමරසිරි පද්මපෙරුම විද්‍යාලයේ අවට දරුවෝ රාශියක් ඉන්නවා ඉස්කෝලෙට යන්න බැරිව. නමුත් පාදුක්කේ අවිස්සාවේල්ල ආසනයේ පදිංචි නැති කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචි නැති අරකවෙල දරුවෙකුව මේ අධ්‍යාපන ඇමතිතුමාගේ ලේකම්වරයෙක් ගිහිල්ලා ලියුමක් අරගෙන ඇවිල්ලා පාදුක්කේ බැංකු කළමනාකාරවරයෙකුගේ නංගිගේ දරුවාව සල්ලිවලට දැම්මා. මම වගකීමෙන් කියන්නේ. සල්ලිවලට ඒ දරුවා ඉස්කෝලෙට දැම්මා. අද අරුක්වත්තේ දරුවෝ ඉස්කෝලෙට යන්න බැරිව ඉන්නවා. මේ අධ්‍යාපන උපදේශක කාරක සභාවත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් වැඩ කරන්නේ මෙහෙම.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේකට මට කථා කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. අවස්ථාව දෙන්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අහිංසක දරුවන්ට ඉස්කෝලේ යන්න පුළුවන් ප්‍රතිපත්ති තීන්දු ගන්නේ නැතිව, සල්ලිවලට දරුවෝ දාන කාලකන්ණි වැඩේ කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ජනතාවගෙන් මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා වාඩි වෙන්න. ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අධ්‍යාපන අමාත්‍යාංශය ඉතාම පහළ තත්ත්වයට ගිහිල්ලා. අධ්‍යාපන අමාත්‍යාංශය ජනතාවගේ සිතුම් පැතුම් ඉෂ්ට කර ගන්න බැරි තැනකට ගිහිල්ලා. අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරියෙකු නැහැ මේ ප්‍රශ්නය කියන්න. කථා කරන්න විධියක් නැහැ. ඒ නිසා දරුවන්ට ඉස්කෝල නැති තත්ත්වයක් ඇති වෙලා. පාසල් ගොඩනැගිලි එකක්වත් හදා ගන්න බැහැ. අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා තමයි පරිපූරක ඇස්තමේන්තු හරහා අද භෞතික සම්පත් ටික සංවර්ධනය කරන වැඩේ කරලා දුන්නේ. ඒ නිසා අධ්‍යාපන අමාත්‍යාංශය කියලා කියන්නේ, අද ඉතාම අවාසනාවන්ත තත්ත්වයට පත් වුණු තැනක්. එක නිලධාරියෙකු වැඩ කරන්නේ නැහැ. ගරු ඇමතිතුමා අමාත්‍යාංශය හසුරුවන්නේ නැති නිසා නිලධාරීන්ට වැඩ කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒකේ පාඩුව සමස්ත බස්නාහිර පළාතේ අධ්‍යාපනයටම තිබෙනවා.

ඒ නිසා මේ අධ්‍යාපන ඇමතිතුමා අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය භාරව කටයුතු කරන තාක් කල් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජිකත්වය දරන්නේ නැහැයි කියන කාරණය කියමින්, අධ්‍යාපන උපදේශක කාරක සභාවෙන් ඉල්ලා අස් වන බව මේ සභාවට දැනුම් දෙමින් මාව සෞඛ්‍ය උපදේශක කාරක සභාවට හෝ කෘෂිකර්ම උපදේශක කාරක සභාවට පත් කරලා දෙන්නය කියලා, ජනතාවට වැඩ කරන්න තිබෙන අයිතිය ආරක්ෂා කරලා දෙන්නය කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ඉල්ලා අස්වීම මම පිළිගන්නවා. හැබැයි, ඔබතුමා කියන අමාත්‍යාංශ දෙන්න බැහැ. මොකද හේතුව, ඒවායේත් දැන් මන්ත්‍රීවරු පිරිලා ඉන්නේ. කවුරු හරි මන්ත්‍රීවරයෙකු කැමැත්තෙන් වෙනස් වෙන්න කැමැති නම් එතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මම කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කැමැතිද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මම සෞඛ්‍ය එකේ ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඔබතුමා අධ්‍යාපනයට යන්න ඕනෑ. මොකද, එතුමා බරපතළ ප්‍රකාශයක් කළේ. ඔබතුමාගේ ලේකම්වරයෙක් සල්ලි අරගෙන ළමයෙක් දැම්මා කියලා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට විනාඩි දෙකක් දෙන්න. මගේ දේශපාලන ජීවිතයේ මම කාගෙන්වත් සත පනහක්වත් අරගෙන නැහැ. අද ගන්නෙත් නැහැ. හෙට ගන්නෙත් නැහැ. මගේ ලේකම්වරයෙක් එහෙම කටයුතු කරලා තිබෙනවා නම්, මම අවංකවම ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වනවා. කිසි ගැටළුවක් නැහැ. අනික් එක මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, ඔය කියන කථාවල් නැහැ. පුද්ගලික තීන්දු ගන්න අධ්‍යාපන චක්‍රලේඛ තුළ බැහැ. තමන්ට ඕනෑ ඕනෑ වෙලාවට පාසල්වල පන්ති වැඩි කරන්න, විදුහල්පතිවරුත් එක්ක ගිහිල්ලා ගනුදෙනු කරලා පන්තිවල ළමයින් වාඩි කරන්න බැහැ. එහෙම මේ අධ්‍යාපන අමාත්‍යාංශය කරන්න බැහැ. ඒ නිසාවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව තිබෙන්නේ. 2016 පළමු වසරට පටන් ගත්තේ 40 යි. උසාවි නියෝගයක්. ශ්‍රේෂ්ඨාධිකරණයේ. එක වර පස් දෙනෙකු අඩු කරන්නය කියලා කිව්වා. අපි ඇපීල් කරලා තමයි මේක වරින් වර, අවුරුද්දෙන් අවුරුද්ද ළමයින් අඩු කරන තීන්දුවට ඇවිල්ලා තිබෙන්නේ. 2016 දී 40 යි. 2017 දී 39 යි. 2018 දී 38 යි. ලබන අවුරුද්දේ 37 යි. ළමයින් ඉතිරි වෙනවා. දැන් අපි ඊයේ හොරණ ගියා. හොරණ ගිහිල්ලා ඇහුම්කන් දීලා ඒ ප්‍රශ්න ටික විසඳලා ආවේ. මෙතැන හොරණ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ නිසා මේ විධියට අපහාස කරන්න එපා. මම මහේෂ් අල්මේදා වාගේ කුණු වුණු මිනිහෙක් නොවෙයි. මම ඔය ඉන්දික ගුණවර්ධන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික දේවල්වලට යන්න එපා. ඒක හරි නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පෞද්ගලික දේවල් මගෙන් අහ ගන්නත් එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට එතුමා අපහාස කළේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මමයි සභාපතිතුමායි එක ගමේ ඉපදිලා තිබෙන්නේ. මතක තියා ගන්න. අපි පෞද්ගලික දේවල් - (බාධා කිරීම්) ඔය තරම් පල්ලෙහා මට්ටමින් - ඔය ඉස්සර කරපු දේවල් දැන් කරන්න බැරිව ඇති. අපේ සභාවේ මම කවදාවත් එහෙම අශීලාචාර, එහෙම නැත්නම් වංචා, දූෂණ සත පහකවත් දෙයක් මමවත් මගේ නිලධාරීන්වත් කරලා තිබුණොත් මම වහාම ඒ සම්බන්ධව දැන් පරීක්ෂණයක් කරනවා කියලා ඔබතුමාට බොහොම අවංකව කියනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මගේ නම කියලා කථා කරපු නිසා මගේ වෙලාව දෙන්න ඕනෑ. අපි අර කුණු වෙලා තිබෙන්නේ කොහොමද කියලා දැක්කා. ගරු සභාපතිතුමනි, යසපාල කෝරළගේ මැතිතුමා සභාගත

කළා පසුගිය කාලයේ වාහනය දීලා සල්ලි ගත්ත හැටි. හොරකම් කරපු හැටි. අපට කියලා දෙන්න කියන්න මොන චක්‍රලේඛයෙන්ද ළමයි දාන්නේ කියලා. ළමයි දානවා එක වසරට. මොන චක්‍රලේඛයෙන්ද දාන්නේ. මෙයාගේ ලේකම් ගිහිල්ලා තමයි දාන්නේ. සල්ලි අරගෙන. කොයි චක්‍රලේඛයේද එහෙම ඉඩ තිබෙන්නේ. පසුගිය සති එකහාමාරට කලින් පාදුක්ක අරුක්වත්තේ අමරසිරි පද්මපෙරුම විදුහලට ළමයා දැම්මේ මොන චක්‍රලේඛයෙන්ද කියලා අපට කියලා දෙන්නය කියලා. සල්ලි අරගෙන දාන්නේ. මෙයාගේ වාහනය වික්කා. ඒක ඔප්පු කරලා පෙන්නුවා යසපාල කෝරළගේ මැතිතුමා. මෙතුමාගේ වාහනය පෞද්ගලික අංශයට දීලා විකුණලා. මෙයාගේ වාහනය දීලා ටුවරිසම් කම්පැනියකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේ සඳහා කාලය ගත්තා වැඩියි. දෙදෙනාම වාඩි වෙන්න කෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මෙතුමාගේ වාහනය පෞද්ගලික අංශයට දීලා. විකුණලා. මෙතුමාගේ වාහනය දීලා ටුවරිසම් කොම්පැනියකින් සල්ලි ගත්තා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතමනි, සත පහක්වත් මම හොරකම් කළේ නැහැ. ලංකාවේ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි අහන්නේ මොන චක්‍රලේඛයේ විධිවිධානවලටද එක වසරට දරුවෝ දාන්නේ කියලා කියන්න කියන්න. මොන චක්‍රලේඛයෙන්ද දරුවෝ දාන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික දේවල්වලට යන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අමාත්‍යාංශය තුළ කුණු වෙලා තිබෙන්නේ කවුද කියලා හැමෝම දන්නවා. කුණු වෙලා තිබෙන්නේ හොඳටම. අමාත්‍යාංශය කර ගන්න බැහැ. අමාත්‍යාංශයට යන්න බැහැ. දරුවෝ දානවා හැම තැනම සල්ලිවලට.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා ගිය තැනක් ඇත්නම් බලු කථා -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සල්ලි නැත්නම් පාරේ හිඟා කන එක හොඳයි. අහිංසක ළමයින්ට තිබෙන ඉඩකඩට තමයි සල්ලිවලට ළමයි දාන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේවා සොයිසාගේ කුමන්ත්‍රණ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

තඹයයක් හොරකම් නොකරපු මිනිස්සු අපි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමා අතින් කියවුණා, ඊයේ හොරණ කලාපයේ මන්ත්‍රීවරු කැඳවලා ඒ ප්‍රශ්න විසඳුවා කියලා. මමත් හොරණ කලාපයේ ඉන්න මන්ත්‍රීවරයෙක්. මට හොරණ කලාපයෙන් කිසිදු දැනුම් දීමක් කළේ නැහැ මේ ප්‍රශ්න විසඳන්න එන්නය කියලා. ඒ පිළිබඳව මම කනගාටු වෙනවා. මොකද, මේ හොරණ කලාපය පිළිබඳව කැඳවන කොට ඒ මන්ත්‍රීවරු, ඒ හොරණ කලාපයට ඕනෑ අය විතරයි කැඳවන්නේ. මේක හරිම අසාධාරණ වැඩක්. ඇමතිතුමා කිව්වාට පස්සේ තමයි මමත් දන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒකට මම සමාව ඉල්ලනවා. ඒ ප්‍රශ්නය අපේ නිලධාරීන් අතින් වුණු වරදක්.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේක ජනතාව අතරට ගියාම අපි මේවාට යන්නේ නැහැයි කියලා හිතනවා. ඇමතිතුමා මෙහෙම කිව්වාම. ඒ නිසා මේ ගැන වහාම - මම ඉල්ලා සිටිනවා. පරීක්ෂණයක් කරන්න අපව කැඳවන්නේ නැතිව -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, ඒ රැස්වීමට මාව කැඳෙව්වෙත් නැහැ. මමත් හොරණ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔය ඇමතිතුමා බොරු කාරයෙක් කියන්නේ ඒ නිසා තමයි. මේ සභාවට පට්ට බොරු කියන්නේ. ගරු සභාපතිතුමනි, මේ සභාවට පට්ට බොරු කින්නේ. දැන් හොරණ මන්ත්‍රීවරු කැඳෙව්වා කිව්වා. මේ හොරණ මන්ත්‍රීවරු දෙන්නෙක් කථා කළේ. මෙහෙම තමයි අධ්‍යාපනයේ වැඩ කරන්නේ. පට්ට හොර වැඩ කරන්නේ. හොරා කනවා මදිවාට බොරුත් කියනවා මේකේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සිද්ධිවලින් ගරු ඇමතිතුමා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඉන්දික ගුණවර්ධනත් එක්ක හොරකම් කරපුවයි, ඇර ගත්ත ඒවායි ගැන මගෙන් අහන්න එපා. ළඟ ඉන්න යාළුවෝ දන්නවා. අශීලාචාර වචන මගෙන් අහගන්න එපා. ඔය සොයිසා ඉන්නේ එහා පැත්තේ. එතුමා දන්නවා. ඔය කැත විධියට කථා කරන්න එපා. ඕවාට හෙණ ගහනවා. සත පහක් මම අරගෙන නම් මට හෙණ ගහනවා. ඔය වාගේ අශීලාචාර කථා කියන්න එපා අපි වාගේ මිනිස්සුන්ට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රකාශවලට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. දැන් මේ පළාත් සභාවේ අවුරුදු ගණනක් තිස්සේ මේ මන්ත්‍රීවරු ෆොටෝ කොපි මැෂින් එකක් ඉල්ලනවා. දැන් සෑම වෙලාවේම මේ සභාවේ අපේ කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු, එතකොට සභා කටයුතු ඇමතිතුමා, සමූපකාර ඇමතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමා මේ සම්බන්ධව කථා කරලා මේක දෙනවා දෙනවා කියලා දැන් මේ යහපාලන ආණ්ඩුව බොරු කියනවා වාගේම මේකත් එහෙම වෙලා. දැන් මම ඉල්ලීමක් කරනවා. මොකක්ද අපේ මහ ඇමතිතුමාට විශාල පරිපූරකයක් තිබෙනවා. ගිය සභාවට ඉදිරිපත් කළා. මේ පරිපූරකයෙන් වටිනා ෆොටෝ කොපි මැෂින් එකක් මේ අපේ මන්ත්‍රීවරුන්ට මහජනයා වෙනුවෙන් වැඩ කර ගන්න දෙන්න. කාර්යාලයට අවශ්‍ය දෙයක් මේ. මේක සෑම මන්ත්‍රීවරයෙකුටම වටිනවා. ෆොටෝ කොපියක් ගහ ගන්න කඩේට යන්න ඕනෑ. රු. 5000 ක් දෙනවා ෆොටෝ කොපි කොළ ගන්න. නමුත් මැෂින් එකක් නැහැ. අර ඉස්කෝලවලට කම්පියුටර් එකක් දෙනවා. ලයිට් නැහැ වාගේ වැඩක් මේක. ඒ නිසා මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලනවා. ඕනෑ නම් මේකට ලක්ෂ 150 ක් යයි. එතකොට ලක්ෂ 150 ක් පරිපූරකයෙන් සභා කටයුතු අමාත්‍යාංශයට වෙන් කරලා මේ මන්ත්‍රීවරුන්ට හෙට අනිද්දාට ඡන්දයක් එනවා. මේගොල්ලන්ට වැඩ කර ගන්න ඕනෑ. මේක යෝජනාවක්. ඔබතුමා හරහා ගෘහ කාරක සභාව හරහා දාලා මේකට දාන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ යෝජනාව මම ඊළඟ කාරක සභාවට ඉදිරිපත් කරන්නම්. මීළඟට පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මගේ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක් මතු කරන්න කථා කළේ.

ගරු සභාපතිතුමනි, පසුගිය කාල වකවානුවේ ද්විතියික පාසල් සංකල්පය මේ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලදුව, මේ සියලුම මන්ත්‍රීවරු ඊට සහයෝගය දැක්වුවා. මේක අපේ මන්ත්‍රීවරු හැටියට මේ සභාවේ ගරුත්වය සහ දෙපාර්තමේන්තුවේ ගරුත්වය වෙනුවෙන් පෙනී සිටිමින් අපි ඒ ක්‍රියාවලිය ඉස්සරහාට අරගෙන යන්න සහයෝගය දැක්වුවා. අද ඒක පාරා වළල්ලක් බවට පත් වෙලා තිබෙනවා. අද අපට ගම්වලට යන්න බැරි තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. දැන් මට මගේ ප්‍රදේශයේ ලොකු ගැටළුවකට මුහුණ දීලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේක මගේ ආත්ම ගරුත්වය සහ මගේ රාජකාරියට බාධා කිරීම පිළිබඳ ප්‍රශ්නයක්. මම මේ ඔබතුමාට ඉදිරිපත් කරන්නේ වරප්‍රසාද ප්‍රශ්නයක් හැටියට. අද මේ වන කොට වේරගම කනිෂ්ට විද්‍යාලයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මැදිහත් වෙලා ද්විතියික පාසල් සංකල්පය තුළ වේරගම පාසලේ ඉගෙන ගන්නා දරුවෝ ටික බලහත්කාරයෙන් හරි ඒ හය වන ශ්‍රේණියේ පන්තියක් ආරම්භ කරනවාය කියලා අභියෝගාත්මක තත්ත්වයකට පත් කරලා අද ඒ කටයුතු වෙනවා. මට කිසිම ප්‍රශ්නයක් නැහැ වේරගම, තල්පිටිය, මහා වාද්දුව ඉස්කෝල තුනේම ලබන වර්ෂයේ හය වසර ආරම්භ කිරීම පිළිබඳව අපේ කිසිම විරෝධතාවයක් නැහැ. මම මේ සභාවේ ප්‍රසිද්ධියේ කියන්නේ, මේක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙන්න ඕනෑ කාරණාවක් නිසා. මොකද හේතුව, මේවා විකුණාගෙන එළඹෙන මැතිවරණවලදී මේ මනාප මංකොල්ල කෑමේ සටනක් තමයි දැන් තිබෙන්නේ. අධ්‍යාපනයටවත්, දරුවන්ටවත් දෙමව්පියන්ටවත් ආදරේට කරන කාරණාවක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. මට ඔබතුමාට කාලය දෙන්න අමාරුයි. වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා ඔබතුමා දිග හෑල්ලක් කියනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

හෑල්ලක් නොවෙයි. ගරු සභාපතිතුමනි, හෑල්ලක් කථා කරනවා නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිග විස්තරයක් ඔබතුමා කථා කර ගෙන යනවා. වරප්‍රසාද ප්‍රශ්නයකට ඒ වාගේ කාලයක් ගත්තාම -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, ඔය පුටුවේ මමත් වාඩි වෙලා හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. මමත් කියන්න හිටියේ ඒකයි. ඔබතුමාත් මේ මූලාසනයේ වාඩි වුණු කෙනෙක්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මගේ රාජකාරියට බාධා කිරීම පිළිබඳව මම මේ කරුණු ඉදිරිපත් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඔබතුමා කෙටියෙන් කියන්න. ඔබතුමා උදාහරණ, අටුවා ටීකා -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

වචන කීයකට සීමා කරන්නද ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම එහෙම කියන්නේ නැහැ. ඔබතුමා කෙටියෙන් කාරණාව ඉදිරිපත් කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මට මේ කාරණාව කෙටි කරන විධිය දන්නේ නැති නිසා ඇහුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉක්මණින් කියන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් ගන්න ඕනෑ. මේ අහිංසක මන්ත්‍රීවරු දඬමීමා කර ගෙන කටයුතු කරන්න හොඳ නැහැ. මොකද, ඒ ප්‍රශ්නය දැන් අවුරුදු ගණනාවක් තිස්සේ අපි වරින් වර සාකච්ඡා කළා. ද්වීතියික පාසල් සංකල්පය සම්පූර්ණයෙන්ම ඉවත් කරලා මේ දරුවන්ට ඒ පාසල්වල 1 – 11 පන්ති පවත්වන්න අවසර දෙනවා නම් අපි මේ කිසි දේකට මැදිහත් වෙන්න යන්නේ නැහැ. ඒක අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය කාරණාවක් හැටියට හිතලා. එහෙම නැතිව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරලා අතරමගදී යම් යම් ප්‍රශ්න ආවාට පස්සේ ඒ ප්‍රතිපත්තිවලට සහයෝගය දීපු මන්ත්‍රීවරු ජනතාව අතර අප්‍රසාදය වෙන විධියට නම් මේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙන්නේ. මොකක්ද මන්ත්‍රීවරයාට යන කල. ඒ නිසා කරුණාකරලා පළාත් සභාවක් හැටියට, ඒ පළාත් සභාවේ වගකිවයුතු අමාත්‍යාංශයක් හැටියට තමන්ගේ පළාත් සභාවේ උපදේශක කාරක සභාවේ, එහෙම නැත්නම් වෙනත් මන්ත්‍රීවරයෙකු තමන්ගේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන වැඩ සටහනකට සහයෝගය දුන්නාම ඒ මන්ත්‍රීවරයාගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කරලා දෙන ක්‍රමවේදයක් මේ පළාත් සභාව ඇතුළේ තිබෙන්න ඕනෑ. නැත්නම් ඒ මිනිස්සු අප්‍රසාදයට ලක් වෙනවා. ඒකයි මේ කථා කරන්නේ. මට පෞද්ගලික කාරණාවක් නැහැ. ඒ නිසා කරුණාකරලා මේකට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න. ද්වීතියික පාසල් සංකල්පය සම්පූර්ණයෙන් අහෝසි කරලා දාලා අර ඒ ඉස්කෝලෙට ආපහු 1 සිට 11 දක්වා පන්ති පවත්වන්න දෙන්න. එහෙම නැත්නම් ඒක ක්‍රියාත්මක කරන්න. දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා අහිංසක මන්ත්‍රීවරුන්ට තමුන්ගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කර ගෙන ජීවත් වෙන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නව බදු පනත සම්බන්ධව උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, යහපාලන ආණ්ඩුවෙන් නව බදු පනත ක්‍රියාත්මක කරයි කියලා මේ පත්තරවල දාලා තිබෙනවා. එතකොට මන්ත්‍රීවරු 104 ක් මේකේ ඉන්නවා. එතකොට මේකේ ලක්ෂයට වඩා අඩු අයගේ බදු සහන නැහැ. දැන් මේ මන්ත්‍රීවරුන්ට ලක්ෂයට වඩා වැඩි එක තිබෙන්නේ කොහොමද? දුරකථන දීමනාව, ලිපිද්‍රව්‍ය දීමනාව, කාර්යාල දීමනාව. මේ වාගේ දීමනා ඔක්කොම එකතු කළාම ලක්ෂයට වැඩියි, මේ ඔක්කොම අයගේ. එතකොට මේකේ ගහලා තිබෙන්නේ ලක්ෂයට අඩු නම් ටැක්ස් නැහැ. ලක්ෂයට වැඩි නම් ටැක්ස්. මේ ඔක්කොම අයිති වෙනවා. මේ වක්‍රව බදු ගන්න ක්‍රමය යටතේ, මේ ක්‍රමය යටතේ මේගොල්ලෝ කියනවා 18% ක් තමයි මේ රටේ බදු ගෙවන මිනිස්සු ඉන්නේ. එතකොට මේක 80% දක්වා වැඩි කර ගන්න තමයි බලන්නේ. දැන් බලන්න කඩයක් ගන්න - පේමන්ට් එකේ ඉන්න බුලත්විට විකුණන මනුස්සයා. ඒ මනුස්සයා දවසට රුපියල් 3000 ක 4000 ක බුලත් විට් විකුණනවා. එතකොට කඩල කරත්තයක් ගන්න. වඩේ විකුණන මිනිහෙක් ගන්න. එතකොට මේ වාගේ සුළු ව්‍යාපාර කරන එදිනෙදා ජීවත් වෙන මිනිස්සු. පේමන්ට් එකේ දාලා එළවළු විකුණන මිනිහෙක් ගන්න. බාබර් සාප්පුවක් ගන්න. ඇඳුම් මදින ලොන්ඩ්‍රි මනුස්සයෙක් ගන්න. එතකොට මේවා ඔක්කොම ගත්තාම සභාපතිතුමනි, මේ රුපියල් තුන් දාහකට හාර දාහකට වඩා වැඩි ආදායමක් තිබෙනවා. ආදායම නොවෙයි නේ? Collection එක. එතකොට මේ වියදම් මොනවාද කියලා මේකේ බලන්නේ නැහැ නේ? මේකේ දාලා තිබෙන්නේ ලක්ෂයට වඩා. එතකොට සෑම මිනිහෙකුටම දවසට - දැන් බස් එකක් ගන්න. දවසට ආදායම තිබෙනවා රුපියල් දහ දාහක්. නමුත් ඒකට තෙල් ගහන්න ඕනෑ. ඩ්‍රයිවර්ට පඩි දෙන්න ඕනෑ. කොන්දොස්තරට පඩි දෙන්න ඕනෑ. එන්ජින් ඔයිල් දාන්න ඕනෑ. එතකොට මේ වාගේ වියදම් තිබෙනවා.

එතකොට මේවා කිසි දෙයක් නැතිව මේ පනත ගෙනැල්ලා අනුමත කරලා, මේ රටේ ඉන්න දුප්පත් මිනිහාට සහ මධ්‍යම පන්තික ව්‍යාපාරික සියල්ලටම බදු බර දාලා. රාජ්‍ය සේවයේ ඉන්න අය. එතකොට මේ රාජ්‍ය සේවයේ අයත් උසස් නිලධාරීන් ගත්තාම, පෞද්ගලික සේවයේ උසස් නිලධාරීන් ගත්තාම ඒ සියලු අයටම ලක්ෂයට වඩා පඩියක් හම්බ වෙනවා. ඒ හම්බ වෙන්නේ ඉන්ධන දීමනාව, කාර්ය දීමනා, දුරකථන දීමනා මේවා ඔක්කොම එක්ක තමයි ඒගොල්ලන්ට මේ entertainment, ඒ කියන්නේ තමන්ගේ වියදම් කාර්යාලයේ මේවා ඔක්කොම තමයි හම්බ වෙන්නේ.

එතකොට මේ පනතට අපි විරුද්ධ වෙන්න ඕනෑ. මේ පනත ගෙන ගියොත් මේ රටේ මිනිස්සු මේ IMF එකට ඕනෑ විධියට මේ රටේ බදු ආදායම වැඩි කරලා පෙන්වලා ලෝන් එකක් ගන්න - අපි නොවෙයි කියන්නේ. හිටපු මුදල් ඇමතිවරයා එක්සත් ජාතික පක්ෂයේ රවී කරුණානායක නියෝජ්‍ය සභාපතිතුමා පෙන්වනවා. IMF එකට ඕනෑ විධියට මේ රටේ බදු දාන්න බැහැ. මේ රටේ අයවැය හදන්න බැහැ. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය සභාපති රවී කරුණානායක කියනවා මෙහෙම.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දැන් රවී කරුණානායක හොඳද? ඉස්සර හොඳ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට දැන් අපි පළාත් සභාවක් හැටියට මේකේ කොහේවත් කියලා නැහැ, මේ ගන්නා බදුවලින් අපේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට - එතකොට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අනියමාකාරයෙන්ද ලැබෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් අපට බලයක් දීලා තිබෙනවා. මේ පළාත් සභාවට දීලා තිබෙන බලයත් එක්ක මේක කොහේවත් වර්ගීකරණය කරලා නැහැ. මේ පනත අනුව. එතකොට මේකේ අවුලක් තිබෙන නිසා මම සම්පූර්ණයෙන්ම පළාත් සභාව හැටියට මේකට විරුද්ධ වෙන්න කියලා මේ රටේ ජනතාව වෙනුවෙන් ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අත්තනගලු ඔය අත්තනගල්ලෙන් ඇවිල්ලා, දඩුවම් ඔය කියනවා. ඒකට යා වෙනවා තව අත්තක්. අපේ ආසනයේ ඇමතිවරු දෙන්නෙක් ඉන්නවා. ලලිත් වනිගරත්න අමාත්‍යතුමා ඉන්නවා. නාගරික සංවර්ධන රාජ්‍ය ඇමතිතුමිය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය ඉන්නවා. ඒගොල්ලෝ බලා ගෙන ඉන්න කොට, රජයේ යහපාලන ආණ්ඩුවේ දෙන්නාම ඉන්න කොට මෙන්න අත්තනගලු ඔය. මුළු ගංගාවම වැහිලා. අර දිය ගෝවා වලින්. කිලෝ මීටර් ගණනක් වැවිලා. උදේ හවස මෙතැනින් යනවා. අඩු ගණනේ වාරිමාර්ගයට කියලා මේක සුද්ධ කරන්න හැකියාවක් නැහැ මේගොල්ලන්ට. අපේ ගේ පිටිපස්සෙන් යන්නේ. මම ඡායාරූප එවන්නම්. බලන්න. මේ තරම් බජිරි වැවිලා විනාශ වෙන කල් මේ ඇමතිවරු දෙන්නා බලා ගෙන ඉන්නවා. අඩුම ගණනේ මේ ඇමතිවරු දෙන්නාට වගකීමක් තිබෙනවා, වාරිමාර්ගයට කියලා අර ලොකු බැකෝ මැෂින් ගෙනැල්ලා, බාච් ගෙනැල්ලා සුද්ධ කරන්න. මේ බජිරි මැරිලා මාස තුනෙන් තුනට ලුණු එනවා. ලුණු ආවාට පස්සේ මේ බජිරි මැරිලා මේ බජිරි පොළොවට තැන්පත් වෙනවා. ඊළඟට මේ ගඟ ගොඩ වෙනවා. මාස හයෙන් හයට තැන්පත් වෙනවා. ගොඩ වුණාට පස්සේ දඩුවම් ඔය පිටාර ගලනවා. පිටාර ගලලා අපේ ප්‍රදේශය යට වෙනවා. එහෙම නම් මම කියන්නේ, අද මේ මාධ්‍යවලින් ඉතාමත් බැගෑපත්ව ඉල්ලා සිටිනවා. මේ අපේ රාජ්‍ය ඇමතිතුමියට හරි එහෙම නැත්නම් යහපාලනයේ ඇමතිවරයෙකුට, අගමැතිතුමාට, ජනාධිපතිතුමාට, එහෙම නැත්නම් වාරිමාර්ග ඇමතිතුමාට කියනවා. මේක බලලා මේ ගඟ සුද්ද කරලා දෙන්න. එහෙම නැත්නම් අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය දන්නවා. ඒ දඩුවම් ඔය මාදුව පැත්තේ විනාශයි. මාලුවෙක් හැදෙන්නේ නැහැ. සතෙක් හැදෙන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම සුද්ද කරන්න පටන් අරගෙන තිබෙන්නේ. පළාත් සභාවේ මැෂින් එකක් දාලා තිබෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මම මේ ඡායාරූපය අතින් අතට එවන්නම්. මේ බලන්න. මේ ගඟ වැහෙනකල් මොකටද, කට වහගෙන හිටියේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම පටන් අරගෙන තිබෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එතුමිය පටන් ගත්තාට බොහොම ස්තූතියි. හැබැයි, මේ ඊයේ මම ෆොටෝ ගැහුවේ. ගරු සභාපතිතුමනි, මේ ගැන කටයුතු කරන්න කියලා ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

[ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා]

ඒ වාගේම 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ඒකත් මෙහෙම්මම කථා කරන්නම්. ගරු සභාපතිතුමනි, අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට අර පල්ලෙහා කර්මාන්ත අමාත්‍යාංශයේ shop එකෙන් රු. 30,000/- ක අවුරුද්දට බඩු ගන්නය කියලා ෆෝම් එකක් පුරවන්න දෙනවා. ඒ ෆෝම් එකේ තවත් පළාත් සභා මන්ත්‍රීවරු දෙන්නෙක් ඇපයට අත්සන් කරන්න ඕනෑ. අපේ පඩියෙන් කපා ගන්නේ. ඇප අත්සන් කරන්න ඕනෑ නැහැ. ඊළඟට අරගෙන ගිහිල්ලා එතුමාගේ අමාත්‍යාංශයේ ඉන්න මුදල් සම්බන්ධ නිලධාරියාගෙන් අත්සන් ගන්න ඕනෑ. කල්පනා කරලා බලන්න. අපේ පඩියෙන් කපන්නේ. අපි හොරුද? ගරු ඇමතිතුමා නැහැ. අපි හොරු නොවෙයි. අර බඩු විකිණෙන්නේ නැහැ. අඩු ගණනේ ඒ විකිනෙන්නේ නැති බඩු ටික විකුණාගන්න අපි මන්ත්‍රීවරුන්ට ඒක දුන්නා නම් පඩියෙන් කපනවා. ඒ නිසා මගේ දැඩි විරෝධය ප්‍රකාශ කරනවා. ඒ අමැතිවරයාටත්, ඒ අමාත්‍යාංශයේ උදවියටත් අපව බාල්දු කිරීම සම්බන්ධව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කාරණය මමත් පිළිගන්නවා. හරිම ලැජ්ජයි. මන්ත්‍රීවරු දෙන්නෙක් ඇපයට අත්සන් කරන්න ඕනෑ. රු. 30,000/- කට නේද? ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම මම නොදැනුවත්කමට අහන්නේ. සාමාන්‍යයෙන් බජිරි දිරුවාට පස්සේ පස් බවට පත් වෙන්නේ නැද්ද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පස් වෙන්නේ නැහැ. පස් වෙයි. අවුරුද 100 ක් විතර යන කොට. පස් ගොඩ දානවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස් වෙනවා නම් ඕවා තියෙන්නේ නැහැ නේද? මීළඟට පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මම අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ සංවිධායකවරයෙකු වශයෙන් කටයුතු කරන්නේ. මේ පළාත් සභා සීමා නිර්ණයේදී අගලවත්ත ආසනයේ නමවත් නැති විධියට තමයි කඩලා තිබෙන්නේ. අගලවත්ත ආසනයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක් තිබෙනවා. අගලවත්ත, වලල්ලාවිට, පාලින්ද නුවර. එයින් පාලින්දනුවරයි වලල්ලාවිටයි එකතු කරලා එක කොට්ඨාශයක් හදලා තිබෙනවා. පාලින්ද නුවර කියලා. අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කොටස් දෙකකට කඩලා තිබෙනවා. එකක් මදුරාවලට කඩලා තිබෙනවා. එකක් මතුගමට කඩලා තිබෙනවා. එතකොට අපේ ප්‍රධාන ආසනයේ නම තිබෙන්නේ අගලවත්ත. අගලවත්ත කියන නමත් මේකෙන් නැති වෙලා යනවා. ඒ නිසා මගේ බලවත් විරෝධය ප්‍රකාශ කර සිටිනවා. අපේ ආසනයේ තිබුණු නමත් ඉවත් වෙන විධියට කටයුතු කර තිබීම පිළිබඳව. මම ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරනවා. මේ සීමා නිර්ණය වැඩ පිළිවෙලේදී ප්‍රධාන නගරයක් වන අගලවත්ත ආසනය ප්‍රධාන ස්ථානයක් වන අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඉවත් නොකරන්නත්, වෙනත් එකකට සම්බන්ධ නොකරන්නත්, අගලවත්ත නමින් කොට්ඨාශයක් පවත්වන්නත් කටයුතු කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා. ආසනයේ නම ආරක්ෂා වන විධියට අගලවත්ත නමින් කොට්ඨාශයක් නම් කළ යුතුයි කියලා මම යෝජනා කරනවා. ඔබතුමාගේ මාර්ගයෙන් ක්‍රියාත්මක කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක ඉදිරිපත් කරන්නම්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ක්‍රාෆ්ට් ලංකා ආයතනයෙන් අවුරුදු කාලයට බඩු ලබා දෙන එක අනාදිමත් කාලයක් තිස්සේ කර ගෙන ආපු ව්‍යාපෘතියක්. ප්‍රධාන ලේකම්තුමා මේ සභාවේ ඉන්නවා. ඒ නිසා මම ගරු ඔබතුමා මගින් යෝජනා කරන්න කැමැතියි. අද දිනයේම අපේ කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරීන් කැඳවලා මන්ත්‍රීවරුන්ට මේ මොහොතේම ෆෝමැට් එකක් හදලා රු. 30,000 ක බඩු

ඒගොල්ලන්ගේ දීමනාවෙන් කපන්න අනුමැතියට යටත්ව මේ මොහොතේ සිට නිකුත් කරන්න බලය දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා, මේ මුදල රු. 30,000 යි. දැන් සභා ලේකම් කාර්යාලයෙන් රුපියල් ලක්ෂය, පනස්දාහ වැනි ටයර් ලෝන් දෙනවා. එක එක්කෙනාගේ අත්සනට අපි දෙන්නේ. මේ 30,000ට තමයි අත්සන් පෝලිමක් ගන්නේ. අපි ටයර් ලොන් එක දෙනවා. ලක්ෂ දෙකක් දෙනවා. එක අත්සනට දෙන්නේ. පඩියෙන් කපා ගන්න. මේවා විහිළු.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක විනාඩි පහක වැඩක්. ඔබතුමා ලේකම්තුමාව දැනුවත් කළා නම් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ලේකම්තුමාගෙන් ගරු මහ ඇමතිතුමා ඉල්ලීමක් කළා. අදාළ ක්‍රමවේදයකට මොකක් හරි ලැහැස්ති කරලා දෙන්න. පොඩි වැඩක් තිබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒවාට ඇපකාරයෝ ඕනෑ නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සභාවේ එකඟතාවය පරිදි දීමනාවෙන් අඩු කිරීමට යටත්ව රුපියල් 30,000/- ක වටිනාකමින් යුක්තව එක් මන්ත්‍රීවරයෙකුට බඩු මිලදී ගැනීමට අවශ්‍ය පහසුකම් මේ මොහොතේ සිට සලසන්නය කියන්න. ඒක විනාඩි පහක වැඩක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට උපුල් මහේන්ද්‍ර මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මම මූලික වශයෙන් ගියවර සභාවේදී ප්‍රකාශ කළා. අත්තනගල්ලේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නය පිළිබඳව. මම ඇත්තටම මුලින්ම මේකට මගේ ගෞරවය ප්‍රණාමය පුද කරන්න ඕනෑ, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට. එතුමා අපේ අත්තනගල්ල ආසනය තුළ දැවෙන ප්‍රශ්නයක් වුණු මේ රංග ශාලාව සම්බන්ධයෙන් එතුමා ස්ථාන පරීක්ෂාවක් කරලා මාත් එක්ක ගිහිල්ලා රුපියල් ලක්ෂ පහක මුදලක් ලබා දීලා ඒක නිර්මාණය කළා. එතුමාගේ අදහසක් අනුව අපි ගරු කිරීමක් වශයෙන් අනුර බණ්ඩාරනායක මැතිතුමාගේ නමත් ඒකට යොදන්න එතුමා ඒ වෙලාවේ යෝජනා කළා. ඒ වාගේ කාරණා කළා.

දැන් මම මේ සභාවට ඉදිරිපත් කරන්නේ, මේ සභාව සතු ගොඩනැගිල්ල මේ වන කොට පළාත් සභාවට පවරා ගත්තා. ඊයේ දවසේ ෆැක්ස් පණිවුඩයකින් ඒක ලැබුණා. ඒ ගැන මට ගැටළුවක් නැහැ. මම කියන්නේ, මේ සභාව පත් වෙන්න පෙර මේ වාගේ ක්‍රියාදාමයක් ගත්තේ. එහෙම දෙයක් කළේ ඇයි? චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය 2000 වර්ෂයේදී භූමියවත් අත්පත් කර ගන්නේ නැතිව මුල් ගලක් තියලා භාගයට ඉදි කළේ. දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩමක මේක ගොඩ නැගුවේ. ඊට පස්සේ මේක දිගින් දිගටම විගණනයට ලක් වුණු දෙයක්. ඊට පස්සේ විගණනයට ලක් වුණු මේ ඉඩම මම සභාපති කාලයේ හිටපු ජනාධිපතිතුමාට කියලා මේකේ භුක්තිය මම භාර ගත්තා. එහෙම නම් ජනාධිපතිතුමියට මේකේ මුල් ගල් තියන කොට එතුමියගේ බලතල අනුව මේක පවරා ගෙන තමන්ගේ රජයේ දේපළක් බවට පත් කරලා කරන්නත් තිබුණා. එහෙම දෙයක් කරන්නේ නැතිව එතුමිය අතරමග දාලා ගිහිල්ලා, එතැන මාළු වෙළෙන්දෝ ලැගුම් අරගෙන ඉන්න කොට මාළු වෙළෙන්දෝ ටික එළවලා යම් ප්‍රමාණයකට නිර්මාණය කරපු ගොඩනැගිල්ලට තමයි මහ ඇමතිතුමා සල්ලි දුන්නේ. එතකොට මේ ප්‍රාදේශීය සභාව විසුරුවලා තිබුණු වෙලාවේ හදිසියේ එතුමිය මේ කාරණාව අපේ ප්‍රධාන ලේකම්තුමාත් දැනුවත් කරලා, අපේ ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට කියලා නැවත භුක්තිය පළාත් සභාවට පැවරුවා. දැන් මේ වෙන කාරණා මට පේන්නේ මේක විහිළුවක්. ආණ්ඩු වෙනස් වුණාම ආපහු අනික් ජනාධිපතිතුමා ආයිත් ප්‍රාදේශීය සභාවට පවරයි. මේක කොයි තැන තිබුණත් මේක පාලනය වෙනවා. මේක

**[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]**

කරන්න පුළුවන්ද බැරිද කියලා පූර්ව වශයෙන් නිගමනය කරන්න පුළුවන්කමක් නැහැ චන්ද්‍රිකා මැතිනියට. ඒක පාලනය කරන්න ප්‍රාදේශීය සභාවට පුළුවන්කමක් තිබෙනවාද නැද්ද කියලා අපි බලන්න ඕනෑ. මේකට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ගිහිල්ලා අපේ පළාත් සභා මන්ත්‍රීතුමන්ලා අපි තුන් දෙනාම එක හඬින් විරුද්ධ වෙද්දී මේක තඹයකටවත් ගන්නේ නැතිව තමන්ගේ දේශපාලන වුවමනාවන් මෙතැනින් පිරිමහගන්න උත්සාහ කරනවා. මේවා අපට ලැජ්ජා සහගතයි. මේ පළාත් සභාවේ මම කවදාවත් කාටවත් විරුද්ධව කථා කරලා නැහැ. අපට එහෙම වුවමනාවකුත් නැහැ. හැබැයි, ඇයි එහෙම දෙයක් කරන්නේ. මේවා වෛරී සහගත දේශපාලන ක්‍රියාදාමයන්. මේවා කරන්න හොඳ නැහැ. ඒ නිසා මේ ගොඩනැගිල්ල හදලා මහ ඇමතිතුමා ගිහිල්ලා බලලා, සල්ලි වෙන් කරලා එතුමා හදලා දුන්න ගොඩනැගිල්ල. විවෘත කරන්නවත් අපට ආරාධනාවක් කළේ නැහැ. පළාත් සභාවේ සල්ලි වියදම් කරලා ලක්ෂ 500 ක්. තවත් ලක්ෂ 60 ක් මේකට යොදවලා තිබෙනවා. අපට එහෙම ගැටළුවක් නැහැ. චන්ද්‍රිකා මැතිනියට මේක සියලු ගෞරව දෙන්න ඕනෑ. හැබැයි, මේකේ භූමිය අපි අත්පත් කර ගත්තේ. භුක්තිය ගත්තා. ප්‍රාදේශීය ලේකම්තුමා අසරණයි. සම්බන්ධීකරණ කමිටුව කියන්නේ විහිළුවක්. බලය නැති මිනිස්සු සම්බන්ධීකරණ කමිටුවට පත් කරලා, ඒ පත් කරපු සම්බන්ධීකරණ කමිටුවෙන් ගන්න වැරදි තීන්දු මේවා.

ඒ වාගේම තමයි සංඝබෝධි විද්‍යාලය. තඹ සත පහක් වියදම් කරන්නේ නැතිව අම්බලමක් වාගේ ඉස්කෝලේ තිබෙන්නේ. හාමුදුරුවෝ හදපු ගොඩනැගිල්ල විවෘත කරන්න ගිහිල්ලා, ඒක මධ්‍යම රජයට පවරා ගන්න උත්සාහ කළා. මහා විහිළුවක් බවට පත් වෙලා. අන්තිමට උද්ඝෝෂණ පවත්වලා. අපේ අධ්‍යාපන ඇමතිතුමා මේ උත්සවයට සහභාගී වෙන්නේ නැතිව මහා විකාරයක් වුණා. තමන්ට බලය තිබුණා නම් බලය තිබෙන කාලයේ යමක් කරන්න ඕනෑ. තමන් බලය තිබෙන කාලයේ තමන්ගේ බලය යොදවලා තමන්ට කාර්යයන් කරන්නේ නැතිව තමන්ට යමක් කරන්න බැරි කාලයේ අන් අය සම්බන්ධ කර ගෙන මේවා විනාශ කරන්න කටයුතු කරනවා නම් මේ අත්තනගල්ල ආසනයත් නැති කරලා දමයි සමහර විට. ඉතින් මේවා මම හිතන්නේ නැහැ හොඳ ක්‍රියා කියලා. කවුරු වුණත් පවතින්න යමක් කරන්න ඕනෑ. සමාජයේ මිනිස්සුන්ගේ ගෞරවය ලැබෙන්න කටයුතු කරන්න ඕනෑ. මේ කසළ ප්‍රශ්නය ඇති වෙන කොට අපේ පළාත් සභාවේ වෙන්න පුළුවන්. මධ්‍යම රජයේ වෙන්න පුළුවන්. ලක්ෂ ගණනක බැරල්, බාල්දි අරගෙන ගිහිල්ලා තිබුණා. මේවා බෙදුවේ නැහැ. මේවා ඔහේ තියාගෙන ඉඳලා අද වන කොට අර ඇත පිටිසර ගම්වල ගෙවල්වල මිනිස්සුන්ට බැරල් දීලා තිබෙනවා. තමන්ගේ ඡන්දය දුන්න අයට විතරක්.

ගරු සභාපතිතුමනි, මේක නොවෙයි කරන්න තිබුණේ. කසළ අපහරණය පිළිබඳව ජනතාව දැනුවත් කරලා, නාගරික ප්‍රදේශවලට මේවා බෙදලා දීලා, එහෙම නැත්නම් කෘෂිකර්මය කරන අයට, ගෙවතු වගා කරන අයට මේ කොම්පෝස්ට් බැරල් ටික බෙදලා දෙනවා නම් හොඳයි. නමුත් කළේ අර ඇත පිටිසර ගෙයක් දොරක් නැති මිනිස්සුන්ට පවා මේ බැරල් ටික ලබා දීලා. අයථා මුදල් ගනුදෙනුවලට මෙන්න මේවා තමයි අයිති වෙන්නට ඕනෑ. මූල්‍ය කළමනාකරණයක් නැහැ. ඒ නිසා මේ ක්‍රියාව මේ පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලා වශයෙන් අපි සියලු දෙනා තරයේ හෙළා දකිනවා. මහ ඇමතිතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා. එතුමා කැමැති නැහැ මේ කාරණාවට. ප්‍රධාන ලේකම්තුමා කැමැති නැහැ. අමාත්‍යාංශ ලේකම්තුමිය කැමැති නැහැ. නමුත් කරන්න දෙයක් නැහැ. අර කපන්න බැරි අත ඉඹිනවා වාගේ තමයි මේ කාරණයට අත ගැහුවේ. මහ ඇමතිතුමාට කියනවා, ඔබතුමාට ලැබුණු මේ භුක්තියේ බලය ඔබතුමා මගින් පළාත් පාලන ආයතන වෙත නැවත ලබා දීලා, මේ අලුතෙන් පත් වුණු සභාව මොන පක්ෂයේද නොවෙයි. ඔවුන්ගේ අභිමානය ගොඩ නැගෙන්න කටයුතු කරන්නය කියලා ගෞරවයෙන් සිහිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ආරාධනා කරනවා මූලාසනයේ අසුන් ගන්නා ලෙස.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri – Minister [On Behalf of Minister of Council Affairs]

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "2018.03.21 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව, අද දින (2018.04.03 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම පළාත් සභාව 2018.05.08 වන දින (අඟහරුවාදා දින) පෙ.ව. 9.30 ට රැස් විය යුතු අතර, 2018.04.17 දිනය (අඟහරුවාදා දිනය) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සළකා ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"ශ්‍රී ලංකාව වසර 2500 කට එහා ගිය වැදගත් ඉතිහාසක් ඇති රටක් ලෙස අප විසින් උදම් අනමින් සිටිය ද, අපගෙන් පසු එන පරපුරට සාරගර්භව අභිමානයකින් යුතුව, වර්ණනා කළ හැකි අතීතයක් හිමි වන පරිදි, වර්තමානයේ දේශපාලන නායකයන් වන අප විසින් දියුණු රටක් නිර්මාණය කිරීමට කටයුතු කර නොතැබුවහොත් එය අපගේ වගකීමක් පැහැර හැරියා වේ. එහෙයින් ජාතික ධනය, බලය, මෙන්ම අප හැමගේම සුරු විරුකම්, හැකියාවන් උපරිමයෙන් රටේ දියුණුව වෙනුවෙන් යොදවා ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නඟා සැමදා ඇති වන ගංවතුර, නියඟ ආදී ස්වභාවික විපත්වලින් මෙන්ම අනාගතයේ ඇති විය හැකි ගැටළු කලින්ම හඳුනාගෙන, ජාතික ප්‍රතිපත්තියක් ඔස්සේ මේ රටේ ජාතික, ආගමික, සමාජමය, බලමුළු එක්තැන් කර සංහිඳියාවකින් යුතුව එක මඟක් ගෙන, ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ද ආරක්ෂා කර ගනිමින් සීඝ්‍ර දියුණුවක් කරා මෙම රට රැගෙන යාමට සියළුම මහජන නියෝජිතයන් පෙරමුණ ගත යුතු යැයි ද, ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි ද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed.*

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතියි. සිංහල අලුත් අවුරුද්ද නොබෝ දිනකින් යෙදිලා තිබෙන මේ මොහොතේ මම හිතන්නේ කෙටි විවේකයක් ගන්න අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කල්පනා කරගෙන ඉන්න අවස්ථාවේදී ගෙදර ගිහිල්ලා හරි කල්පනා කරන්න පුළුවන් විධියට මම අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වෙලා රොස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා සභාවට එනවා නම් වඩා හොඳයි.

[පූ.භා. 10.38 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම ඇත්ත වශයෙන්ම මේ පළාත් සභාවේ මන්ත්‍රීවරියක් හැටියට වසර කිහිපයක් මේ සභාව නියෝජනය කරලා තිබෙනවා. අද අපි දේශපාලනයට සම්බන්ධ වුණු වකවානුවත් එක්ක සලකා බලන කොට අපි දකිනවා මේ රටේ හැමදාම ප්‍රශ්න කථා කරනවා. සාකච්ඡා කරනවා. නීතිගත වෙනවා. නමුත් ප්‍රශ්නය එකතැන පල් වෙනවා. ඒ නිසා මේ රට සීඝ්‍රව දියුණුව කරා යනවා කියලා අපට පේන්නේ නැහැ. දැන් අපි එක අංශයක් අරගෙන බැලුවොත්, අද උදේ අපි පාසලට ළමුන් ඇතුළත් කිරීමේ ප්‍රශ්නය කථා කරනවා. ඒ කියන්නේ, වසර ගණනාවක් අපි අධ්‍යාපන අමාත්‍යාංශවල

[ගරු රෝස් ප්‍රනාන්දු]

හිටියාට ළමුන් ඇතුළත් කිරීමේ ප්‍රශ්නයට තවම උත්තරයක් ලබා දීලා නැහැ. ඒ කියන්නේ පාසල්වල පන්ති ප්‍රමාණය - නඩුවක් තිබෙනවා. ඒවා කිව්වාට වැඩක් නැහැ. ඒ ගැන සැලැස්මක් හදන්න තමයි අමාත්‍යවරු ඉන්නේ. පළාත් සභාවේත්, ආණ්ඩුවේත්. ඉතින් මේකට ක්‍රමවේදයක් නැහැ. එතැනි එහාට ගියාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පාසලෙන් ඉවත් වන ළමයාට - විභාගය සමත් වෙලා විශ්ව විද්‍යාලයට යන අය මොකක් හරි රැකියාවකට යනවා. අනෙක් සියලු දෙනාටම කරන්න රස්සාවක් නැහැ. මේ රටේ ජාතික ප්‍රතිපත්තියක් නැති වීම තමයි මේකට හේතුව. දැන් අපි සුළු සුළු පැලැස්තර අලවනවා. අපි ඇමැතිතුමන්ලා හම්බ වෙලා Vacancies තියෙනවාද කියලා අහලා දෙන්නෙකුට රක්ෂා දෙන්න බලනවා. යම්කිසි පුරප්පාඩුවකට කැඳවනකොට සියයක් බඳවා ගන්න කොට, ලක්ෂයක් ඉල්ලුම් කරනවා. ඕකයි අද ලංකාවේ තත්ත්වය. එතකොට අපේ ජාතික ප්‍රතිපත්තියක් සකස් වෙලා නැති නිසා තමයි මේ තත්ත්වය උද්ගත වෙලා තිබෙන්නේ. නමුත් අද කම්කරුවෙක් හොයා ගන්න ගියොත් ලංකාවේ නැහැ. ඒකත් තව පැත්තක්. ඒ ආකාරයට රටේ අධ්‍යාපනය හැඩ ගැහිලා නැහැ. ඒ වාගේම රටේ තිබෙන ආර්ථික අවශ්‍යතාවයට ගැළපෙන අධ්‍යාපනයක් නොවෙයි ලැබෙන්නේ. අද කලා විෂයයන්ගෙන් උපාධිධාරීන් රාශියක් ඉන්නවා. රස්සා නැහැ. ඉතින් මේ සියලු දේට හොඳ උත්තරයක් හදන්න අධ්‍යාපනය පැත්තෙන් අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම අද පිටරටවලින් විවිධ ආහාර ආනයනය කරනවා. ඒවා කාලා වකුගඩු රෝග කියලා කියනවා. අපේ සෞඛ්‍ය සහ ආහාර පාන, පාරිභෝගික කටයුතු මේ අමාත්‍යාංශයට එන වැඩ පිළිවෙළක් සකස් කරන්නට ඕනෑ. ඒක සිද්ධ වෙන්නේ නැහැ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. දේශපාලනය. දැන් දේශපාලනය විසින් තමයි පරිපාලනය, ජාතික ප්‍රතිපත්ති හදන්න ඕනෑ. අද දේශපාලනය ලංකාව පුරාම වණ වුණු තුවාලයක් බවට පත් වෙලා තිබෙනවා. අද බලන්නේ කොහේ හරි ඔළු ගෙඩියක් සල්ලිවලට අරගෙන තමුන්ගේ දේශපාලන පක්ෂය නැඟිටවාගෙන බලය අල්ලා ගැනීමේ ව්‍යායාමයක් මිසක් ඉන් රටට හෙණ ගහනවාද කියලා එකෙක්වත් බලන්නේ නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ජනතාවට හෙණ ගහනවාද කියලා එකෙක්වත් බලන්නේ නැහැ. ඒ නිසා තමන්ගේ තනතුරයි, තමන්ගේ තත්ත්වයයි, තමන්ගේ වාසි ටිකයි ලැබෙනවාද කියන එක විතරයි බලන්නේ. රාජ්‍ය සේවයේත් එහෙමයි. අපි දැක්කා පසුගිය දවසක පාලමක් විවෘත කරන්න යන වෙලාවකදී ඇඟිල්ල දික් කරලා අවුරුදු විසි තිස් ගණනක් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙකුගෙන් ID එක ඉල්ලනවා. එතකොට රාජ්‍ය සේවකයා දන්නේ නැහැ තමුන්ගේ වපසරිය මොකක්ද කියලා. මේ රට කොහාටද ගමන් කරලා තිබෙන්නේ කියන එක ගැන අතිශයින් කනගාටුවට පත් වෙන්න වෙලා තිබෙනවා. අද අධිකරණ පද්ධති, ඒ වාගේම මම හිතන්නේ අපේ ඉඩම් පාවිච්චි කිරීමේ පිළිවෙළ අරගෙන බැලුවොත් අද ඕනෑතරම් ඉඩම් තිබෙනවා. ඒ වුණාට මේ රජය හදිසියකට වැඩ කරන්නේ කුලියට අරගෙන තමයි. ඉතින් මේ සියල්ලම ජාතික ප්‍රතිපත්ති වශයෙන් සකස් වෙන්න ඕනෑ කියන එක තමයි මගේ යෝජනාවේදී කියන්න හදන්නේ.

දැන්වත් මේකට ඇස් ඇරියේ නැත්නම් තවදුරටත් මේ පුංචි පුංචි පැලැස්තර දාලා මේක පිළිකාවක් බවට පත් වුණාට පස්සේ වෙදකමක් කරන්නම බැහැ. රෝගියා මැරිලා යනවා. ඒ නිසා මේ රට ආපහු ඒ අභාග්‍ය සම්පන්න තත්ත්වයට පත් වෙන්න දෙනවාද? දැන්වත් මේ කා කොටා ගැනීම, බලය ලබා ගැනීමට තිබෙන පෙරේතකම, ඒ වාගේම රජයක් කරද්දී ඒකට අවශ්‍ය දේට සහයෝගය දීලා අනවශ්‍ය දේ වළක්වලා නිසි ගමන් මාර්ගයට ඒ රජය අරගෙන යනවා කියන තැනට අපි තල්ලු වෙනවාද? නැත්නම් බඩ හදාගන්න ඕනෑ වුණාම කොපමණ හොඳ ප්‍රතිපත්තියක් රටට ගෙන ආවත්, කොපමණ වැදගත් ප්‍රතිපත්තියක් ගෙන ආවත් ඒකට මගේ බඩ හැදෙන්නේ නැත්නම් මොනවා හරි අංචියක් ඇදලා, ඒක රට පුරා විකෘති කරලා හරි ඒක විනාශ කරනවා. ඉතින් මෙවැනි ම්ලේච්ඡ ආකාරයේ වැඩ කටයුත්තක් කරපුවාම ඒකෙන් අනාගත පරම්පරාවට දස ගුණයකින් දුක් විඳින්න සිද්ධ වෙනවා. අද එක ගුණයකින් දුක් විඳිනවා නම් ඒගොල්ලන්ට දස ගුණයකින් දුක් විඳින්න සිද්ධ වෙනවා. අද නිදහස් සෞඛ්‍ය, නිදහස් අධ්‍යාපනය කියලා තිබුණාට සල්ලි නැත්නම් මොනවත් කරන්න බැහැ. ඉස්පිරිතාල නිකන් තිබුණාට සල්ලි නැත්නම් මොනවත් කරන්න බැහැ. වෛද්‍යවරු පෞද්ගලිකව ගිහිල්ලා බෙහෙත් දෙනවා වාගේම, සියලුම ගුරුවරු ගිහිල්ලා පෞද්ගලිකව ටියුෂන්

දෙනවා. මේ ක්‍රමවේදවල ජාතික ප්‍රතිපත්ති සකස් නොකිරීම තමයි මේ සියල්ලටම වරදක් වෙලා තිබෙන්නේ. මොන ආණ්ඩු ආවත්, ඒක රාජපක්ෂලාද, ඒක රනිල් වික්‍රමසිංහලාද, ඒක මෛත්‍රීපාල සිරිසේනලාද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. මේ රටේ ගමන් මාර්ගය කොහාටද යන්නේ කියන එකයි. අද පාර්ලිමේන්තුවේ ඉන්න සියලු දෙනාට අපේ සභාව හරහා මම අවධානය යොමු කරවනවා. අපි කොහාටද යන්නේ කියන එක මේ සිංහල අවුරුද්දේ කැවුම් ගොඩියක් කාලා ගෙදරට වෙලා ඉන්න කොටවත් කල්පනා කරලා බලන්න. මේ සතියක දෙකක නිවාඩුවක් හම්බ වෙනවා. මේ විධියට රට ගියොත් එහෙම, ඇත්ත වශයෙන්ම කෝටියකට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු අලෙවි වනකොට මේ රට කොහෙන්ද නතර වෙන්නේ කියන එක ප්‍රශ්නයක්. රාජ්‍ය සේවකයා බලනවා මොනවා හරි කරන කොට කවුරු හරි අමුණලා තමුන්ට ඒකෙන් වාසියක් ගන්න පුළුවන් නම් එයා ඒක අරගෙන පැත්තකට වෙනවා. රටට හෙණ ගැහුවත් කමක් නැහැ. ජනමාධ්‍යයත් එහෙමයි. වාසි ලැබෙන්නේ කොහෙන්ද තමන්ට හොඳ ඉඩම් කෑල්ලක් ලැබෙන්නේ කොහෙන්ද? තමන්ගේ ධාරිතාව වැඩි කර ගන්න කොයි ආණ්ඩුවෙන්ද ලැබෙන්නේ ඒ ආණ්ඩුවට කඩේ යනවා. ඒ නිසා අද සෑම අංශයක්ම ආර්ථිකය මුදල පසුපස ගිහිල්ලා රට විනාශකාරී යුගයකට යන තත්ත්වයකට ඇවිල්ලා ඉන්නේ.

අද අපි ගමෙන් ගෙනැල්ලා ජනාධිපතිවරු පත් කරනවා. රටේ අත්දැකීම් තිබෙනවා කියලා අගමැතිවරු පත් කරනවා. ජනප්‍රියයි කියලා හිතෙන, දක්ෂයි කියලා හිතෙන මන්ත්‍රීවරු පත් කරනවා. ඒ සියලු දෙනාම තර්ක විතර්ක කර ගන්නේ තමුන්ගේ බලය රඳවා ගැනීමට පමණයි. සමස්ත ජනතාව අද අසරණ වෙලා. අද මේක පුදුම රටක් කියන්නේ අවුරුදු 20 ක් බලයේ ඉඳලා මේ රටේ ප්‍රශ්න විසඳන්න බැරුව ගිය අයට ආපහු කතිරය ගහනවා. ජනතාව අන්ද මන්ද වෙලා. දේශපාලන තුවාලය කොපමණ ඔද්දල් වෙලාද කිව්වොත් හරි තීන්දුවක් ගන්නවත් ජනතාවට යහපත් කල්පනාවක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ සියලු දේට හේතුව තමයි මේ රටේ ක්‍රමවේදය විකෘති වෙලා තිබෙන එක. අද පක්ෂ විපක්ෂ දෙගොල්ලොම ඡන්ද ක්‍රමයේ තිබෙන අඩුපාඩු කථා කරනවා. ඒ වාගේම රටේ තිබෙන ප්‍රශ්න. නමුත් මේකට විසඳුමක් සොයන්න නම් මේ සමස්තය ඒකාබද්ධ වෙන්න අවශ්‍යයි.

අද අපි විශාල වශයෙන් ණය අරගෙන රට ගෙනියන රාජ්‍යයක්. මේ රාජ්‍යයට සම්පූර්ණ අරමුදල් පොම්ප කරන්නේ විදේශිකයෝ. එතකොට මේ විධියට අනුන්ගේ සල්ලි පොම්ප කර කර, මේ රට අරගෙන යනවාද? අද මම යෝජනාවක් හැටියට කියනවා නම් පාසල්වලින් සමු ගන්න අපේ තරුණ පරම්පරාව ඉන්නවා. මේ අය ශ්‍රම බලකායක් හැටියට හදලා අපේ ඇළ මාර්ග ටික සුද්ද බුද්ද කර ගන්න, කම්කරුවෝ හරි අරගෙන යම්කිසි ක්‍රමවේදයකට වගාවක් කර ගන්න, රටට අවශ්‍ය ආහාර පාන ටික නිෂ්පාදනය කර ගන්න, රටට අවශ්‍ය කර්මාන්තශාලා ටික හදන්න, ඒ බලකාය දාලා මේවා දියුණු කරන්න. අපේ ඉලෙක්ට්‍රොනික පැත්ත, එහෙම නැත්නම් තාක්ෂණික පැත්ත සඳහා ශ්‍රම බලකාය දාලා දියුණු කරන්න. එතකොට රට දියුණු වෙනවා. මෙහෙම කිසිම ක්‍රමවේදයක් නැහැ. ඉගෙන ගන්න ළමයා ගෙදරට වෙලා කම්මැලිකමේ TV එක බල බලා ඉන්නවා. කරන්න දෙයක් නැහැ. ඒ නිසා මම ඔබතුමන්ලා හරහා සියලුම දේශපාලන නායකයින්ට මතක් කරනවා, ඒ වාගේම අපේ සමස්ත රජයට යෝජනා කරනවා මේ ක්‍රමවේදය දිහා තවත් අපි බලාගෙන ඉන්න ලැහැස්ති නැහැ. අපිත් පාරට බැහැලා, මේ සියලුම සල්ලිවලට යන දේශපාලනය විකෘති කරන දේශපාලනය, හිඟන්නාගේ තුවාලය බවට පත් කරගෙන රට විනාශ කරන, රට ගැන හිතන්නේ නැති, ජනතාව විනාශ කරන මේ බලවේගවලට එරෙහිව අපි බලමුළු ගැන්විලා එළියට බහිනවා. ඊට කලින් සෑම කෙනෙක්ම මේ රටේ අධ්‍යාපනය, මේ රටේ ආර්ථිකය, මේ රටේ සෞඛ්‍ය, මේ රටේ අනාගත වැඩ පිළිවෙළ ගැන මීට වැඩිය වැදගත් විධියට අවධානය යොමු කරන්න ඕනෑ කියන එක මතක් කරනවා.

ඒ වාගේම අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට මා ආරාධනා කරනවා මේකේදී අපි දේශපාලන පක්ෂය මොකක් වුණත්, අපේ ජාති ආගම මොකක් වුණත් සමස්ත ලංකාව දියුණු කරනවා නම් අපි එක විධියට හිතලා, එක විධියට මේ වැඩ පිළිවෙළ හදන්න ඕනෑ. ඉගෙන ගන්න ළමයාට හැමදාම ඉස්කෝලයක් නැහැයි කියනවා නම් අපේ නායකත්වය මොකක්ද? මොකක්ද අපි දෙන දේශපාලන නායකත්වය? මේ දෙපාර්තමේන්තුවට රාජ්‍ය සේවකයෝ දහස් ගණන් බඳවාගෙන කරන විකාරය මොකක්ද? ඒක කරන්න බැරි නම් මේ සියලු දෙනාටම අතීතයේ අපි වර්ණනා කරපු 2500 ක ඉතිහාසය ගැන කථා කර කර, තවමත් ඉන්න වෙනවා. මේ කාලේ කරපුවා වර්ණනා කරන්න දෙයක්

[ගරු රෝස් ප්‍රනාන්දු]

නැතුව යනවා. ඒ නිසා වර්ණනා කරන්න පුළුවන් දෙයක් කරන්න. මේ පිළිබඳව වැදගත් යෝජනා අදහස් ඉදිරිපත් කරන්න කියලා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මේ යෝජනාව මම ඉදිරිපත් කරනවා.

[පූ.භා. 10.48 ]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නම් මෙපමණ උදේ පාන්දර කථා කරන්න බලාපොරොත්තුවෙන් හිටියේ නැහැ. නමුත් කලින්ම ලැබුණා. කොහොම වුණත් අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව මම අගය කරනවා වාගේම, (බාධා කිරීමක්) අපි කියන්නේ, මහජන මන්ත්‍රීවරයා කියන එක නේ? කොහොම වුණත් ගියවර එතුමියගේ යෝජනාවට මම කථා කළා. එතුමිය මට දොස් කිව්වා. මන්ත්‍රීතුමා තවම ගතානුගතිකත්වයෙන් මිදිලා නැහැයි කියලා. නමුත් ඔබතුමියට මට කියන්න වෙන්නේ, ඔය යෝජනා ගෙන එනකොට ඇත්තටම මට කනගාටුවකුත් තිබෙනවා. මේ රට ස්වයං පෝෂිත රටක්. මේ රට තුන්වේල බත් කාපු රටක්. නමුත් මේ සියල්ල විනාශ වුණේ මේ රටට හඳුන්වා දීපු ආර්ථික ක්‍රමය නිසයි. වෙළඳ පොළ ආර්ථිකයක් හඳුන්වලා දීලා, විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වා දුන්නාට පස්සේ මිනිස්සුන්ට බල්ලෝ බලල්ලු මරලා හරි සල්ලි හොයන්න කිව්වා මිසක්, මිනිස්සු ළඟ තිබුණු ගුණධර්ම, සාරධර්ම, අපේකම, මිනිස්සුන්ගේ හැඟීම් සියල්ල විනාශ වෙලා ගියා. ඒකත් එක්ක තමයි හැම දෙයක්ම විනාශ වුණේ. අපේ රටට ගැළපෙන දේවල් වාගේම නොගැළපෙන දේවලුත් ආවා. මේ මිනිස්සුන්ගේ ගුණධර්ම, සාරධර්ම සියල්ල විනාශ වෙලා ගියා. ඔය කැළි කසළ ප්‍රශ්න ගත්තත්, හැමදේම බිඳ වැටීම් ආරම්භ වන්නේ මේ විවෘත ආර්ථිකයත් එක්ක. මම මෙතැන ඉඳලා පොතක් කියවමින් හිටියේ. මේ පොතෙත් එක එක මැති ඇමැතිවරු ගැන තිබෙනවා. විදේශීය කෙනෙකු අධ්‍යාපන ඇමැතිවරයා හම්බ වෙන්න එනකොට, එතුමා එදා දවසට විතරක් වෙනත් ආයතනයකින් පුටු ටික ගෙනාවාලු. අමාත්‍යාංශයේ සල්ලි වියදම් කරන්න අවශ්‍ය නැහැ. එදාට විතරක් පුටු ටිකක් ගෙනැල්ලා කටයුතු කළා. මේ සියලු ගුණධර්ම, සාරධර්ම රට තුළ තිබුණා. මේ සියල්ලම දැන් විනාශ වෙලා ගිහිල්ලා හමාරයි. කෘෂිකර්මය ගත්තත් අපට මේ ගතානුගතික භාවයෙන් මිදිලා යන්න පුළුවන්කමක් නැහැ. ඒවා විනාශ කරමින් මේ රටේ කෘෂිකර්මය දියුණු කරන්න වේගයෙන් ගියා. ගිහිල්ලා වෙනත් අභිජනන හඳුන්වා දුන්නා. ඒ වාගේම රසායනික ක්‍රම හඳුන්වා දුන්නා. අවසානයේ වුණේ රටේ වකුගඩු රෝගීන් ප්‍රමාණයක් ඇතිවීම විතරයි. ඒ වාගේම මිනිස්සු විවිධ ලෙඩ රෝගවලින් පෙළෙන්න වුණා. අවුරුදු හයේ හතේ දරුවන්ටත් දියවැඩියාව. රුධිර පීඩනය. මේ වාගේ රෝගවලින් පෙලෙන තත්ත්වයක් තමයි ඇති වුණේ. මේ හැමදේටම හේතුව ප්‍රතිපත්තියක් නැතිකම. අපි හැමදේම වැරැදි ආකාරයෙන් භාරගත්තු නිසා තමයි මේ කටයුත්ත වුණේ.

නමුත් අපි ඉතිහාසයට යනකොට - එදත් මම කිව්වා මේ රටේ රජ කෙනෙක් රජ කළා. හරි හෝ වැරැදි මිනිස්සුන්ට පැවරුණු කාර්යයන් තිබුණා. ඒ කාර්යයන් මිනිස්සු ඉටු කළා. ඒ තුළ කුලවාදය ඇති වෙන්නට ඇති. ඒ පිළිබඳව මිනිස්සුන්ගේ උස් පහත් භේද ඇති වෙන්නට ඇති. හැබැයි මිනිස්සුන්ට කරන්න නිත්‍ය වූ කාරණා තිබුණා. බෙර ගහන මනුස්සයාට බෙර ගහන්න තිබුණා. රෙදි හෝදන මනුස්සයා රෙදි හේදුවා. ඒ වාගේම ගොවිතැන් කරන මනුස්සයා ගොවිතැන් කළා. ඒ වාගේම මාළු අල්ලන මනුස්සයා මාළු ඇල්ලුවා. ඒ වාගේ දේවල් කළා. ඒ තුළින් නිපුණතාවය එන මිනිස්සු එතැනින් ඉහළට ආවා. නමුත් ඉංග්‍රීසි පාලනයත් එක්ක මේවා වෙනස් වුණා. මේවා වෙනස් වුණාම, අපට පැවරුණේ ගොවිතැන් කරන්න නම්, අපි යනවා පිහි හදන්න. අපට පැවරුණේ ගොවිතැන් කරන්න නම් අපි යනවා කොණ්ඩේ කපන්න. ඒවා එකක්වත් නිසියාකාරයෙන් ඉටු වෙන්නේ නැහැ. සමාජයේ යම්කිසි ගෞරවනීය තත්ත්වයක් ඇති වෙන්නට ඇති. කුල භේදය නැති වෙන්න කටයුතු කළා ඇති. නමුත් මේවා හඳුන්වා දුන්නා කියලා මිනිස්සුන්ගේ මනසින් ගතානුගතික ඒවා වෙනස් වුණේ නැහැ. හැබැයි නිපුණතාවයට - අපේ දරුවෙකුටත් බෙරයක් ගහන්න පුළුවන් වෙයි. හැබැයි පරම්පරාවෙන් එනකොට ඒ තුළ ගතානුගතිකව තිබුණු යම් යම් ශක්තීන් සියල්ල විනාශ වෙලා ගිහිල්ලා. ඒ තුළ තිබුණු සම්ප්‍රදායන් වෙනස් වෙලා. ඒ නිසා අපි වාගේ රටකට, තුන්වැනි ලෝකයේ රටකට මම හිතන්නේ නැහැ එකපාරටම මේ ලෝකය දිහා බලලා දියුණු වෙන්න පුළුවන් වෙයි කියලා. මම හිතන්නේ නැහැ විශ්ව ගම්මානය දැක්කා කියලා එක පාරටම ඒ දේ කරන්න පුළුවන් වෙයි කියලා. අපි යම්කිසි ආගමික වශයෙන් බැඳීම් තිබෙන, ඒ වාගේම

සම්ප්‍රදායන් ආරක්ෂා කරන, ඒ වාගේම විවිධ පරිසර තුළ නිර්මාණය වුණු ජනතාවක්. ඒ නිසා අපට අධ්‍යාපනය වෙන්න පුළුවන්, ඒ අධ්‍යාපනය අපට කොපමණ ගැළපෙනවාද? අපට ආගමෙන් කොපමණ දුරට බැහැර වෙන්න පුළුවන්ද? අපට යම් යම් ගුණ ධර්මවලින් බැහැර වෙන්න පුළුවන්ද? අපේ අම්මාගේ, තාත්තාගේ තිබෙන සෙනෙහසින් කොපමණ දුරට බැහැර වෙන්න පුළුවන්ද? අපට පන්සලේ හාමුදුරුවෝ දෙන නායකත්වයෙන් බැහැර වෙන්න පුළුවන්ද? මේ වාගේ කාරණාත් එක්ක තමයි අපි ඉදිරියට යන්න ඕනෑ. රටක පැවැත්ම ඇති වෙන්නේ මෙන්න මේ කාරණාත් එක්ක ගියොත් විතරයි. එහෙම නැතුව සීඝ්‍ර සංවර්ධනයක් කියලා, මේ රටට විවෘත ආර්ථිකය හඳුන්වලා දුන්නා. පොලිතින් ගොඩ ඇවිල්ලා මේ රට අද කසළ ගොඩක් බවට පත් වීම විතරයි වුණේ. හැබැයි මේ රටේ කසළ කියලා දෙයක් තිබුණේ නැහැ. මිනිස්සුන්ට කාබනික පොහොර ටික වගා කරලා, හරකා බාන හදාගෙන, එදා මිනිස්සු පොහොර ටික නිර්මාණය කරගෙන ජනසමාජයේ හොඳින් කටයුතු කළා.

මෙන්න මේ කාරණාත් එක්ක බලනකොට මම හිතන්නේ අපේ ගරු මන්ත්‍රීතුමිය කියනවා වාගේ රටක් වශයෙන් ගන්න කොට අපට යම්කිසි ක්‍රමවේදයක් තිබෙන්නට ඕනෑ. යම්කිසි ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ඒ ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය නායකයාගේ ඉඳලා ඒක පල්ලෙහාට ගලාගෙන එන්නට ඕනෑ. මන්ත්‍රීකමක් දරන කොට, ඇමැතිකමක් දරන කොට නිපුණතාවයක් තිබෙන්නට ඕනෑ. මේ තුළ ඔවුන්ට තිබෙන හැකියාව මොකක්ද? ඒ රටේ නායකයන්ට දුර දක්නා දැනුමක් තිබෙනවාද? එහෙම නම් ඒ අමාත්‍යතුමාට විෂයය පිළිබඳව හසළ අත්දැකීමක් තිබෙනවාද? මේ කාරණා නැතුව කටයුතු කරන්න බැහැ. තුන්වැනි ලෝකයේ රටක් වශයෙන් අපි ලෝකයට යට නොවුණු, තව තැනක කෘෂිකර්ම නිෂ්පාදන ඇති වනකොට, තව තැනක වෙනත් දේවල් නිෂ්පාදනය වෙනවා. හුවමාරු ආර්ථික ක්‍රමයක් මේ රට තුළ නිර්මාණය වෙලා අපි හුදෙකලා වුණත්, ස්වයං පෝෂිත රටක් වශයෙන් තිබුණු රට තමයි අද විනාශය කරලා ගිහිල්ලා තිබෙන්නේ. අද ලෝක බැංකුව කියන විධියට තමයි අපේ ආර්ථිකය හසුරුවන්න වෙලා තිබෙන්නේ. අද අපේ අධ්‍යාපනය හසුරුවන්න වෙලා තිබෙන්නේ. අද රටක් වශයෙන් ගන්න කොට අපි ගොඩක් පල්ලෙහාට ගියා කියන එක තමයි අපි විශ්වාස කරන්නේ.



ඒ නිසා කනගාටුවට කාරණය තමයි, අපි කථා කළේ පණ්ඩුකාභය රාජ්‍ය පාලනය ගැන. අපි කථා කරන්නේ පංචායත් පාලන ක්‍රමය ගැන. හැබැයි ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීතුමන්ලා 60 යි, 70 යි. පළාත් පාලන ඇමැතිවරයා කියනවා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයා හිටගෙන සේවය කරන්න ඕනෑ කියලා. ඇමැතිවරයා යනවා සැප වාහනයක. ඇමැතිවරයාට අමාත්‍යාංශයක් තිබෙනවා. ඇමැතිවරයාට සියලු සම්පත් තිබෙන කොට ඇමැතිතුමා කියනවා මහජනතාවට සේවය කරන්න ආපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා හිටගෙන හරි වැඩ කරන්න ඕනෑ කියලා. ඒ වාගේ පණිවිඩයක් තමයි, ආදර්ශයක් තමයි රට තුළ නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ නිසා ආදර්ශය ඉහළ ඉඳලා පල්ලෙහාට ගලාගෙන එන ක්‍රමවේදයක් මේ රට තුළ නැහැ. සැප විඳින කෙනා සැප විඳිනවා. බලතල තිබෙන කෙනා බලතල අනුව කටයුතු කරනවා. රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. සාමාන්‍ය ජනතාවට තමන්ගේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙන්නේ නැහැ. මේවා සංකල්ප බවට විතරයි පත් වෙලා තිබෙන්නේ.

මේ රට තුළ මැද කොටසක් ඉන්නවා. බිම් මට්ටම. ජනතාවට අවශ්‍යතා තිබෙනවා. පාර හදන්න ඕනෑ. ඇළ වේල්ල හදන්න ඕනෑ. කුඹුරු වගා කරන්න ඕනෑ. මේ සාමාන්‍ය ජනතාවට, මැද කණ්ඩායමක් ඉන්නවා. මැද කණ්ඩායම කියනවා රටේ සාධාරණ සමාජයක් ගොඩ නැගෙන්න ඕනෑ. අතුරුදහන් වීමෙන් වැළකෙන්නට ඕනෑ. තොරතුරු දැන ගැනීමේ පනතක් ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙන්න ඕනෑ. ජනාධිපති ක්‍රමය නැති වෙන්න ඕනෑ. මේ මැද කොටස තීන්දු කරනවා මේ රටේ පාලනය මොන විධියටද සිද්ධ වෙන්න ඕනෑ කියලා. එතකොට බිම් මට්ටමේ මිනිස්සුන්ගේ අවශ්‍යතා සිද්ධ වෙන්නේ නැහැ. මෙන්න මේ දේශපාලන ක්‍රමය තමයි මේ රට තුළ ක්‍රියාත්මක වෙන්නේ. කොපමණ පාරවල් හැදුවත්, කොපමණ ඇළ වේලි සංවර්ධනය කළත් අර මැද ඉන්න මිනිස්සු කථා කරන ව්‍යවස්ථා සංශෝධනය පුංචි මිනිහාට වැඩක් නැහැ. මේ රටේ ජනාධිපතිතුමාට මොන තරම් බලතල තිබුණත්, නැති වුණත් වැඩක් නැහැ. තොරතුරු දැන ගැනීමේ පනත මහජනතාවට වැඩකුත් නැහැ. අතුරුදහන් වීමේ කොමිසම වැඩකුත් නැහැ. මිනිස්සුන්ට ජීවත් වීමේ අයිතිය තිබෙන්නට ඕනෑ. මිනිස්සුනට බඩ වියත රැක ගන්නට ඕනෑ. මෙන්න මේ දේශපාලන උවමනාව අපි යථාර්ථයක් කර ගන්නට

**[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]**

ඕනෑ. අන්න එය යථාර්ථයක් කර ගත්තොත් රටක් වශයෙන් ඉදිරියට යන්න පුළුවන්. ඒ නිසා ශ්‍රී ලංකාව කියන්නේ තුන්වැනි ලෝකයේ රටක් වශයෙන් මෙන්න මේ ක්‍රමවේද, අපට තිබෙන ගතානුගතිකභාවය, සම්ප්‍රදාය මේ සියල්ල ආරක්ෂා කරගෙන නවීන ලෝකයට යන්න අපේ දරුවෝ අපි නිර්මාණය කරන්නට ඕනෑ. ඒ යන දරුවා නීරෝගී සම්පන්න දරුවෙක් කරන්න අපි මොනවාද සෞඛ්‍ය පැත්තෙන් අරගෙන තිබෙන්නේ? අපේ දරුවාට දරා ගැනීමේ ශක්තිය තිබෙනවාද? අධ්‍යාපනය කියලා දරුවාට අපි මොනවාද ලබා දීලා තිබෙන්නේ? දරුවා නිපුණතාවයට පත් වෙලා තිබෙනවාද? එහෙම නම් දරුවාට සුවිශේෂී හැකියාවන් නිර්මාණය වෙලා තිබෙනවාද? කුසලතා, ආකල්ප, දැනුම වර්ධනය වෙලා තිබෙනවාද? දරුවා වෙනුවෙන් මොන විධියටද අධ්‍යාපනය ගොඩ නඟලා තිබෙන්නේ?

ඒ වාගේම මේ රටේ සංවර්ධනය කියලා, පුංචි පවුල රත්තරන් කියලා අපේ දරු පවුල් සීමා වෙලා. අපේ සිංහල කියන අනන්‍යතාවය කොතැනද ගොඩ නැඟිලා තිබෙන්නේ? රටක් වශයෙන් බලනකොට. වෙනත් ජාතීන් ඉන්න පුළුවන්. මේ ලෝකයේ සිංහල කථා කරන, සිංහල ජාතිකයක් ඉන්නේ ලංකාවේ පමණයි. එතකොට මේ තුළ කටයුතු කරනවාද? ගුරුවරුන්ගේ, රාජ්‍ය සේවකයාගේ ආකල්ප ගොඩ නැඟිලා තිබෙනවාද? ඔවුන් මුදලටද, නැත්නම් තමන්ගේ සේවයටද කටයුතු කරන්නේ? මේ වාගේ කාරණා ගණනාවක් දිහා බලනකොට මම හිතනවා, අපි ඉතා පල්ලෙහාට ගිහිල්ලා තිබෙන රටක්. ප්‍රතිපත්තියක් වශයෙන් මිල මුදලට වැඩ කරන යුගයක මිනිස්සුන්ට හැඟීමක් ඇති කරන්න ඕනෑ, මේ මගේ රට. මේ මගේ ජාතිය. මම මේ වෙනුවෙන් වැඩ කරන්න ඕනෑ කියලා. ඒ හැඟීම ඇති මිනිස්සු මේ රටේ බිහි කරන්න නම් අපට ප්‍රතිපත්තිමය වශයෙන්, රටක් වශයෙන්, නායකයෝ වශයෙන් කැප කිරීම් කරන්නට ඕනෑ. ඒ නිසා කැප වෙනවා කියන නායකයෝ හැම කෙනාම තමන්ගේ රට පිළිබඳව නිවැරදි දේශපාලන මතයක් දැරුවාය කියලා මම හිතන්නේ නැහැ. ඒ නිසා අපි හැම තිස්සේම අපේ රටට ගැළපෙන දේශපාලන, ප්‍රාදේශීය වෙන්න පුළුවන්. ඕනෑම තීන්දු තීරණ ගන්නට ඕනෑ. මම නිරන්තරයෙන් විශ්වාස කරන දේ තමයි විවෘත ආර්ථිකය මේ රට විනාශ කළා. මේකට යම්කිසි කෙනෙක් අත ඉස්සුවා නම්, කවුරු හරි කෙනෙක් හා කිව්වා නම් ඒ හරහා මේ රටට ලැබුණු යහපත් දේට වඩා අයහපත් දේ බොහෝයි. සමහර විට විශ්වය තුළ අපි රටක් වශයෙන් ඒකාබද්ධ වෙන්න ඇති. නමුත් මේ රටට ආපු බොහෝ දේ මේ රටේ විනාශය කරා අරගෙන ගියා කියන එක මතක් කරනවා. මම දීර්ඝ වශයෙන් කරුණු අධ්‍යයනය කරලා නොවෙයි කථා කළේ. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීතුමිය අද ගත්තු උත්සාහය මේ කාර්ය භාරය මම අගය කරනවා. මම උදේ ඉඳන් කල්පනා කළේ, මේ සීට් එකේ ඉඳගෙන කල්පනා කළේ මේ පළාත් සභාවේ මට නම් පොඩි හිස් බවක් පේනවා. න්‍යාය පත්‍රයට ගියාට පස්සේ යහපත් කාරණා කථා නොකෙරෙන බවක් තමයි මට දැනෙන්නේ. මම ඒ දේ කියන්නට ඕනෑ. ප්‍රඥප්ති කාරක සභා තිබෙනවා. රීති කාරක සභා තිබෙනවා. බලය පිළිබඳව අපට ගැටළු තිබෙනවා. පවර ගත්තු බලය පිළිබඳව අපට යම් යම් චෝදනා තිබෙනවා. ඉතින් මේවා සම්පාදනය කරලා මේ ගරු සභාව ප්‍රතිපත්ති සකස් කරන, නීති සකස් කරන, ප්‍රඥප්ති සකස් කරන, පැය ගණනක් දුර ඉඳලා ඇවිල්ලා පැය ගණනක් මේ පුටුවේ ඉඳගෙන ඉඳලා යනකොට මේ සභාවට යම්කිසි ගෞරවනීය දෙයක් පිරිනමන්න අපට වඩා දැන උගත් බොහෝ අය මෙතැන ඉන්නවා. දැනුම තිබෙන අය. ඒ අයගෙන් සැදුම්ලත් මේ සභාවේ මීට වඩා ගෞරවයක් ඇති කරනවා නම් මේ හිස් බව නැති වෙලා යයි. අපි ආපහු මේ පුටුවෙන් නැඟිටලා යන වෙලාව වනකොට - මම නම් මේ කරපු කථාව pen එකේ දාගෙන ගිහිල්ලා මගේ දරුවාට හරි පෙන්වනවා. නමුත් අපට අරගෙන යන්න කිසි දෙයක් ඉතුරු වෙලා නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාව මීට වඩා ගෞරවනීය සභාවක් කරන්න ඔබතුමන්ලා කටයුතු කරන්න කියලා ගෞරවයෙන් සිහිපත් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 10.59 ]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය මේ සභාවට අද ඉදිරිපත් කරපු යෝජනාවට කථා කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. දැන් අවුරුදු 20 ක විතර කාල සීමාවේදී මේ සභාවේ මම හිතන්නේ මෙවැනි යෝජනා බොහෝමයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. හැබැයි මේ හැම යෝජනාවක්ම න්‍යාය පුස්තයකට විතරක් සීමා වෙලා ක්‍රියාත්මක කරන්න

තිබෙන අපහසුතාවය සහ ක්‍රියාත්මක කරන්න උනන්දුවක් නොවීම පිළිබඳව අපි කනගාටු වෙන්න ඕනෑ. අඩුම තරමින් මේ යෝජනාව අපට මේ සභාව ඇතුළේ ක්‍රියාත්මක කරන්න බැරි වුණත්, මේ අදහස සමාජගත කරලා මේ රටේ මිනිස්සුන්ට පළාත් සභාවක් හැටියට ලබා දෙන්න පුළුවන්කමක් තිබෙනවා නම් මම හිතන්නේ, අපට ඒක වටිනා දෙයක් බව මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ රට දිහා බැලුවාම අපට මතක කාලයේ, 1956 තමයි මේ රට ඉංග්‍රීසි පාලනයෙන් මිදුණාට පස්සේ විශාල වෙනසක් වුණා කියලා අපට දැනෙන්නේ. 1948 න් පස්සේ ආපු පාලන ක්‍රමය, 1956 තමයි මේ රටේ මිනිස්සු විශ්වාසයක් ඇතුව ආණ්ඩුවක් පත් කරන්නේ. මේ රට යම් දිශාවකට, මාවතකට හරිගස්සන ඕනෑ කියලා. හැබැයි ඒ මාවතේ බොහෝම ටික කාලයයි යන්න ලැබුණේ. බණ්ඩාරනායක අගමැතිතුමාව ඝාතනය වීමෙන් පස්සේ ඒ ක්‍රමය එහෙම්ම නතර වෙනවා. ඊට පස්සේ අපට ආයෙත් කාලයක් යනකල් දකින්න ලැබෙන්නේ නැහැ.

අපි දැක්කා. 1970 දී අපි පුංචි කාලයේ පාසල් යන පුංචි දරුවෝ හැටියට සිරිමා බණ්ඩාරනායක අගමැතිතුමිය දේශීය ව්‍යාපාර නංවලා මේ රට දියුණු මාවතට ගෙන යන්න දරපු උත්සාහය. මේ රටේ මිනිස්සුන්ට බොහොම කැප කිරීම් කරන්න සිද්ධ වුණා. මඤ්ඤොක්කා, බතල කාලා, පෝලිම්වල ගිහිල්ලා, පිටරටින් එන ද්‍රව්‍ය භාණ්ඩ යම් ප්‍රමාණයකට සීමා වෙලා, තහනම් වෙලා දේශීය වශයෙන් ඒ කටයුත්ත කරන්න උත්සාහ කෙරුවා. අවසාන ප්‍රතිඵලය වුණේ මොකක්ද? 1977 දී ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිමටම සමතලා කරලා දැම්මා. එතකොට මේ රටේ මිනිස්සු තමයි ඒ ඡන්ද පාවිච්චි කෙරුවේ. ආසන 08 කට සීමා වුණා. එතකොට අපේ උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඒක එතුමාගේ මතය වෙන්නට පුළුවන්. අදට අවුරුදු 40 ක්. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ ඉඳලා විවෘත ආර්ථිකයකට මේ රට නැඹුරු වෙනවා. සම්පූර්ණයෙන්ම ලංකාව කණපිට ගහන තත්ත්වයක් තමයි ආර්ථික වශයෙන් ඇති කරන්නේ. හැබැයි එකේ හොඳ ලක්ෂණ වාගේම බොහෝ නරක ලක්ෂණත් තිබෙනවා. අපේ රටේ මිනිස්සු විශේෂයෙන්ම වැළඳ ගන්නේ හොඳ දේවල් නොවෙයි. අපේ රටේ මිනිස්සුන්ට ඒ අසීමිත නිදහස ලබා දුන්නාම වැළඳ ගන්නේ පිටරටින් එන ඉතාම නරක දේවල් තමයි. මම හිතන්නේ මේ ලෝකයේ රටක් තිබෙනවා නම් නරකම දේවල් වැළඳ ගන්නට ඒ අපේ රටේ මිනිස්සු තමයි. ඒක නිසා මොකක්ද සිද්ධ වුණේ? විවෘත ආර්ථිකය එක්ක යන්න ඕනෑ. කවුරු මොනවා කිව්වත් ලෝකයත් එක්ක අපි ගමන් කරන්න ඕනෑ. අපි හුදෙකලා වන රාජ්‍යයක් නොවෙයි. ඒක නිසා විවෘත ආර්ථිකය ආපු වෙලාවේ අපි දැක්කා - සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ රජයෙන් පස්සේ විවෘත ආර්ථිකය ආවාම මිනිස්සු මොන තරම් විධියට අතට සල්ලි එන ව්‍යාපාර මේ රටේ ඇති කෙරුවාද කියලා. හැබැයි එතුමියගේ ඒ පාලන කාලයේ ඒ කටයුත්ත හරියට කර ගන්න බැරි වුණු හේතු කිහිපයක් තිබුණා. එක පැත්තකින් ඒ කාලයේ රට ඇතුළේ ජනතා විමුක්ති පෙරමුණේ අරගලයක් තිබුණා. ඒ වාගේම එල්.ටී.ටී.ඊ. තර්ජන පටන් ගත්තෙත් මේ කාලයේ තමයි.

මෙන්න මේ කාරණා දෙක නිසා ගමන් කරන්න ගිය දිශාවට, ඒ ඉලක්කයට ආණ්ඩුවට යන්න බැරි වුණා. ඒක අපොහොසත් රාජ්‍යක් බවට පරිවර්තනය වෙන්නේ මේ කාරණා නිසා. ඒක නිසා අපි බලාපොරොත්තු වුණු දේ නැතිව ගියා. ඒකත් මේ රටේ මිනිස්සුන්ගේ අවාසනාව. නැවත වතාවක් 1977 ආණ්ඩුව අවසන් වෙලා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ ආණ්ඩුව එනවා. මම හිතන්නේ ඒතරම් සැලකිය යුතු වෙනසක් මේ රටේ ඇති වුණේ නැහැ. එතුමිය බලයට පත් වෙන්නේ විවෘත ආර්ථිකයට මානසික මුහුණුවරක් දෙනවා කියලා. මේක තමයි සෝගම් එකක් විධියට පාවිච්චි කෙරුවේ. හැබැයි කිසිම මානුෂික මුහුණුවරක් ලබා දුන්නේ නැහැ. ඒ ආර්ථික ප්‍රතිපත්තියම තමයි ගෙන ගියේ. සාරධර්ම පිරිහුනු සමාජයක් තමයි අපි දැක්කේ. මොනවාද අපි රටක් දියුණු වෙනවා කියලා කළේ. ආර්ථික වශයෙන් දියුණු වුණාම විතරක් ඒ රට දියුණු වෙනවාද? නැහැ. ආර්ථික වශයෙන් දියුණු වෙන්න ඕනෑ. සමාජයීය වශයෙන් දියුණු වෙන්න ඕනෑ. සාරධර්ම දියුණු වෙන්න ඕනෑ. නීතිය හා සාමය, යුක්තිය ඒ රට තුළ තිබෙන්න ඕනෑ. මේ තිබෙන කාරණා එක්ක තමයි දේශපාලන නිදහස ස්ථාවර වෙන්න ඕනෑ. එහෙම වුණාම තමයි රටක් ශක්තිමත් රටක් විධියට එහෙම නැත්නම් දියුණු රටක් විධියට කල්පනා කරන්න පුළුවන් වෙන්නේ. එක අංශයක් විතරක් තිබිලා වැඩක් නැහැ. දේශපාලන නිදහස තිබිලා වැඩක් නැහැ රටේ ආර්ථික නිදහස නැත්නම්. ආර්ථික නිදහසයි, දේශපාලන නිදහසයි දෙකම තිබිලා වැඩක් නැහැ රටේ සාදාචාරය, යුක්තිය ඉෂ්ට වෙන්නේ නැත්නම්. නීතිය හරියට ඉෂ්ට වෙන්නේ නැත්නම්. ඒක

[ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා]

නිසා ඒ කාලසීමාව තුළදී විශේෂයෙන්ම අපට සිද්ධ වුණා නැවත වතාවක් පහුවන රාජ්‍යයක් විධියට යන්න. නමුත් මේ කාරණා ඔක්කෝම ගිහිල්ලා ඊට පස්සේ මහින්ද රාජපක්ෂ මහත්තයාගේ යුගය එනවා. රටේ විශාල යුද්ධයක් තිබුණා. උදේ ඉඳලා හැන්දෑ වෙනකල් බෝම්බ පුපුරන රටක් මේක. තිස් අවුරුදු යුද්ධයක්. මිනිස්සු ඉල්ලුවේ එක දෙයයි. මේක හොඳට මතක තියා ගන්න ඕනෑ. මිනිස්සු ඒ වෙලාවේ කන්න ඉල්ලුවේ නැහැ. රටේ නිදහස මිනිස්සු ඉල්ලුවේ නැහැ. රටේ සාදාචාරය මිනිස්සු ඉල්ලුවේ නැහැ. මිනිස්සු ඉල්ලුවේ මේ යුද්ධය අවසන් කරලා රටේ සාමය ඇති කරන්න කියලා. එතුමා ඒකට නායකත්වය දුන්නා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ රටේ උදේ ඉඳලා හැන්දෑ වෙනකල් තැන් තැන්වල මිනිස්සු මැරෙන කොට, විරෝදාර රණවිරුවෝ තමන්ගේ රට වෙනුවෙන් ජීවිතය පූජා කරන කොට ඒකට කොයි වෙලේ හරි තිතක් තියන්න සිද්ධ වුණා. ඒක හොඳින් හෝ නරකින්, අද කවුරු කොයි විධියට කථා කළත් ඒ යුද්ධය අවසන් වීම පිළිබඳව අපේ යම්කිසි ප්‍රශංසාවක් තිබෙනවා.

හැබැයි, ඒක තමයි මේ රටට හම්බ වුණු ස්වර්ණමය අවස්ථාව. සියලුම විපක්ෂ බලවේග එක කඳවුරකට ආවා. මම හිතන්නේ බොහොම සොච්චම් ප්‍රමාණයයි ඉතුරු වුණේ. ඒ සියලු දෙනාම නැවත මේ රට ගොඩ නඟන්න ඕනෑ කියන මතය ඒ ජනාධිපතිවරයාත් එක්ක හිටියා. අපි දැක්කා රනිල් වික්‍රමසිංහ මැතිතුමා විපක්ෂ නායකවරයා හැටියට ඒ සඳහා තමන්ගේ සහයෝගය දෙන්න ප්‍රසිද්ධියේ පාර්ලිමේන්තුවේදී සහ ඉන් පිටතදී කටයුතු කරපු ආකාරය. දැන් ඒක වුණාද කියන ප්‍රශ්නය තමයි ආපහු හැරිලා බලන්න ඕනෑ. මොකක්ද සිද්ධ වුණේ? එතුමා කල්පනා කළා මේ රටට මේ නිදහස ලබා දුන්නේ මම. ඒක නිසා දැන් එතුමාට තිබෙන්න ඕනෑ මේ රටේ මිනිස්සුන්ගේ සදාචාරය ඇති කරන්න. නීතිය, යුක්තිය, මේ රට තුළ සමානාත්මතාවය ඇති කරන්න. ජනතාවට ආර්ථික නිදහස දෙන්න. දේශපාලන නිදහස අපේ තිබුණා. රටේ ස්ථාවරත්වයක් තිබුණා. දැන් මොකක්ද සිද්ධ වෙන්නේ? ඊට පස්සේ කල්පනා කරන්නේ තමන්ගේ බලය රැක ගැනීම විතරයි. ඒක තමයි අපි පසුගිය කාලයේ දැක්කේ. එක පවුලක්, එක කණ්ඩායමක්, එක වර්ගයක් ඒ කණ්ඩායම් ටික එකතු වෙලා මේ රට තමන්ගේ රට, අපි නිදහස දිනා ගත්තු රට කියන චේතනාවෙන් මේ රටේ පාලනය ගෙන යන්න උත්සාහ කරනවා. ඒකේ හොඳම උදාහරණය තමයි මේ රටේ ව්‍යවස්ථාව වෙනස් කිරීම. ජනාධිපතිවරයෙකුට අවුරුදු හය හය, අවුරුදු දෙළහක් මේ රටේ ජනාධිපතිකම දරන්න, නීතියෙන් අවස්ථා දෙකයි තිබුණේ. ඉතාම නින්දිත ආකාරයට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ ඔළුගෙඩි මුදල්වලට එහාට මෙහාට මාරු කරලා - මුදල්වලට මන්ත්‍රීවරු මාරු කිරීම සම්බන්ධව මේ දවස්වලත් කථා වෙනවා. පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ව සල්ලිවලට ගන්නවා කියලා. මේ ක්‍රමය අපි පසුගිය කාලයේ දැක්කා. ඒ විධියට තමයි කෝටියයිද, දෙකයිද, වාහනද, ගෙවල්ද, මේ විධියට දීලා තමන්ගේ බල කඳවුර ආරක්ෂා කර ගන්නවා, තුනෙන් දෙකක ඡන්දය ගන්න. එහෙම ගිහිල්ලා මොනවාටද යන්නේ? මේ රටේ දියුණුව ගැන හිතන්නද? නැහැ. තමන්ට කොහොමද දෙපාරද, තුන්පාරද, හතරපාරද, පස් පාරද, ජීවිතාන්තය දක්වාද මේ රටේ විධායක ජනාධිපතිවරයා වෙන්න ඕනෑ කියන සංශෝධන ගෙනැල්ලා ඒක අනුමත කර ගන්න ඕනෑ. ඒක තමයි සිද්ධ වුණු දේ. නමුත් මොකද අවසානයේ සිද්ධ වුණේ?

අපි දැක්ක ඉතිහාසයේ, 2015 ජනවාරි මාසයේ 08 වැනිදා වනකොට තමන්ගේම කොට්ඨාශයක් ආපහු කඩාගෙන ගිහිල්ලා මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් කියන ප්‍රධාන ජාතීන් තුනත්, ඒ වාගේම ආගම් වශයෙනුත් කිසිම භේදයක් නොමැතිව ඒ ක්‍රියාවට විරුද්ධව එක පෙළකට හිටිනවා. එක පෙළකට ඇවිල්ලා තමයි 2015 ජනවාරි 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා මේ රටේ ජනාධිපති වෙන්නේ. ඒක අපි හොඳ ලක්ෂණයක් හැටියට දැක්කා. මේ රටේ තිබෙන ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතු වෙලා මේ රට දියුණු කරන්න අවශ්‍ය කරන පසුබිම හැදෙයි කියලා. අපට විශාල විශ්වාසයක් තිබුණා. මොකද, එහෙම තමයි මේ රටේ පාලනය හැමදාම මාරු වුණේ. එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. තට්ටු මාරු ක්‍රමයට. දැන් මේ දෙක එකට එකතු වුණාම මේ රටට විශාල සංවර්ධනයක් - මේ රටේ සාමය තිබුණා. ආර්ථික නිදහස, සදාචාර සම්පන්න රටක් හැටියට ගොඩ නැඟෙයි කියලා අපේ බලාපොරොත්තුව තිබුණා. නමුත් අවුරුදු තුනක් යනකොට අපි ආපහු හැරිලා බලන කොට දැන් අපි කොතැනද ඉන්නේ කියන එක පිළිබඳව තම තමන් ස්වයං විවේචනයක් කර ගන්නවා හොඳයි. පෞද්ගලිකවම නම් මගේ හිතේ

සන්තෝෂයක් නැහැ. අපි නම් යන්න තිබුණු ඉලක්කයට මේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකතු වෙලා මේ රට ආණ්ඩු කරන කොට ඒකට යන්න අසමත් වෙලා තිබෙනවා. ඒ අසමත් භාවය තමයි හෙට දවසේ විශ්වාසභංග යෝජනාවක් විධියට අගමැතිවරයාට පාර්ලිමේන්තුවට එන්නේ. තමන්ගේ බල කඳවුර ශක්තිමත් කරන්න කොයි පැත්තෙන් හරි දැන් කටයුතු කරගෙන යනවා. මේක නොවෙයි වෙන්න තිබුණේ. මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක මේ විධියට එකතු වුණා නම් මේ අවුරුදු තුන ඇතුළේ මේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ගේ ජන ජීවිතය මීට වැඩිය උසස් තත්ත්වයක තිබෙන්නට ඕනෑ. නමුත් එහෙම වෙලා නැහැ. ඒක ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. මොකද, ඒ වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් පෙනී හිටපු මිනිස්සු, කිසිම ලාභ ප්‍රයෝජනයක් නොමැතිව. මේ ආණ්ඩුව අපේ, මේ අගමැතිවරයා අපේ, මේ රජය අපේ කියලා පෞද්ගලිකව ඉහට ගත්තේ නැති මන්ත්‍රීවරයෙක් මම. අපට එහෙම කරන්න තිබුණා. නමුත් අපි මේ රට ගැන හිතලා එහෙම කෙරුවේ නැහැ. ඒකෙන් ප්‍රයෝජන ගත්තු මිනිස්සු තමයි අද විශ්වාසභංග යෝජනා ගෙනැල්ලා මේ අගමැතිවරයාවත් මාරු කරන්න උත්සාහ කරන්නේ.

මේ කුහක දේශපාලනය තිබෙනකල් මේ රටේ කවදාවත්, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කියන යෝජනාවේ අන්තර්ගතය අපට සමාජගත කරලා ක්‍රියාත්මක කරන්න වෙන්නේ නැහැ. ඒ නිසා ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක් තුළ තමයි මේ රට ගමන් කරන්නේ. ඒ පිළිබඳව කථිකා කරන්න හොඳම දවස අද තමයි. හෙට දවසේ මේ වාගේ තීරණාත්මක තත්ත්වයක් පාර්ලිමේන්තුවේ තියෙද්දී - පැහැදිලිවම ගමන් කරන්න තව අවුරුදු දෙකක් මේ ආණ්ඩුවට තිබෙනවා. ජනාධිපතිවරයාටත් අවුරුදු දෙකකට අඩු කාලයක් තිබෙනවා. මේ රටේ යම්කිසි ප්‍රතිපත්ති මාලාවක්, අපට ජාතික ප්‍රතිපත්තියක් නැහැ. ඇමරිකාවේ ඩිමොක්‍රටික් පක්ෂය ආවත්, රිපබ්ලිකන් පක්ෂය ආවත් ඒ රටට ජාතික ප්‍රතිපත්තියක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තියේ රාමුවෙන් පිට පැනලා කවුරුත් වැඩ කරන්නේ නැහැ. නමුත් අපේ රටේ එහෙම නොවෙයි. අගමැතිවරයාගෙන් අගමැතිවරයාට වෙනස් වුණු ප්‍රතිපත්තියක් තිබුණේ. ජනාධිපතිවරයාගෙන්, ජනාධිපතිවරයාට වෙනස් වුණු ප්‍රතිපත්තියක් තිබුණේ. අවුරුදු 05 වැඩ පිළිවෙළ කියලා අවුරුදු 05 කට සීමාවක් හදනවා. දස අවුරුදු සැලැස්ම කියලා හදනවා. හැබැයි ජාතික වැඩ පිළිවෙළක් කවුරුත් හැදුවේ නැහැ. මේ ගඟ කොහේටද හරවන්නේ? කොටතැනද ගුවන් තොටුපළ හදන්න ඕනෑ? කොතැනද වෙළඳ කලාපය හදන්න ඕනෑ? මේ රටේ මිනිස්සුන්ට, මේ රටේ තරුණ තරුණියන්ට රස්සාවල් දීමේ ක්‍රමය මොකක්ද? උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කියපු සමහර කාරණා පිළිබඳව මම එකඟ වෙන්නේ නැහැ. මොකද, බෙර ගහන මිනිස්සු හැමදාම බෙර ගහන්න ඕනෑ නැහැ. ඒ මිනිස්සු එතැනින් එළියට යන්න ඕනෑ. එතකොට කොහොමද මේ මිනිස්සුන්ට තමන්ගේ තරුණයන්ට, තරුණියන්ට රස්සාවල් හොයා ගන්න ක්‍රමය. මොකක්ද තිබෙන ක්‍රමය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් අදටත් නැහැ. ඒක නිසා අපට නැවත මුල ඉඳලා කල්පනා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ රටට ආදරය කරන මිනිස්සු, දේශපාලඥයෝ නොවෙයි. හොඳට මතක තියාගන්න. දේශපාලඥයා කල්පනා කරන්නේ ඊළඟ ඡන්දය දිනන්නේ කොහොමද කියලා. ඒකට කරන්නේ මොනවාද කියලා. ඒවා අපි පසුගිය කාලයේ දැක්කා.

එහෙම නම් උදාහරණයක් කියනවා නම් පසුගිය පළාත් පාලන මැතිවරණයේ මේ විධියට බල හුවමාරු වෙනවාද? දිනන්නේ කවුරුත්, පත් වෙන්නේ කවුරුත්. එතකොට මේක යට තිබෙන්නේ මොකක්ද? මේක යට තිබෙන්නේ මුදල්. අනෙක් එක බලය ගන්න තමන්ට ඕනෑ කරන විධියට මිනිස්සු පාවිච්චි කරනවා. මහජන මතය විකෘති කිරීමක්. ඒක නිසා අපට ජාතික ප්‍රතිපත්තියක් තිබෙන්නට ඕනෑ. ඒ ජාතික ප්‍රතිපත්තියෙන් කවුරු මේ රටේ ජනාධිපති වුණත්, කවුරු මේ රටේ අගමැති වුණත් මොන විධියේ පාර්ලිමේන්තුවක් තිබුණත් ඒ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න දිවි හිමියෙන් බැඳිලා ඉන්න ඕනෑ. එතකොට තමයි අපට පුළුවන්කම ලැබෙන්නේ රැකියා ප්‍රතිපත්තියක් ගියත් එහෙමයි. අද එක්සත් ජාතික පක්ෂයේ අපේ කණ්ඩායම තුළ තිබෙන විශාලම මැසිවිල්ල තමයි අපට රස්සාවල් දෙන්න බැහැයි කියන එක. යම් ප්‍රමාණයකට තරග විභාගවලින් මේ රටේ රාජ්‍ය අංශයට රැකියාවලට ගන්නවා. බැංකුවලට. රාජ්‍ය අංශයට. එතැනදී පක්ෂයක් විධියට ඇමැතිවරයාට හෝ රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් අයට කෙලින්ම ඇගිල්ල ගහන්න බැරි නිසා අපේ පක්ෂය ඇතුළත මැසිවිල්ලක් තිබෙනවා. මම කල්පනා කරනවා පුංචි තැන ඉඳලා ඒක දිගටම යනවා නම් හොඳයි. එතකොට මේකේ මිනිස්සු කඳවුරුවලට බැඳිලා ඉන්නේ නැහැ. අපි කැපුවත් කොළ. අපි කැපුවත් නිල්. එහෙම නැත්නම් අපේ

**[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා]**

තාත්තා තමයි වාමාංශික ක්‍රමය පටන් ගත්තේ. අපිත් යන්න ඕනෑ. එහෙම නැහැ. පසුගිය ජනාධිපතිවරණයේදී මේ රටේ මිනිස්සු ඒක පෙන්නුවා. කවුද වෙනස් කෙරුවේ? පරම්පරාගත ශ්‍රී ලංකාකාරයෝ තමන්ගේ ජනාධිපතිවරයාව වෙනස් කෙරුවාද? නැහැ. මේ රටේ අලුත් ඡන්ද, නව බලවේග තමයි මෙය වෙනස් කෙරුවේ. අලුත් අලුත් අදහස් එකතු වෙලා. මේ රටේ සාමය ඕනෑ කියන එක, මේ රටේ මිනිස්සුන්ට නිදහස ඕනෑ කියන එක - මොනවද නිදහස කියලා ඉල්ලුවේ? මේ රටේ මිනිස්සුන්ට කථා කිරීමේ නිදහස තිබුණා. මේ රටේ කථා කිරීමේ නිදහස වචනයට පමණයි සීමා වෙලා තිබුණේ. අපි දැක්කා සුදු වෑන් සංස්කෘතිය කොහොමද ක්‍රියාත්මක වුණේ කියලා. ඒවාට විරුද්ධව තමයි ජනවාරි 08 වැනිදා ඡන්දය දුන්නේ. හැබැයි ඒක යථාර්ථයක් බවට පත් කරගන්න අපි මේ අවුරුදු තුන ඇතුළත අපොහොසත් වෙලා තිබෙනවා.

මම හිතන්නේ, හොඳ කාලෝචිත යෝජනාවක්. මේක මේ සභාව ඇතුළේ න්‍යාය පුස්තකයාට දාලා අද කථා කෙරුවා. හෙට කොහේ හරි පත්තරයක යයි. එතැනින් එහාට මේ ගැන කටයුත්තක් නැහැ. ඒ වාගේ යෝජනා මේ සභාව ඇතුළේ ඕනෑතරම් තිබෙනවා. මට මතකයි නිමල් ලන්සා ඇමැතිතුමා ඉන්න වෙලාවේ මම යෝජනාවක් ගෙනාවා. එතුමාගේ අමාත්‍යාංශය හරහා අඩුම තරමේ මේ දිස්ත්‍රික්ක තුනේ ධීවර නිවාස ටිකක් ඉදි කරලා දෙන්න කියලා. ප්‍රතිපත්තියක් විධියට අපි යමු කියලා. ගිහිල්ලා බලන්න අපේ පළාත්වල ධීවරයෝ මොනතරම් කර්කෂ ජීවිතයක්ද ගත කරන්නේ කියලා. අපට කෑම ටික හොයන්න යන ධීවරායෝ. ඒ මිනිස්සුන්ට ඉන්න හරි තැනක් නැහැ. වැස්සොත් හේදෙනවා. තෙමෙනෙවා. අව්වට වේලෙනවා. මොනතරම් කර්කෂ ජීවිතයක්ද ගත කරන්නේ? ඡන්දය කාලයට ගිහිල්ලා දැළක් බෙදනවා. ඔරුවක් බෙදනවා. බෝට්ටුවක් බෙදනවා. තව මොනවා හරි දීලා ඡන්ද ටික කඩාගෙන එනවා. එතැනින් එහාට කථා කරන්නේ නැහැ. මෙන්න මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ කියන එක තමයි අපි හැමදාම කිව්වේ. ඒක නිසා මේ ගේන යෝජනාව මේ පළාත් සභාව ඇතුළත කරුණාකරලා සමාජගත කරන්න. ඒ ගැන මාධ්‍යයට ලොකු වගකීමක් තිබෙනවා. අර මන්ත්‍රීතුමිය කිව්වා වාගේ සමහර අවස්ථාවල මාධ්‍ය හැසිරෙන්නේ තමන්ගේ හිතවතුන්ට ඕනෑ ඕනෑ විධියට. අපි දැක්කා පසුගිය ඡන්දවලදීත් එහෙම තමයි. අපි මොනතරම් වැඩ කෙරුවත්, අපි මොනතරම් කථා කෙරුවත්, අපි පිළිබඳව වචනයක් මාධ්‍යවල යන්නේ නැහැ. හැබැයි තමන්ට හිතවත් අයගේ ඒවා, නිකන් හදිසියේ පුහු දේවල් කථා කළත් ඒවා යනවා. එහෙම තමයි සමාජගත වෙලා තිබෙන්නේ. ඒක නිසා මේ යෝජනාව හරහා මේ පළාත් සභාවට - මම ආයතනවල නම් කියන්න යන්නේ නැහැ. මේ යෝජනාව හරහා මේ පළාත් සභාවට කරන්න පුළුවන් නම් මේක සමාජගත කරලා, අඩුම ගණනේ මේ යෝජනාව හරහා අපට දෙන්න පුළුවන් උත්තේජනය මොකක්ද කියලා මධ්‍යම රජයටත් දැන ගන්න ක්‍රියාත්මක වෙනවා නම් මම හිතන්නේ අද රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව ඵලදායී යෝජනාවක් හැටියට අපට දකින්න පුළුවන්. එහෙම නම් ඒ පිළිබඳව වාසනාව, මේ රටේ දේශපාලඥයන්ට - ඊළඟ ඡන්දය ගැන හිතන, ඊළඟ මනාප ඡන්දය ගැන හිතන දේශපාලඥයන් ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. මේ රට දියුණු කරන්න ඕනෑ. අපේ ගම දියුණු කරන්න ඕනෑ. අපේ පළාත දියුණු කරන්න ඕනෑ. අපේ පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න ඕනෑ කියන චේතනාවෙන් කටයුතු කරන සදාචාර සම්පන්න දේශපාලඥයන් ගැන හිතලා මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න මේ සභාවට හැකි වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.14 ]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කාලීන වශයෙන් ඉතාම වැදගත් යෝජනාවක් මේ සභාවට ගෙනැල්ලා තිබෙන්නේ. නමුත් මම හිතන්නේ ඒ පිළිබඳව සභාවේ එතරම් උන්නදුවක් තිබෙනවා කියලා පේන්නේ නැහැ. සභාවේ සිටින මන්ත්‍රීවරුන් සහ සභිකයින් දෙස බැලුවාම. කොහොම නමුත් මේ යෝජනාව පිළිබඳව අදහස් පළ කරපු අපේ මන්ත්‍රීතුමන්ලා දෙපළගෙන්ම ප්‍රකාශ වුණු අදහස් බැලුවාම බොහෝ වෙලාවට අපේ රට පිළිබඳව, ඒ වාගේම අපේ රටේ අනාගතය පිළිබඳව විශාල මැසිවිල්ලක්, ඒ වාගේම අඥෝනාවක් සහ සර්ව අසුභවාදී විධියට කරුණු දැක්වීමක් තමයි කරන්නේ. එතකොට රටක් විධියට අපි ඉදිරියට යමින් තිබෙනවාද? එහෙම නැතත්ම් රට ආපස්සට යමින් තිබෙනවාද, රට විශාල පසුබෑමකට ලක් වෙමින් තිබෙනවාද කියන එක පිළිබඳව අපි මැදහත්ව සිතා බැලීමක් කරන්න

ඕනෑ. ඕනෑම රටක දේශපාලන අර්බුද තිබෙනවා. සමාජයීය අර්බුද තිබෙනවා. ආර්ථික අර්බුද තිබෙනවා. සංස්කෘතික අර්බුද තිබෙනවා. ඉතින් මේවායේ එකතුවක් විධියට තමයි ඒ සමාජයන් ඉස්සරහාට යන්නේ. ඒ හැල හැප්පීම් තිබෙනවා. ගැටුම් තිබෙනවා. ලෝකයේ මොන රටේද මේ විධියේ ගැටුම් නැත්තේ? අපි නිකන් පරමාදර්ශී රාජ්‍යයන් විධියට කථා කරන දියුණු සංවර්ධිත රාජ්‍යයන් විධියට කථා කරන යුරෝපය වේවා, ඇමරිකාවේ වේවා, අසල්වැසි ඉන්දියාවේ, බංගලාදේශයේ, පකිස්තානයේ, ඒ වාගේම මාලදිවයිනේ, මේ හැම රටකම ව්‍යවස්ථානුකූල අර්බුද තිබෙනවා. දේශපාලන අර්බුද තිබෙනවා. ඒ වාගේම සාමජයීය අර්බුද. ආර්ථික අර්බුද තිබෙනවා. ඉතින් ඒ අර්බුද මැදින් තමයි රටවල් ඉස්සරහාට යන්නේ. නමුත් මේ අර්බුදය අපට සිහිබුද්ධියෙන් යුතුව තේරුම් ගන්න බැරි නිසා විශාල ආරවුලක් රට තුළ තිබෙනවාය කියලා බොහෝ දෙනෙකුට පේන්න ගන්නවා. ඒ වාගේම විශාල විකෘති තත්ත්වයක් රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. රට අරාජිකත්වයට ගමන් කරමින් තිබෙනවා. රට කඩා වැටෙමින් තිබෙනවා. රටේ පාලනයක් නැහැ වාගේ පේන්න පටන් අරගෙන තිබෙනවා.

මම හිතන්නේ මේක ඇති වෙලා තිබෙන්නේ අපි තුළම ඇති වෙලා තිබෙන අපේක්ෂා භංගත්වය, ඉච්ඡාභංගත්වය සහ බලාපොරොත්තු සුන් වීම නිසා තමයි තම තමන් තුළ තිබෙන විශාල වේදනාවන් විවිධාකාරයෙන් ප්‍රකාශයට පත් වෙන්නේ. හැම කෙනෙකුටම ගැටළු තිබෙනවා. ඒ වාගේම තමන් තුළ තිබෙන දුක් වේදනාවන් තිබෙනවා. තමන් නිරත වෙලා ඉන්න ආයතනය තුළ වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මන්ත්‍රී ධූරයේ වෙන්න පුළුවන්. වෙනත් කටයුත්තක නිරත වෙලා ඉන්නවා නම් ඒ හැම කෙනෙකුටම යම්කිසි ගැටළු ප්‍රමාණයක් තිබෙනවා. ඉතින් ඒ ගැටළු ප්‍රමාණයත් එක්ක ඒවා විසඳා ගැනීම සඳහා අරගල කරනවා. ඉතින් මේක තමයි මානව සංහතියේ හැමදාම තිබුණු දේ. මානව ඉතිහාසය පුරාම මිනිස්සු අරගල කළා. ස්වභාව ධර්මයත් එක්ක අරගල කළා. සමාජයත් එක්ක අරගල කළා. පවුල ඇතුළේ අරගල කළා. රාජ්‍ය යාන්ත්‍රණය ඇතුළේ අරගල කළා. ඉතින් මේක තමයි සමාජයේ ඉස්සරහාට යෑම. ඒක නිසා මම නම් මේ පවතින තත්ත්වය සර්ව අසුභවාදීව දකින්නේ නැහැ. අද මේ රටේ මාධ්‍ය දේශපාලනයක් තිබෙනවා. මේ මාධ්‍ය දේශපාලනය ඇතුළේ රට තේරුම් ගන්න උත්සාහ කරන බොහෝ දෙනා හවසට ගිහිල්ලා ප්‍රවෘත්ති බලලා රට තේරුම් ගන්න උත්සාහ කරනවා නම් ඒක සම්පූර්ණයෙන්ම සත්‍ය නොවෙයි. ඒකේ එක්කෝ තිබෙන්නේ විකෘතියක්. එක්කෝ අර්ධ සත්‍යයක්. අතිශයෝක්ති. අලංකාරයෝක්ති තමයි තිබෙන්නේ. ඉතින් මේවා බැලුවාම -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා කියන්නේ මාධ්‍ය අසත්‍යයි කියලාද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

සම්පූර්ණයෙන් මම අසත්‍ය කියලා කියන්නෙත් නැහැ. බොහෝ වෙලාවට තිබෙන්නේ අර්ධ සත්‍යයන්. එතකොට අර්ධ සත්‍යයන් හවසට අපි ගිහිල්ලා රූපවාහිනී නාලිකා එහෙම නැත්නම් පෞද්ගලික නාලිකා - මේ හැම නාලිකාවකටම යම්කිසි න්‍යාය පත්‍රයක් තිබෙනවා. ඒ න්‍යාය පත්‍රයත් එක්ක තමයි ඔවුන් ප්‍රවෘත්ති පෙළ ගස්වන්නේ. ප්‍රවෘත්ති බැලුවාමට පස්සේ මම හිතන්නේ රෑට කාටවත් නින්ද යන්නේ නැහැ. රෑට හීන පේන්න පටන් ගන්නවා. සමහරු බය වෙනවා. සමහරු දෙතුන් පාරක් නැගිටලා Toilet එකට යනවා. මොකද හෙට එළි වනකොට මේ රට නැති වෙයිද? ඉන්දියන් සාගරයේ ගිලෙයිද? ඉතින් මේ වාගේ තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. මේක තමයි Media Politics. අද තිබෙන්නේ Media Politics වලට ගොදුරු වුණු සමාජයක්. Voice Cut දේශපාලනය නිසා දේශපාලඥයෝ කී දෙනෙක් සිවිදිවි නසා ගත්තාද? ඒ වාගේම මේ ආණ්ඩුව විශාල වශයෙන් අර්බුදයකට යන්නත් හේතු වුණා සම්මුතිවාදි ආණ්ඩුව ඇතුළේ මේ තිබෙන Voice Cut දේශපාලනය. ඒක නිසා වගකීම් විරහිතභාවය හේතු කොට ගෙන, තමන්ගේ කාර්ය භාරය මොකක්ද? තමන් යම් අදහසක් ප්‍රකාශ කරන කොට ඒකේ තිබෙන ගුණාත්මකභාවය. කරුණුවල තිබෙන වැදගත්කම නොසලකා හරිමින් අද මේ Media ඇතුළේ සම්පූර්ණයෙන්ම දේශපාලනය තීරණය වීම නිසා අපේ රටත්, සමාජයත් කිසියම් ආකාරයක අර්බුදයකට ගිහිල්ලා තිබෙනවා. කොහොම නමුත් අපි ඒ අර්බුදයෙන් මිදෙන්න ඕනෑ. දැන් මේ දිනවල අපි ඔක්කෝම වුයින්ගම් එකක් වාගේ උදේ ඉඳන් රෑ වෙනකල් සති ගණනාවක් තිස්සේ විශ්වාසභංගය හප හපා ඉන්නවා. දැන් හෙට රාත්‍රී 9.30 ට ඒ පිළිබඳ තීරණය අවසන් වුණාට පස්සේ කුමක් හෝ

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

තීරණයක්. ඊළඟ සතියේ තව එකක් අපට එනවා. ඊට පස්සේ අපි ඒකේ එල්ලෙනවා. ඒ නිසා රටක් විධියට අපට වැඩ පිළිවෙළක් එක්ක, න්‍යාය පත්‍රයක් එක්ක රට ඉස්සරහාට ගෙනියන්න බැහැ. නිරන්තරයෙන් මේ නිර්මාණය කරන මාධ්‍ය සංදර්ශන සහ මාධ්‍ය ඇතුළේ නිර්මාණය කරන මාතෘකාත් එක්ක රට විශාල ආරවුලකට, ඒ වාගේම විශාල විකෘති තත්ත්වයකට ගෙන යමින් තිබෙනවා. මේ දේවල් සිදු වන ආකාරය අරගෙන බැලුවාමත් මහ විකාරරූපී ස්වරූපයක් තිබෙනවා. ඉතින් ඒක නිසා අපි සියලු දෙනා ගොදුරු වෙලා තිබෙනවා කියන එක පැහැදිලියි. නමුත් මම හිතන්නේ අපි යම්කිසි ආකාරයකට පියවි සිහියට ඇවිල්ලා සිහි බුද්ධියෙන් යුතුව මේකේ - මොකද, කාල් මාක්ස් එක අවස්ථාවකදී කිව්වා මේ මතුපිටින් පේන දේ යථාර්ථය නම් මිනිස්සුන්ට විද්‍යාවක් අවශ්‍ය නැහැයි කියලා. ඒ වාගේම 1917 ඔක්තෝබර් විප්ලවයේ රතු හමුදාවට නායකත්වය දීපු ලියෝන් ට්‍රොක්සි කිව්වා මේ සිදුවන දේවල් කොක් හඬලා සිනහාසෙන්නවත්, එහෙම නැත්නම් හඬා වැළපෙන්නවත් නොවෙයි. මේ සියල්ල අපි යථාර්ථවාදීව තේරුම් ගැනීම සඳහා අවශ්‍ය විඥානය අප තුළ ගොඩ නඟා ගන්න ඕනෑ කියලා. ඒක නිසා මේ හැම දෙයක් ඉස්සරහාම මැසිවිලි නඟන එක, හඬා වැළපෙන එක අයියෝ අපේ රටේ ඉවර වෙන්න යන්නේ. අපේ සංස්කෘතිය ඉවරයි. අපේ සමාජය ඉවරයි. අපේ කෘෂිකර්මය කඩා වැටිලා. අධ්‍යාපනය කඩා වැටිලා. සෞඛ්‍ය කඩා වැටිලා. රටේ පරිපාලනය කඩා වැටිලා. ධීවර කර්මාන්තය කඩා වැටිලා. රටේ සංහිඳියාවක් නැහැ. ඉතින් මේ වාගේ නිරන්තරයෙන් අපේ සමාජය තුළ තිබෙන මැසිවිල්ලෙන් අපි මිදෙන්න ඕනෑ.

අපි බලන්න ඕනෑ සුභවාදීව මේ රට ඉස්සරහාට ගෙනියන්නේ කොහොමද කියන එක පිළිබඳව. මම නම් හිතන්නේ නැහැ අපේ රට ගොඩක් පස්සට ගිහිල්ලා කියලා. මේ රටේ ඒකාධිපති ආණ්ඩු බිහි වෙලා නැහැ. දැන් මේ අසල්වැසි රටවල් ගණනාවක්, ඉන්දියාවේ හැරුණු කොට, පකිස්තානයේ දීර්ඝ කාලයක් තිබුණේ මිලිටරි ආණ්ඩු. හමුදා ආණ්ඩු. ඒ වාගේම බංගලාදේශයේ තිබුණේ හමුදා ආණ්ඩු. නමුත් අපි නිදහසින් පස්සේ එක දිගට ප්‍රජාතන්ත්‍රවාදීව මේ රටේ පාලන ක්‍රමය පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. සාමකාමීව ආණ්ඩු මාරු කරලා තිබෙනවා. හමුදා කුමන්ත්‍රණ සිද්ධ වෙලා නැහැ. හමුදා පාලනයන් බිහි වෙලා නැහැ. ඒකාධිපති, අවුරුදු තිහ හතළිය රට පාලනය කරන ආණ්ඩු බිහි වෙලා නැහැ. සිම්බාබ්වේ වාගේ. එහෙම නැත්නම් අප්‍රිකානු මහද්වීපයේ තිබෙන රටවල් වාගේ. එවැනි තත්ත්වයකට අපි ගිහිල්ලා නැහැ. ප්‍රජාතන්ත්‍රවාදීව අපි අවුරුදු පහෙන් පහට හෝ හයෙන් හයට හෝ අවුරුදු දොළහෙන් රටේ පාලන තන්ත්‍රණය වෙනස් කරගෙන ගිහිල්ලා තිබෙනවා. විශ්වාසභංගය ඉදිරිපත් වෙලා තිබෙන්නේත් පවතින අපේ ව්‍යවස්ථාවට අනුකූල ක්‍රමවේදයක් ඇතිව. ඒකට මහජන මන්ත්‍රීවරු, මහජන නියෝජිතයෝ තමන්ගේ අභිමතය පරිදි ඔවුන්ගේ හෘදය සාක්ෂියට අනුව තීන්දු තීරණ ගන්න පුළුවන්. තමන්ගේ පක්ෂය ඇතුළේ තීන්දු තීරණ ගන්න පුළුවන්. ඉතින් ඒකේ කිසි වරදක් නැහැ. හෙට ඕනෑ නම් අලුත් අගමැතිවරයෙක් අලුතෙන් පත් වෙන්න පුළුවන්. අලුත් කැබිනට් එකක් පත් වෙන්න පුළුවන්. අලුත් ආණ්ඩුවක් එන්න පුළුවන්. ඒ ඕනෑම කෙනෙකුට ඉස්සරහාට යන්න ප්‍රජාතන්ත්‍රවාදය තමයි මෙතෙක් ලෝකය තුළ බිහි වෙලා තිබෙන හොඳම පාලන ක්‍රමය. ඒ පාලන ක්‍රමය ඇතුළේ අපි නිදහසින් පස්සේ අවුරුදු 60 ක් ඉස්සරහාට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා කාටවත් මහජන මතයට පිටුපාලා බලෙන් රැඳී සිටීමේ හැකියාවක් ලැබිලා නැහැ. ව්‍යවස්ථාවට මුවා වෙලා ඉන්න පුළුවන්කමකුත් නැහැ. ඒ නිසා මම මේ කරුණු ටික ඉදිරිපත් කළේ අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ අදහස ඉතාම වැදගත්. හැබැයි මම කියන්න ඕනෑ. මේ ඉන්දියන් සාගරයේ අපි සුවිශේෂ ස්ථානයක පිහිටා තිබෙන රටක්. උපාය මාර්ගික වශයෙන් ඉතාම වැදගත් තැනක අපි පිහිටලා තිබෙන්නේ. හැබැයි අපි අවුරුදු 2500 ක්, 3000 ක් තිස්සේ මේ රටේ ස්වෛරීත්වය, අනන්‍යතාවය ආරක්ෂා කරගෙන තිබෙනවා. මේ අසල්වැසි මහ භාරතය තිබෙනවා. අනෙක් පැත්තෙන් චීනය තිබෙනවා. ලෝකයේ බලගතු අධිරාජ්‍යවාදයන් බිහි වුණා. පෘතුග්‍රීසි ආවා. ලන්දේසි ආවා. ඉංග්‍රීසි ආවා. ඒ රටවල් අපව යටත් කර ගත්තා. හැබැයි අපි අපේ අනන්‍යතාවය තියාගෙන අපි රටක් විධියට ඉස්සරහාට ගිහිල්ලා තිබෙනවා.

ඒ වාගේම ඔය කියන විධියට අපි සම්පූර්ණයෙන්ම හුදෙකලා වුණු රාජ්‍යයකුත් නොවෙයි. අපි ඉතිහාසය අරගෙන බැලුවාම, අපේ වරායවල් හරහා අපි ජාත්‍යන්තරව වෙළඳ සබඳතා පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. මන්නාරම. මාන්තොට. ත්‍රිකුණාමලය. හම්බන්තොට.

ඒ වාගේම බේරුවල. මේ හරහා අපි ජාත්‍යන්තරව වශයෙන් වෙළඳ සම්බන්ධතා පවත්වාගෙන ගියපු රටක්. මේ විවෘත ආර්ථිකය ගැන කථා කරනවා. 1977 විවෘත ආර්ථිකය අපට හඳුන්වා දුන්නා කියලා. නැහැ. ලෝකයත් එක්ක අපි වෙළඳ සම්බන්ධතා පැවැත්වූවා. සේද මාවතේ නැව් ආවා. චීනයත් එක්ක, ඒ වාගේම ඉන්දියාවත් එක්ක, බුරුමයත් එක්ක මේ හැම රටක් එක්කම අපි වෙළඳ සම්බන්ධතා පවත්වා ගත්තා. මහ පරාක්‍රමබාහු රජතුමා බුරුමයට සහල් අපනයනය කළා. ඒ වාගේම මුතු මැණික්, ඇත් දළ, ඇතුන් පිටරටට සැපයුවා. ඒ නිසා මේක ජාත්‍යන්තරව වශයෙන් වෙළඳ කේන්ද්‍රස්ථානයක් විධියට තිබුණේ. ඉතින් මේක අමතක කරලා අපි සම්පූර්ණයෙන්ම හුදෙකලා, තනි රටක් විධියට තිබුණා කියලා පෙන්වන්න උත්සාහ කරනවා. මේ බාහිරින් ආපු ඒවා නිසා තමයි අපේ අනන්‍යතාවය - අපේ අනන්‍යතාවය අපි ඉතාම හොඳට ආරක්ෂා කරගත්තා. ඒ හැම එකක් එක්කම සන්තුෂ්ටිමය වශයෙන් මුසු වෙමින්. දෙමළ ජනතාව ආවා. මුස්ලිම් ජනතාව ආවා. පෘතුග්‍රීසි, ලන්දේසි, ඉංග්‍රීසි, මැලේ, බර්ගර් මේ හැම ජන කොටසක්ම අපේ සංස්කෘතියට ඇතුළට අපි එකතු කර ගත්තා. එකතු කර ගැනීම ඇතුලේ තමයි අපේ ජාතික සංස්කෘතිය පෝෂණය වුණේ. ඒ තුළින් තමයි අපි ඉස්සරහාට ගියේ. ඒ නිසා අපේ ජාතික සංස්කෘතිය අපි ආරක්ෂා කරගන්න ඕනෑ. නමුත් රෝස ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ මේ යෝජනාවේ ඉතා වැදගත් කාරණා කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. සංස්කෘතිය ගැන. *"ප්‍රතිපත්තියක් ඔස්සේ මෙරට ජාතික, ආගමික, සමාජීයීය බලමුළු එක්තැන් කර සංහිඳියාවකින් යුතුව එකම මඟක් ගෙන ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින්."*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දවස්වල කථා කරන දේවල් සම්බන්ධව එක පැත්තකින් අපුලක් දනවන දේවලුත් තිබෙනවා. මම කියන්නේ සමහර කරුණු අපි විද්‍යාත්මකව සාකච්ඡා කරන්න ඕනෑ. දැන් මේ දිනවල සාකච්ඡාවක් ඇති වෙලා තිබෙනවා සම රිසි අධ්‍යාපනය පිළිබඳව. මොකක්ද මේ සම රිසි අධ්‍යාපනය කියලා කියන්නේ. දැන් මේ සමලිංගික අයිතිවාසිකම් පිළිබඳව යුරෝපයේ විශාල සංවාදයක්, සාකච්ඡාවක් දශක ගණනාවක් තිස්සේ තිබෙනවා. සමලිංගික අයිතිය දෙන්න කියලා. සමලිංගික විවාහ අයිතිය නීතිගත කරන්න කියලා. ඒක යුරෝපයේ දශක ගණනාවක් තිස්සේ තිබුණු අරගලයක්. දැන් සමහර රටවල්වල මේ නීතිය නීතිගත කරලා තිබෙනවා. මේ අයිතිය නීතිගත කරලා තිබෙනවා. ආසන්න වශයෙන්ම ඕස්ට්‍රේලියාවේ ජනමත විචාරණයක් තියලා සමලිංගික අයිතිවාසිකම් නීතිගත කළා. සමලිංගික විවාහ නීතිගත කළා. දැන් මේ අදහස් අපේ රට තුළටත් ඇවිල්ලා තිබෙනවා. හැබැයි ඉතාම සුළු පිරිසක් අතරයි මේ සාකච්ඡාව, සංවාදය තිබෙන්නේ. ඒ අය දැන් මේක ජාතික ප්‍රතිපත්ති බවට පත් කරන්න උත්සාහ කරනවා. රටේ අධ්‍යාපන ක්‍රමය ඇතුළට, අපේ විෂයය මාලාව ඇතුළට මේවා ගේන්න හදනවා. ඒ සඳහා වැඩමුළු පවත්වනවා. විෂයය මාලාවට මේවා යෝජනා කරලා තිබෙනවා. අද මේවා පිළිබඳව විවෘත සාකච්ඡාවක් අවශ්‍යයි. මේ තුන් හාරදාහක් පමණ ඉන්න, මේ සමලිංගික අයිතිවාසිකම් පිළිබඳව කථා කරන, සම රිසි අයිතීන් පිළිබඳව කථා කරන, මේ සමලිංගික විවාහ නීතිගත කරන්න කියන අය ඉන්නේ ඉතාම සුළු පිරිසක්. දැන් මේවාට කැබිනට් පත්‍රිකා තිබෙනවා. දැන් පසුගිය දවසේ ඡන්දය අවස්ථාවේදී කාන්තාවන්ට මත්පැන් බීමේ අයිතිය වෙනුවෙන් කැබිනට් පත්‍රිකාවක් ගෙන ආවා. මේ මහ පොළොව අඳුරන්නේ නැති, මේ රටේ සංස්කෘතිය අඳුරන්නේ නැති, මේ රටේ සමාජ වටිනාකම්, Social Values දන්නේ නැති අය මේවා ගේනවා. අද ඒවාත් එක්ක රටේ ජාතික සංස්කෘතියයි, මේ ඉදිරිපත් කරන යෝජනායි අතර විශාල ගැටුමක් තිබෙනවා

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියනි. අද ඒවායි මේ ප්‍රතිවිරෝධතා විධියට මතු වෙලා තිබෙන්නේ. අපේ නායකයින්ට ජාතික දැක්මක් නැත්නම්, ජාතික සංස්කෘතිය පිළිබඳව හැඟීමක් නැත්නම්, අදහසක් නැත්නම් ඒ අය පාරේ ජාතික නායකයෝ නම්, රට ගැන, ජාතික ගැන, ආගම ගැන අපේ සමාජය, සංස්කෘතිය පිළිබඳව හැඟීමක්, දැනීමක් නැත්නම්, ඉතිහාසයේ අක්මුල් දන්නේ නැත්නම්, ඒ අක්මුල් ගැලවිලා නම් ඒ අය පාරේ ජාතික වෙලා නම් විජාතික මනසක් තිබෙන අය කොහොමද මේකේ ජාතික සැලසුම් හදන්නේ? මෙන්න මේකයි තිබෙන ප්‍රශ්නය. අඩුම වශයෙන් මේ අයට සිහි බුද්ධියක් නැහැයි කියලා හොඳටම තේරෙනවා. ඡන්දයක් ආසන්නයේ තියාගෙන ආණ්ඩුවේ මුදල් ඇමැතිතුමා කැබිනට් ප්‍රතිකාවක් දානවා කාන්තාවන්ට මත්පැන් බීමේ සම අයිතිය ලබා දෙන්න. ඊළඟට අවන්හල්වල සේවය කරන්න. අපි කොහොමත් දන්නවා කොළඹ ආශ්‍රිතව ඉහළ පැලැන්තියේ ඉන්න කාන්තාවෝ

**[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]**

සුළු පිරිසක් සමාජශාලාවලට යන අය ඉන්නවා. Night Club යන ඉන්නවා. මත්පැන් පානය කරන අය ඉන්නවා. හැබැයි මේ රටේ 99% ක් කාන්තාවෝ එහෙම නොවෙයි. හැබැයි මේ 1% වෙනුවෙන් රටේ ජාතික ප්‍රතිපත්තියක් හදන්න යනවා. ඒකට නීති සම්පාදනය කරන්න යනවා. ඉතින් මේවා කොහොමද රටේ මහජන මනසට බලපාන්නේ? මේවා ගැන තුට්ටුවක් හිතන්නේ නැති, තුට්ටුවකට මායිම් කරන්නේ නැති පිරිසක් එක්ක කොහොමද රටක් කරන්නේ? රටේ සංස්කෘතිය ඉස්සරහාට ගෙනියන්නේ කොහොමද? අද මම දැක්කා ඒකාබද්ධ විපක්ෂයේ නායකතුමන්ලා කියාගෙන යනවා මේ රටේ සමලිංගික අධ්‍යාපනය පාසල් විෂයය මාලාවට ඇතුල් කරන්න යනවා. විෂම ලිංගික අධ්‍යාපනය දෙන එක කරන්න ඕනෑ. එකේ කිසි වරදක් නැහැ. හැබැයි මේක කරනවාද, නැද්ද කියන එක පිළිබඳව සාකච්ඡාවක් අවශ්‍යයි ප්‍රතිපත්ති සම්පාදකයින් අතර. ඉතින් සත්තු සත්තු අතරවත්, පිරිමි පිරිමි සත්තු එකට ඉඳලා ප්‍රජනනයක් ඇති වෙන්නේ නැහැ නේ කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා.

ඒක නිසා මේවා බලන විට හැම රටකම තමන්ට අනන්‍ය වූ සංස්කෘතියක් තිබෙනවා. ඒ සංස්කෘතිය නොසලකා හැරලා, ඒ ජාතික සම්ප්‍රදාය නොසලකා හැරලා කටයුතු කරන්න ගියාම අනිවාර්යයෙන්ම රටක් ඉස්සරහාරට ගෙනියන්න බැහැ. මොන සම්මුතිය ඇති කර ගත්තත්. අද ජනාධිපතිතුමා අතරත්, අගමැතිතුමා අතරත් සමනය කළ නොහැකි ආකාරයේ ප්‍රතිවිරෝධයක් ගොඩ නැඟිලා තිබෙනවා නම් ඒ ප්‍රතිවිරෝධය පිටිපස්සේ තිබෙන ප්‍රතිපත්තිමය කරුණු සහ මතවාදීමය කරුණු තේරුම් ගන්න ඕනෑ. ඒක නිසා මේකේ නොගැළපීමක් තිබෙනවා කියන එක පැහැදිලියි. යා දෙක නොරඳ රත. ඒ නිසා, රටක් ඉස්සරහාට යන්න නම්. නායකයෝ සිතන පතන ආකාරයෙන් මෙන්න මේ ගැළපීම තිබෙන්න ඕනෑ. යුරෝපයේ ඔළුව තියාගෙන, කඳ බඩ එහේ තියාගෙන මේ රට ගෙනියන්න බැහැ. මේ මහ පොළොවේ අපේ ගහ කොළ, පරිසරය, සතා සිව්පාවා, මේ සුළඟ, ඇළ දොළ ගංගා, අපේ මිනිස්සුන්ගේ හදවත තේරුම් ගන්න ඕනෑ. එහෙම තේරුම් ගන්නේ නැතිව කොහොමද රටක් ඉස්සරහාට ගෙනියන්නේ. ඉතින් මෙන්න මේ කරුණු පිළිබඳව අපි සියලු දෙනාම කල්පනා කළොත් විතරයි රටක් විධියට අපට ඉස්සරහාට යන්න පුළුවන් වෙන්නේ. අපේ සෞඛ්‍ය ප්‍රතිපත්ති වේවා, අධ්‍යාපනය වේවා, සෑම ක්ෂේත්‍රයකම අපට ඉස්සරහාට යන්න පුළුවන් වෙන්නේ - මේ ඇති වෙලා තිබෙන දේශපාලන අර්බුදය පිටිපස්සේ තිබෙන දේශපාලන ප්‍රතිපත්ති, මතවාද සහ ඒ ඒ පක්ෂවල තිබෙන ඕනෑ එපාකම් සහ පුද්ගලයන්ගේ ඕනෑ එපාකම් අද කිසියම් විධියකට ගැටුම්කාරී තත්ත්වයක් දක්වා ගමන් කරලා තිබෙනවා. ඒ නිසා තමයි මේ මොහොතේ මේ දේශපාලන අර්බුදය නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒක නිසා ගැළපෙන පුද්ගලයෝ තමයි එක වැඩ පිළිවෙළකට, එක ප්‍රතිපත්තියකට ගොනු වෙන්න ඕනෑ. නොගැළපෙන අයත් එක්ක එක වැඩ පිළිවෙළක් ඉස්සරහාට ගෙනියන්න බැහැ. සම්මුතියක් ඇති කර ගන්නේ යම්කිසි න්‍යාය පත්‍රයක් ඇතුළේ එකට වැඩ කරන්න. ඒ න්‍යාය පත්‍රයෙන් එළියට පැනලා වැඩ කරනවා නම් තම තමන් ඉන්න ප්‍රදේශය තුළ හරි, තමන්ගේ පාසල හරි ඇතුළේ කණ්ඩායම් හදාගෙන, කල්ලි හදාගෙන, ගජමිතුරෝ හදාගෙන රට පාලනය කරන්න බැහැ. ගජමිතුරු කල්ලි හදාගෙන. ඒ නිසා මෙන්න මේ කාරණය අපේ රටේ අනාගතය සම්බන්ධයෙන් ඉතාම වැදගත්.

රටේ ජනතාවගේ ජන විඥාණය තේරුම් ගන්න ඕනෑ. මේ මහ පොළොව තේරුම් ගන්න ඕනෑ. ඒක අනුව අපේ අධ්‍යාපනයද, සෞඛ්‍යද, සංවර්ධනයද, දේශපාලනයද අනෙක් විදේශ ප්‍රතිපත්තිද මේ සියල්ල එක්ක අපි කල්පනා කරන්න ඕනෑ. එහෙම වුණොත් විතරයි අපට රටක් විධියට යන්න පුළුවන් වෙන්නේ. එහෙම නැත්නම් මේ ගැටුම දිගින් දිගටම ඉස්සරහාට යනවා. මේ රටේ ජාතික සංස්කෘතියට නොගැළපෙන දේවල් බලයහත්කාරයෙන් ඔබ්බන්න යනවා නම්, අනිවාර්යයෙන්ම ඒ අය දේශපාලනයෙන් ප්‍රතික්ෂේප වන එක හෝ ජනතාව ඒ අය කුණු කූඩයට ඇදලා දාන එක ඉතිහාසය පුරා කරලා තිබෙනවා. මම හිතන්නේ දැන් අපට උදා වෙලා තිබෙන්නේ එවැනි අවස්ථාවක්. හැබැයි එකෙන් අපි අදහස් කරන්නේ නැහැ, ආපහු මේ රට ප්‍රජාතන්ත්‍ර විරෝධී දූෂිතයන් අතට, අපරාධකාරයින් අතට, වංචනිකයින් අතට භාර දෙන්න ඕනෑ කියන එක. මේ රටේ අනාගතය ඉස්සරහාට ගෙනියන්න පුළුවන් අනාගතවාදී මිනිස්සු ටිකක් එක්ක, දැක්කමක් එක්ක, මේ මහ පොළොව සංස්කෘතිය අඳුන ගන්න මිනිස්සුත් එක්ක මේ රට නිර්මාණය කරන්න අධිෂ්ඨාන කර ගැනීමයි අවශ්‍ය වෙන්නේ. ඒ අර්ථයෙන් අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ මේ යෝජනාව ඉතාම වැදගත් සාකච්ඡාවක් සංවාදයක් කියන එක මම ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.35 ]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙන එන යෝජනාවේ, අපි විශ්වාස කරනවා මේ යෝජනාවේ වචන හරහා ගම්‍ය වන දෙයක් තිබෙනවා. එකක් තමයි අද අපි ජීවත් වන මේ සමාජය තුළ තිබෙන අසමත්කමක් ඒක නිසා අපි දකින ඛේදජනක තත්ත්වයත්, ඒකත් එක්ක අද පුද්ගලයෝ හැටියට අපි කාටවත් ඇති වුණු වේදනාවත් මේ යෝජනාව ඇතුළේ තිබෙනවා. ඒ නිසා මේකේ වචන ගොඩක් තිබුණාට විසිරිලා, විසුරුණු කමක් මේ යෝජනාව ඇතුළේ තිබුණාට මට හිතෙනවා වචන කිහිපයකින් මේ යෝජනාව ගෙන එන්න පුළුවන්. ඒ තමයි අපේ රට මේ මොහොත වනකොට ආර්ථික, දේශපාලන හා සමාජයීය පිරිහීමකට ලක් වෙලා තිබෙනවා. ඒක අපට දරාගන්න බැහැ. මොන දේශපාලන පක්ෂයේද, මොන දර්ශනයේද, මොන මතවාදයේද කියන එක අපි කාටවත් අදාළ නැහැ. පුද්ගලයෝ හැටියට අපි කල්පනා කරලා බැලුවාට පස්සේ අපි කාටවත් ඒ වේදනවා තිබෙනවා. ඒ නිසා ඒක තමයි මේ යෝජනාව ඇතුළේ පිළිබිඹු වෙන්නේ. එතකොට මේ යෝජනාවේ අවසානයට තිබෙන්නේ මේ ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධව අපි නැවත වරක් යෝජනා කරන්නේ රජය වෙතයි. මේකට මොකක් හරි කරන්න ඕනෑ කියලා. දැන් මේ අසමත් වුණු පාලන ක්‍රමයටම තමයි අපි නැවත වරක් ඒක යෝජනා කරන්නේ.

එක් පැත්තකින් බැලුවොත් එහෙම සමහර මන්ත්‍රීවරුන්ගෙන් මේක විග්‍රහ වුණා විවෘත ආර්ථිකයත් එක්ක තමයි මේක ඇති වුණේ කියලා. ඔව්. විවෘත ආර්ථිකයෙන් මේකේ මහ විශාල වැඩ කොටසක් විශේෂයෙන්ම අද අපි පත් වෙලා තිබෙන සමාජයීය පිරිහීමට වගකියන්න ඕනෑ. ඒ වාගේම ගත්තොත් සමහර විට 48 න් පස්සෙත් මේක මෙහෙම තමයි. ඒක නිසා අපට කියන්න පුළුවන් අවුරුදු 70 ක් මේකට වග කියන්න ඕනෑ. එතකොට මේ අවුරුදු 70 ම මේ රජය හැටියට කටයුතු කරලා තිබෙන මේ පාලන ක්‍රමය, මේ පාලන තන්ත්‍රය වග කියන්න ඕනෑ. ඒ නිසා ඒගොල්ලෝ පෙන්වා තිබෙනවා අවුරුදු 70 ක් තුළ තමන් කරපු කාර්ය භාරය ඇතුළේ තමන්ගේ පාලනයේ තිබුණු තමන්ගේ අසමත්කම ඇතුළේ තමයි මේ තත්ත්වයට අපි ගොදුරු වෙලා තිබෙන්නේ කියලා. නැවත වරක් අපි ඉල්ලා සිටිනවා, නැවත වරක් ඔයගොල්ලෝ මේකට මොනවා හරි කරන්න. ඔන්න ඕක තමයි මේකේ තිබෙන ප්‍රශ්නය. මේ යෝජනාවේ අපට තිබෙන ප්‍රශ්නය. අපි දන්නවා බර්ටෝල් බ්‍රෙෂ්ට් කියලා තිබෙනවා මේ තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ජනතාව වෙනස් කළ යුතුයි කියලා. බ්‍රෙෂ්ට් කියලා තිබෙනවා පාලකයින් වෙනස් කරන්න බැහැ. පාලකයින් වෙනස් කළ නොහැක. ඒ නිසා කවදාවත් මේ පාලකයින් මෙහෙම වෙනස් වෙන්නෙත් නැහැ. ඒ නිසා වෙනස් කරන්න තිබෙන්නේ පාලකයින් නොවෙයි, ජනතාව.

ඒ කියන්නේ මේ පවතින්නා වූ මෙවැනි පාලන තන්ත්‍රයන් හදන මිනිස්සු තමයි කොහොම හරි වෙනස් කරගෙන වෙන ක්‍රමයකට යාම සඳහා ජනතාව පෙළ ගැස්විය යුතු කාර්ය භාරයක් හැටියට තිබෙනවා. ඒ නිසා අපි බැලුවොත් ඇත්තටම අපේ පැත්තෙන් අපි උත්සාහ කළේ ඔන්න ඕකට. කොයි තරම් අමාරු වුණත් අපි සුභවාදීව හිතනවා ඒක කරන්න පුළුවන් කියලා. ඒ නිසා තමයි අපි අපේ පැත්තෙන් කටයුතු කරන්නේ. ඒ නිසා එක පැත්තකින් මේ තත්ත්වය හඳුන ගන්න - මේ ඇති වෙලා තිබෙන තත්ත්වය සම්බන්ධව එක කාරණයක් තමයි අපට මොකද වෙලා තිබෙන්නේ කියලා හඳුන ගන්න ඕනෑ. ඒක අපට තිබෙන ප්‍රධාන වගකීමක්. මේකෙන් ගැළවෙන්න ඇත්ත උවමනාවක් අපි කාටවත් මේ වේදනාව ඇතුළේ, ඇති වෙලා තිබෙන වේදනාකාරී තත්ත්වය ඇතුළේ අපට තිබෙනවා නම් එකක් තමයි අපි අවංකවම මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා හඳුන ගන්න ඕනෑ. ඒක ඒ විධියට අවංකවම හඳුන ගන්න බැහැ අපි කොටු වෙලා ඉන්න කොටුව ඇතුළේ ඉඳගෙන. අපි කොටු වෙලා ඉන්නේ, එක්සත් ජාතික පක්ෂය තිබෙන්නේ කොටුවේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තිබෙන්නේ කොටුවේ. අපි ඉන්නවා වාගේ. ඒ වාගේම සමසමාජ පක්ෂය කොටුවේ. ඒක ජනතා විමුක්ති පෙරමුණේ කොටුව කියලා කියන්නත් පුළුවන්. කෙනෙකුට විග්‍රහ කරන්න පුළුවන්. ඒ නිසා ඒ කොටුවලම ඉඳලා මේක අපි විග්‍රහ කරගන්න ගියොත් එහෙම, ටිකක් අපට මේ ප්‍රශ්නය දකින්න පුළුවන්. නමුත් ඉන් එහා ක්‍රියා මාර්ගයකට යන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා දැන් කාල් මාක්ස්. අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාත් යම් තැනකදී කාල් මාක්ස්ව ආදේශ කර ගත්තා. දැන් කාල් මාක්ස් කියලා කියන්නේ, මාක්ස්වාදී දර්ශනය බිහි වුණේ - මාක්ස් කරපු වැඩේ තමයි - මාක්ස්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

දැක්කා මේ තත්ත්වයන්. තිබුණු තත්ත්වයෙනුත් පොඩ්ඩක් ඉස්සරහාට ගිහිල්ලා මාක්ස් මේක දැක්කා. ඒ නිසා මාක්ස් කරපු වැඩේ තමයි ඒ දේත් එයා හරියට තේරුම් ගත්තා. ඒක හරියට තේරුම් ගත්තා කියලා කියන්නේ ආගමික ශාස්තෘවරයෙක් වාගේ එයාගේ ඔළුවේ මොකක් හරි මැව්නේ නැහැ. මොකක් හරි ක්‍රමයකට මැවුණු එකක් නොවෙයි. මාක්ස් කළේ අමුතු දෙයක් නොවෙයි. එයා කළේ එතෙක් පැවැති ඒ සමාජ ක්‍රමය සම්බන්ධව - අපි කියනවා, ඉස්සෙල්ලාම තිබුණු සමාජ ක්‍රමය - මිනිසා බිහි වීමේ ඉඳලා ප්‍රාථමික සාමූහික සමාජ ක්‍රමයක් තිබුණා. මාක්ස් ඒක දැක්කා. ප්‍රාථමික සාමූහික සමාජ ක්‍රමය එයා අධ්‍යයනය කළා. ඒක පැවතුණේ කොහොමද කියලා. ඊට පස්සේ තිබුණා වහල් හිමි වැඩවසම් සමාජ ක්‍රමයක්. ඒකත් එයා අධ්‍යයනය කළා. වහල් හිමි වැඩවසම් සමාජ ක්‍රමය කොහොමද ඉස්සරහාට ආවේ කියලා.

ඊට පස්සේ තමයි ධනේශ්වර ක්‍රමයට ආවේ. එතකොට ඒ කාලයේ ජර්මනියේ හිටපු ජර්මන් දර්ශනවාදීන් මේ සම්බන්ධව ඒගොල්ලෝ විසින් එක එක මත ඉදිරිපත් කරලා තිබුණා. පළමුවෙන්ම මාක්ස් කළේ, අන්න ඒ ජර්මන් දර්ශනවාදීන් ඇතුළු හෙගල් කියලා හිටියා, රාන් කියලා හිටියා. මාක්ස් ඉස්සෙල්ලාම මේගොල්ලෝ දැකපු දේවල් අධ්‍යයනය කරලා මාක්ස් දැක්කා සමහර ඒවා. ඒ ජර්මන් දර්ශනවාදීන් අතර හිටපු හෙගල් සමහර ඒවා දැකලා තිබුණේ ඔළුවෙන් හිටගෙන. ඒ කියන්නේ හරි පැත්ත නොවෙයි, අනෙක් පැත්ත දැකලා තිබුණේ. ඉතින් මාක්ස් කළේ ඒ හෙගල් ඔළුවෙන් හිටගෙන දැකපු දේ දෙපයින් හිටෙව්වා. ඒගොල්ලෝ කෙලින් හිට්ටෙව්වා. කකුල් දෙකෙන් හිට්ටෙව්වා. ඒක තමයි මාක්ස් ඉස්සෙල්ලාම කළේ. ඒ දැකලා තිබුණු එක වැරැදියි කියලා හරි දේ මේකයි කියලා හිට්ටෙව්වා. එසේ හිට්ටවලා මාක්ස්ටත් තිබුණා ඒක විස්තර කර කර ඉන්න. ලෝකයේ විස්තර කර කර ඉන්න. වෙන මොකුත් උත්තරයක් නැතිව. හැබැයි එයා මොකද කළේ, එයා කිව්වා මේක විස්තර කරලා විතරක් හරි යන්නේ නැහැ. එතැනින් එහාට යන්න ඕනෑ. මොකක්ද? ලෝකය වෙනස් කරන්න ඕනෑ. අන්න ඒ ලෝකය වෙනස් කිරීම උදෙසා තමයි මාක්ස්වාදය බිහි වුණේ. අද අපිත් කරන්න ඕනෑ දැන් අවුරුදු 70ක් මේක දැකලා තිබෙනවා. ඒ නිසා මේ අවුරුදු 70 සිද්ධ වුණේ මොකක්ද කියලා අපි විග්‍රහ කරගන්න ඕනෑ. කොහොමද මේක වුණේ? මේක වෙනස් කරගන්න පුළුවන් කොහොමද? අවංකව මේක විග්‍රහ කරගෙන අර මාක්ස් කිව්වා වාගේ ලෝකය වෙනස් කරන්න ඕනෑය කියලා ඇත්තට මේ ක්‍රමය වෙනස් කරන තැනකට අපි එන්න ඕනෑ. ඇත්ත උවමනාව තිබෙනවා. ඒ නිසා මේක රජයට යෝජනා කරලා වැඩක් නැහැ. ඇත්තටම අපට යෝජනා කරන්න තිබෙන්නේ, මේ රටේ සියලු ජනතාවට. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ කියන සියලු ජනතාවට කියන්න ඕනෑ. ඔයගොල්ලෝ ඔය ඉන්න කොටු වලින් එළියට ඇවිල්ලා-

**ගරු මන්ත්‍රීවරු**
**Hon. Members**

යහපාලනය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
**Hon. Lakshman Nipuna Arachchi**

ඇත්ත. යහපාලනය වෙන්න පුළුවන්. සමාජ සාධාරණත්වය වෙන්න පුළුවන්. ඒ සමාජ සාධාරණත්වය, යහපාලනය උදෙසා - යහපාලනය කිව්වාට පස්සේ ඇත්තටම දැන් යහපාලනය කියන වචනය කැත කරලා තිබෙන්නේ. ඒක ජරා කරලා තිබෙන්නේ. ඒක නිකන් පාවිච්චි කරන්න අපට වුණත් හිතෙන්නේ නැහැ. හැබැයි යහපාලනය කියලා කියන්නේ, හොඳ සංකල්පමය දෙයක්. මම හිතන්නේ යහපාලනයට වෙන වචනයක් හරි සොයාගෙන - දැන් මේක කැත කරලා තිබෙන නිසා යහපාලනයට වෙන වචනයක් හරි සොයාගෙන යහපාලනය සමාජ සාධාරණත්වය වෙනුවෙන් මේක තේරුම් අරගෙන සියලුදෙනා එක තැනකට ගොනු කරන්න ඕනෑ. එක තැනකට එකතු කරන්න ඕනෑ. ඒ නිසා ඒකේදී මේ රටේ සියලු බලවේගවලට ඒකට වගකීමක් තිබෙනවා. මේ රටේ විශ්ව විද්‍යාල ආචාර්ය වෙන්න පුළුවන්. රාජ්‍ය සේවකයන් වෙන්න පුළුවන්. ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන්. වෘත්තිකයන් වෙන්න පුළුවන්. කලාකරුවන් වෙන්න පුළුවන්. අපි මහජන නියෝජිතයන් වෙන්න පුළුවන්. මේ අපි හැමෝටම වගකීමක් තිබෙනවා. ඒ නිසා මට කියන්න තිබෙන්නේ, රෝස්, මෙහි වගකීමක් ඔබටත් ඇත. අපි හැමෝටම ඇත. ඒ විධියට තමයි අපට කියන්න තිබෙන්නේ. ඉතින් ඒක නිසා අන්න එතැනට ගෙන ඒම තමයි තිබෙන්නේ.

ඒ නිසා අපි දන්නවා. අද අපේ රටේ ජනතාව මුහුණදෙන ප්‍රශ්න තුළින් පැන නගින්නා වූ අර්බුද හතරක් තිබෙනවා. ඒ ගැන හරියට කිව්වොත් එහෙම උල්පති හතරකින් තමයි ප්‍රශ්න එන්නේ. මිනිස්සු මොන විධියකට මුහුණ දුන්නත් ඔන්න ඔය උල්පත් හතරින් එන ප්‍රශ්නවලට තමයි මිනිස්සු ගොදුරු වෙලා තිබෙන්නේ. ඒකට අපි කියනවා, චතුර්විධ උල්පත් කියලා. දර්ශනයේදී හඳුනාගෙන තිබෙනවා. එකක් තමයි, ආර්ථික අර්බුදයක් අපට තිබෙනවා. අපව වෙලා ගත්ත, අපට නැඟිටින්න බැරි, අපව හිර කරපු, මේ රට ණය කරලා, ණය උගුලක හිර කරලා අන්න එහෙම හිර කරපු ආර්ථික අර්බුදයක අපි වෙලිලා ඉන්නවා. පළමුවැනි ප්‍රශ්නය ඔන්න ඕක. ඒ ආර්ථික අර්බුදයට විසඳුම් මේ ධනේෂ්වර පාලකයින්ට නැහැ. ඔය ධනේෂ්වර පාලකයින් කිසිම කෙනෙකුට නැහැ. ඒ අයට කියලා වැඩක් නැත්තේ ඒකයි. ඊට පස්සේ අපේ රටේ තිබෙනවා, ජාතික ගැටලු කියලා එකක්. ඒක තමයි ඔය හිටපු ගමන් ඉස්මතු වෙන්නේ. දිගනින්, මහනුවරින්, අලුත්ගමින්, ගිංතොටින් ඔය හැම තැනින්ම එළියට එන්නේ ඒකයි.

දෙවැනි එක තමයි අන්න ඒ ජාතික ගැටලුව හරහා පැන නඟින්නා වූ අර්බුදය. ඕකටත් අපේ සමාජයක් හැටියට ගොදුරු වෙනවා. තුන්වැනි එක තමයි පාලක ධනේෂ්වර පන්තිය ඉන්නේ අර්බුදයක. දැන් තිබෙන්නේ ඕක නේ. ඔය කිව්වා වාගේ මේ දවස්වලම සාකච්ඡා වුණේ ඒක නේ. නේද? ඒ පාලක ධනේෂ්වර පන්තිය අර්බුදයක ඉන්නේ. ඔය ඔක්කොම එහෙමයි. අගමැතිත් ඉන්නේ අර්බුදයක. ජනාධිපතිත් ඉන්නේ අර්බුදයේ. හිටපු කට්ටිය ඉන්නෙත් අර්බුදයේ. ඒ ලොකු අර්බුදයක් තිබෙන්නේ. ඒ අර්බුදය කියලා කියන්නේ, ඇතුළට ගිහිල්ලා අපට අර්බුදය කොහොමද කියලා බලන්න පුළුවන් නම්, අපට කැබිනට් මණ්ඩලය ඇතුළට ගිහිල්ලා බලන්න පුළුවන් නම් පේනවා, තේරුම් ගන්න පුළුවන් මොකක්ද මේකේ තිබෙන අර්බුදය කියලා. ලොකු අර්බුදයක් මේකේ තිබෙන්නේ. දැන් හෙට ඒ අර්බුදයේ යම් ප්‍රමාණයකට තාවකාලිකව සමනය වෙනවා. හෙට රෑ 09.30, 10.00 වෙන කොට ඡන්දයෙන් පස්සේ. ඔය කවුරුවක්වත් හිතාගෙන ඉන්න දේවල් නොවෙයි, ඕකේ දැන් වෙන්නේ. අපට මතුපිටින් පෙනෙන්නේ නැහැ. අර කිව්වා වාගේ අපට මතුපිටින් පෙනෙන්නේ නැහැ. මේකේ ඇත්ත ඔය විශ්වාසයභංගය ගෙනාවේ කවුද කියලා පේන්නේ නැහැ. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට, ලංකා ඉතිහාසයේ තමන්ගේම කැබිනට් මණ්ඩලයේ ඉන්න අගමැතිට විරුද්ධව ජනාධිපති විශ්වාසභංගයක් ගෙනාවා. ඔය අපට තිරයෙන් පේන කට්ටිය ඇවිල්ලා අර විශ්වාසභංගය භාර දෙන කට්ටිය නොවෙයි, ඒකේ නිර්මාතෘවරයා. ජනාධිපති ගෙනාවේ. ජනාධිපතිගෙන් තමයි ගෙනැල්ලා විශ්වාසභංගය ලියලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් අපට පෙන්වන්න හදන්නේ මෙයාලා තමයි මේකේ නිර්මාතෘවරයා කියලා. සමහරෙකුව කථා නායකතුමාට විශ්වාසභංගය භාර දෙන්න අරගෙන ගිහිල්ලා තිබෙන්නේ, මරන්න ගෙනියන හරකෙක් අරන් යනවා වාගේ. කට්ටිය අත්සන් කරලා නැහැ. එහෙමයි අරගෙන ගිහිල්ලා තිබෙන්නේ. හැබැයි අපට පේන්නේ ඒකේ මොකක්ද? ඊට වඩා වෙනස් දෙයක් අපට පෙනෙන්න තිබෙන්නේ. ඒ නිසා හෙට බලාගන්න පුළුවන් මොකක්ද වෙන්නේ කියලා. ඒ නිසා හෙට ඕක තාවකාලිකව සමනය කරයි. ඊට පස්සේ අර කිව්වා වාගේ අපට අමතක වෙලා යනවා. හෙටින් පස්සේ වෙන මාතෘකාවක් උඩට එනවා. මේ මාධ්‍යයට දොස් කියලා වැඩක් නැහැ. මාධ්‍ය කියලා කියන්නේ, මෙන්න මේ අර්බුදයේම එක කොටසක්. ඔය සියලු මාධ්‍යවලට හැසිරෙන්න වෙලා තිබෙන්නේ වෙළඳ පොළත් එක්ක. ඒගොල්ලෝ මොකක්ද කරන්නේ? ඒගොල්ලෝ කරන්නේ ලාභය උදෙසා ව්‍යාපාරයක්. ඒගොල්ලෝ කරන්නේ ව්‍යාපාරයක්. මොන මොන නම්වලින් තිබුණත්, මොන මොන ආකාරයේ වැඩ සටහන්වල වෙනස්කම් තිබුණත්, කොහොම තිබුණත් අපේ රටේ මාධ්‍ය කියලා කියන්නේ වෙළඳ පොළත් එක්ක ඒ අය තීරණය වෙනවා. ඒ නිසා ඒ අය කටයුතු කරන්නේ වෙළඳ පොළත් එක්ක. ඒ අය, ඒ අයගේ රූපවාහිනී ප්‍රවෘත්ති හදන්නේ, ඒ Retains බලලා, ඒකෙන් ඒ අයට එන ලාභයත් එක්ක. ඒක කොයි තරම් බලනවාද කියන එකත් එක්ක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සිරසත් එහෙමද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමන්ලා අපට වැඩිය ඕවා හොඳට දන්නවා. ඒ නිසා මේකේ ලියන මාධ්‍යවේදීන්ට දොස් කිව්වත්, මාධ්‍යවල අයිතිකරුවන්ට කිව්වත් ඒකේ කිසි වැඩක් නැති එකක්. ඒ අයට ඕනෑ විධියට ඒ අය හැසිරෙනවා. ඒ අයට කවුරුවක්වත් කියන විධියට

**[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]**

හැසිරෙන්නේ නැහැ. ඒ අය හැසිරෙන්නේ වෙළඳපොළේ තත්ත්වයත් එක්ක. ඒ අය සොයා බලනවා, කොහොමද වැඩිපුර කොයි පැත්තෙන් ද අල්ලන්න ඕනෑ. ඒ නිසා ඒ පැත්තෙන් අල්ලනවා. එක උච්චාවචනය වන අවස්ථාවන් තිබෙනවා. ඒ නිසා ඒ අය අපව අත්හරින්නෙත් නැහැ. අර හෝටලයට පරිප්පු වාගේ තමයි අපිව. ඒ නිසා අනිවාර්යයෙන් අපිව ඒවට යොදා ගන්නවා. ඒ නිසා අපව අත්හරින්නෙත් නැහැ. අනික් අයව අත්හරින්නෙත් නැහැ. කවුරුවක්වත් ඒ අය අත්හරින්නේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ඔබතුමා කියන්නේ, මාධ්‍යවලට න්‍යාය පත්‍රයක් නැහැයි කියලාද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි මම කියන්නේ. ඒ අයට න්‍යාය පත්‍රයක් තිබෙනවා. ඒ අයිතිකරුවන්ට න්‍යාය පත්‍රයක් තිබෙනවා. ඒ න්‍යාය පත්‍රයක් තිබුණත් ඒක ඇතුළේම ඒ අය බලනවා, ඒ අයගේ ලාභ rate එක කොහොමද නැංවෙන්නේ. ඒ උච්චාවචනය වීම මත ඒ අය ඒවා තමන්ට ඕනෑ විදියට වෙනස් කර ගන්නවා. ඒ නිසා මම කියන්නේ ඒ අය වෙළඳාමත් එක්ක ඉන්නේ.

පාලක ධනේශ්වර පන්තිය තමයි තුන්වැනි එක. හතරවැනි එක තමයි. ඇත්තටම ඒකට අපි වගකියන්න ඕනෑ. මේකේ වෙනස් කළ යුතු කොටස හැටියට ඒ ව්‍යාපාරයේ නිරත වන පන්ති, ඒ ව්‍යාපාරයේ තිබෙන අර්බුදය. මොකද, මෙච්චර මේ ධනපති ක්‍රමය, ධනේශ්වර ක්‍රමය අර්බුදයට ගිහිල්ලත් ඒක වෙනස් කරගන්න තවමත් අපි සමත් වෙලා නැහැ. අපට තිබෙනවා, ස්වයං නීති රීති. අපි බලන්න ඕනෑ, ඇයි අපි සමත් වෙලා නැත්තේ කියලා? අපි බලන්න ඕනෑ, ජාතික මට්ටමේ අපේ වගකීම අපි ඉෂ්ට කරලා තිබෙනවාද? ජාතික මට්ටමේ කර්තව්‍යය අපි වෙනස් කරලා තිබෙනවාද? ජාතික මට්ටමේ අපි ඒක ගොඩනගාගෙන තිබෙනවාද? ඒවා අපි වෙනස් කරගෙන තිබෙනවාද? ඉතින් ඒවා වෙනස් කරගත්තාට අපි තවමත් අසමත් වෙලා තිබෙනවා. මේ රටේ ඔය මධ්‍යම පාන්තික කට්ටියටත් වඩා බොහොම දුක් විඳින, බොහොම අසරණව ජීවත්වන මිනිස්සු රැවටිල්ලට ලක් කරන්න මේ රටේ පාලක ධනේශ්වර පන්තිය තවමත් සමත්. අන්න එතැනින් වෙනස් කරගෙන, අන්න ඒ ජනතාව හරි තැනකට එකතු කරගන්න අපි තවමත් අසමත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව අපට ස්වයං විවේචනයක් තිබෙනවා. අපි උත්සාහ කරන්න ඕනෑ, ඒක කොහාමද කරන්නේ? අපි විශ්වාස කරනවා. ඒක කිරීම සඳහා තමයි මේකට තිබෙන්නා වූ බාධක එකින් එක, එකින් එක, එකින් එක අපි කොහොම හරි ඉවත් කරගන්න උත්සාහ කරන්නේ. ඒක තමයි එකක් හැටියට ඔය විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරගන්න ඕනෑ ඇත්ත උවමනාව අපට තිබෙන්නේ. ඕක එකක්. ඒ තිබෙන එක බාධකයක් ඉවත් කරගන්න තමයි අපි උත්සාහ කරන්නේ. ඒකට අර කාලය, දීපය, දේශය කියන එක ගැලපෙනවා වාගේ ඒක ගැලපිලා තිබෙනවා. මම මීට ඉස්සර මේ සභාවේම කියලා තිබෙනවා.

ඒ නිසා කාටත් උවමනාවක් ඇවිල්ලා තිබෙනවා, තමන්ගේ පැත්තෙන් බලාගත්තාට පස්සේ තිබෙන දේශපාලන උවමනාව මත ඒ අයට උවමනාවක් තිබෙනවා, දැන් ඔය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. ඒ නිසා ඔන්න ඕක වෙනස් කරගන්න අපි එක කාරණයක් හැටියට තිබෙනවා. එතැනින් ඉවර වෙන්නේ නැහැ. මැතිවරණ ක්‍රමය වෙනස් කරගන්න ඕනෑ. අන්න ඒ මැතිවරණ ක්‍රමයත් වෙනස් කරගෙන. ඒකට අපි පියවරක් තිබ්බා. ඒ පියවර තියපු එක හරි ගියා. හරි ගිහිල්ලා දැන් ඔය කථා වෙන්නේ සභා පිහිටුවීමේදී අරහේ මෙහේ ඇති වන තත්ත්වයන්. ඒක කාගෙවත් වරදක් නොවෙයි. ඒක අර කියපු ආකාරයේ පාලකයෝ වෙනස් කරන්න බැහැ. ඔය ඉන්න පාලකයෝ මොන පැත්තෙන් ආවත් ඕවායේ බලයට පත්වීම සඳහා ඕවායේ නියෝජිතයෝ ලෙස ඉන්න කට්ටිය, ඒ ගොල්ලෝ ගුණාත්මක නැහැ. නැත්නම් ඇත්තට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඡන්ද දීපු ඡන්ද දායකයෝ ඉන්නවා. ඡන්දය දීපු ක්‍රමයක් තිබෙනවා. ඡන්දය දීපු ක්‍රමයේ ජනතා කැමැත්ත ඒක නම්, ඒ ජනතා කැමැත්ත අනුව තමන් හැසිරෙන්න එපැයි. ඒ නිසා කලින් වාගේ තමන්ට ඒකාධිපති බලයක්, බහුතර බලයක් ඒ සභාවල ගන්න බැහැ. ඒ නිසා සමත් වෙන්න ඕනෑ, මහජන නියෝජිතයන් හැටියට, ඒ ජනතාව ඡන්දය පාවිච්චි කරලා තිබෙන විධියට කොහොමද ඒ ජනතාවගේ වැඩි අනුමැතිය දීලා තිබෙන විධියට සභාපති පත් කර ගත්තා. නියෝජ්‍ය සභාපති පත් කර ගත්තා. තමන්ගේ ආයතනය

පාලනය කළා. එච්චරයි කරන්න තිබෙන්නේ. ඒක මැතිවරණ ක්‍රමයට දොස් කියලා වැඩක් නැහැ. ඒක මැතිවරණ ක්‍රමයේ දොසක් නොවෙයි. ඒක තමයි වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, අර සමාජ සාධාරණත්වය සහ යහපාලනය වෙනුවෙන් මේ රටේ සියලු දෙනාට වගකීමක් තිබෙනවා. අන්න ඒ සියලු දෙනා ඒකාබද්ධ කරගත්තා වූ ගමනකට අපේ රට අරගෙන යන්න. අන්න ඒ හිඩැස අද සමාජය ඉස්සරහා තිබෙනවා. අන්න ඒක පිරවීම මම හිතන්නේ, කාටත් මේකේ කාර්යභාරයක් යෙදෙනවා. ඒක නිසා තමයි මම කිව්වේ, රෝස් ඔයාටත් මෙහි කොටසක්, වගකීමක් ඇත. ඔබට උවමනාව තිබෙන්නේ ඇත්තටම මේ බේදවාචකය දැකලා, ඇත්ත වේදනාවක් තිබෙනවා නම්, ඇත්තටම තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව වේදනාවක් තිබෙනවා නම් දැන් මේ අවුරුදු 70 ක් අසමත් වුණු මේ පාලන ක්‍රමයෙන්, ඕවායින් අයින් වෙලා එන්න නිවැරැදි තැනකට. හරි තැනකට එන්න. ඔබත් නීතිඥයෙක්. ඔබත් වෘත්තිකයෙක්. අර සියලුදෙනාට තිබෙන වෘත්තියේ තිබෙන වගකීම - අද අපේ රටේ විශාල කොටසක් එවැනි තැනකට අවංකවම ඇවිල්ලා තිබෙනවා. ඒ මිනිස්සුන්ට ස්තුති කරන්න ඕනෑ. අන්න ඒ තැන ශක්තිමත් කරන්න හෙට දිනයේ එකතු වෙන්නය කියන ආරාධනාව කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බොහොම ස්තුතියි. කිසිදු බාධාවකින් තොරව අද සභාවේ අදහස් ප්‍රකාශ වුණා. ඒ එක්කම මම මේ අවස්ථාවේදීම පොඩි නිවේදනයක් කරනවා.

*බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමා 2018.04.03 වන දින පළාත් සභාවේ දී ඉදිරිපත් කරන ලද අදහසක් අනුව, එළැඹෙන 2018 සිංහල - හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා වෙත බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් ක්‍රාෆ්ට් ලංකා අලෙවිසැල මගින් රුපියල් 30,000/- ක උපරිමයකට යටත්ව පහසු ගෙවීමේ ක්‍රමය යටතේ රෙදිපිළි ලබා දීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවට පළාත් සභාවේ ඒකමතිකව අනුමැතිය ලැබී තිබෙනවා.*

*ඒ අනුව බස්නාහිර පළාත් සභාවේ ගරු සභාපතිතුමා ඉහත කාරණය සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර, එහිදී ප්‍රධාන ලේකම්වරයාගේ අනුමැතිය පරිදි බස්නාහිර පළාත් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා වෙත රුපියල් 30,000/- ක උපරිමයකට යටත්ව සමාන වාරික 06 කින් ගරු මන්ත්‍රීතුමන්ලාගේ වැටුපෙන් අය කර ගැනීමේ එකඟතාවය මත ක්‍රාෆ්ට් ලංකා අලෙවිසැල මගින් රෙදිපිළි නිකුත් කිරීමට තීරණය කර ඇත. ඒ සඳහා ඇපකරුවන් කිසිවෙකු අවශ්‍ය නොවන අතර බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් ක්‍රාෆ්ට් ලංකා අලෙවි සැලකින් එහි පවත්නා ලේඛනයේ සටහන් කොට අදාළ රෙදිපිළි ලබා ගැනීමේ හැකියාව ඇති බව කාරුණිකව දන්වමි.*

*ඩී.එම්.එන්.චන්ද්‍රාදිත්‍ය*
*කර්මාන්ත අධ්‍යක්ෂ,*
*බස්නාහිර පළාත.*

මීළඟට ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.57 ]

**கௌரவ எம்.எஸ்.எம். ரஹீம்**
Hon. M.S.M. Raheem

நன்றி பிரதித் தவிசாளர் அவர்களே, என்னுடைய பேச்சை இன்று நான் தமிழில் கதைக்கவுள்ளேன். ஏனென்றால் என்னுடைய பேச்சை மக்களுக்கு தெளிவூட்ட வேண்டிய கடமை எனக்கு இருக்கின்றது. இன்று மாகாண சபைக்கு தனிப்பட்ட உறுப்பினர்களின் நடவடிக்கையின் கீழ் ரோஸ் பிரணாந்து உறுப்பினர் அவர்கள் முன்வைத்த யோசனைக்கு மிகவும் நன்றி. இன்றுபல உறுப்பினர்கள் இந் நாட்டின் முன்னேற்றத்திற்காக இச் சபையில் பல நல்ல கருத்துக்களை தெரிவித்தார்கள். இந் நாட்டை ஆட்சி செய்பவர்கள்,இந் நாட்டில் உள்ளவர்களுடைய அதிகாரத்தைக் கொண்டு ஆட்சி செய்பவர்களா? இல்லையென்றால் வெளிநாட்டு சக்திகளின் அதிகாரத்துக்கு கீழா இவ் ஆட்சியை கொண்டு செல்கின்றார்கள்.ஏனென்றால் இந் நாட்டில் பல நாட்களாக, பல வருடங்கலாக இனவாதம் தொடர்ந்தும் நடந்து கொண்டு வருகின்றன. இவ் இனவாதம் எங்கிருந்து தோன்றியது, யாரால் நடைமுறைப்படுத்தப்படுகின்றது என்பதனை நாம் சிந்திக்க வேண்டும். பௌத்தர்களுக்கும் முஸ்லிம்களுக்கு இடையில் ஏற்பட்டுள்ள இவ் இனவாதமானது, பௌத்தர்களினுடைய பிரச்சினையும்

**[கௌரவ எம்.எஸ்.எம். ரஹீம்]**

இல்லை, முஸ்லிம்களினுடைய பிரச்சினையும் இல்லை. இதில் நான் காண்பது என்னவென்றால்இந் நாட்டில் சில பிரதேசங்களில் பணத்திற்காக அடிமைப்பட்டுக் கொண்டிருக்கும் சில கும்பல்களினால் செய்யப்படும் ஒரு சதியே ஆகும். சென்ற மூன்று நாட்களுக்கு முந்தைய தினங்களிலும் அத்தனகல்ல பிரதேசத்தில், மல்வத்தை பாதையில் ஒரு கடையை எறித்து விட்டார்கள்.இக் கடை எறிப்பின் பரிசோதனை அறிக்கையில் மின்சாரகசிவினால் ஏற்பட்ட அனர்த்தம் என அறிக்கை வெளியிடப்பட்டுள்ளனர். ஆனால் நான் அதனை நேரில் சென்று பார்வையிட்டேன். அக் கடையின் பின் புறத்தால் உடைத்து, அதில் உள்ள வியாபாரப் பொருட்களை கொள்ளையடித்துவிட்டு,மீதிப் பொருட்களை தீயிட்டு எறித்துள்ளார்கள். இவ்வாரான செயல்களை இவ் அரசாங்கம் கண்கூடாக பார்த்துக் கொண்டுதான் இருக்கின்றார்கள். இவ் அரசாங்கத்துக்கு இது ஒரு பாரிய பிரச்சினை அல்ல. இந் நாட்டில் சுதந்திரம் கிடைத்த காலம் தொட்டு முஸ்லிம் சமூகம், சிங்கள பௌத்த சமூகத்தோடு மிகவும் நெறுங்கிய உறவினை வைத்திருந்தார்கள். இன்று இவ்வாறான இனப் பிரச்சினைகளை நடாத்திச் செல்வதற்காக சில வெளிநாட்டுச் சக்திகள் ஒத்துழைப்பு வழங்குகின்றன. இவ்வாறான பிரச்சினைகளின் போது இந் நாட்டு ஜனாதிபதி, பிரதமர் மற்றும் அமைச்சர்கள் சரியான நடவடிக்கைகளை எடுக்காமல் மௌனம் சாதிப்பது ஏன் என்பதும் சந்தேகத்திற்குரிய விடயமாகும். ஏனென்றால் இந் நாட்டில் இது போன்ற பிரச்சினைகள் வராமல் இருப்பதற்காக அவர்கள் முன்னின்று செயற்பட வேண்டும்.

இந் நாட்டில் பொருளாதார பிரச்சினை ஏற்படும் போது அது இந் நாட்டில் உள்ள எல்லா மக்களுக்கும் வரக்கூடிய ஒரு பிரச்சினையேயாகும். முஸ்லிம் சமூகத்தின் கடைகளை எறித்து, வீடுகளை எறித்த பின் அரசாங்கத்தினால்வழங்கப்படும் ஒரு இலட்சம்,இரண்டு இலட்சங்களினால் அவர்களின் பிரச்சினை தீரப்போவதில்லை. வெள்ளை உடை அணிந்திருக்கின்றோம் ஆனால் உள்ளங்கள் வெள்ளையில்லை. நாம் எப் பதவியில் இருந்தாலும், அரசியல்வாதிகளாக இருந்தாலும் எமது உள்ளம் தூய்மையாக இருக்க வேண்டும். யாரைக் கண்டாலும் நாம் மதித்து நடக்கக் கூடிய மனிதர்களாக உருவாக வேண்டும். எனது குடும்பம் மாத்திரம் நன்றாக வாழ்ந்தால் போதும், மற்றவர்களுக்கு எவ்விதத்திலும் அனியாயங்கள் நடந்தாலும் பிரச்சினை இல்லை. என்று வாழக் கூடிய மனிதர்களும் இந் நாட்டில் இருக்கின்றார்கள்.

பௌத்த நாடான இந் நாட்டில் மதுபானம் அருந்துவதற்கு அனுமதிக்கப்பட்டிருந்தாலும் கூட, நாம் இன்று பார்க்கின்றோம் மதுபானத்தை அருந்தி விட்டு பாதையில் வானகனங்களை செலுத்துவதனால், அன்று யுத்தகால இரப்பு வீ தத்தை விட இன்று வாகன விபத்தினால் ஏற்படும் இரப்பு வீ தம் அதிகமாக இருக்கின்றனஇம் மதுபான உற்பத்தியாளர்கள் அவர்களுடைய மதுபானம் விற்பனையாக வேண்டும் என்பதனால் மதுபானத்திற்கு நிறையவே முக்கியத்துவம் கொடுக்கிறார்கள். இன்று ஒருவர் மரணித்தால் அவ் வீ ட்டில் மதுபானம் இருக்க வேண்டும் திருமண வீ ட்டில் பெயர்சூட்டு விழாவில்இவ்வாறான வைபவங்களில் மதுபானத்தை வைக்காவிட்டால் அது அக் குடும்பத்திற்கு அகௌரவமாகவே பார்க்கப்படுகின்றன. இந் நாட்டு மக்களின் இவ்வாறான நிலைமை பற்றி நாம் சற்று சிந்திக்க வேண்டும்.இதை போன்றுதான் நாம் மற்ற மற்ற விடயங்களிலும் சிந்தித்து செயல்படவேண்டும். அதேபோல் இந் நாட்டை கட்டியெலுப்பக் கூடிய சந்தர்ப்பம் எமக்கு இருக்கின்றது ஆனாலும் வெளிநாட்டு சக்திகள் இந் நாட்டினுல் நுழைந்து மக்களுக்கிடையே,அரசியல்வாதிகளுக்கிடையே பேதங்களை உருவாக்கியுள்ளது. இந் நாட்டிற்குள் அவர்களுக்கு தேவையானவர்களை ஆட்சியில் அமர்த்தி, அவர்களுடைய தேவைகளைப் பூர்த்தி செய்வதற்காக ஆட்சியாளர்களை மாற்றுவதும் ஆட்சியாளர்களை அகற்றுவதுமாக இருந்து கொண்டிருக்கின்றன.

இன்று முஸ்லிம் சமுதாயம் கிட்டத்தட்ட ஆறு, ஏழு வருடகாலமாக சில குழுக்களால் விரட்டி விரட்டி அடிக்கப்படுகிறார்கள். இவ்வாறான செயல்களை நிறுத்தக் கூடிய பொறுப்பு அரசாங்கத்திற்கு இருக்கின்றது. அது மாத்திரமல்ல இன்று 55% பெண்கள் வாழக் கூடிய இந் நாட்டில், பெண்களின் தேவைகளை இணங்கண்டு அதனைப் பூர்தி செய்து கொடுப்பது மிகவும் குறைவாகவே காணபடுகின்றன. இந் நாட்டிற்காக யுத்தம் செய்து மரணித்த இராணுவ வீ ரர்களின் மனைவிமார்களுக்கு ஓய்வூதியப் பணம் சரியான முறையில் கிடைத்தாலும் கூட, அவர்களுக்கு மறு திருமணம் செய்வதற்கு சட்டம் இடம் கொடுப்பதில்லை. மறு திருமணத்தின் போது அவ் ஓய்வூதியம் நிறுத்தப்படுகின்றன. இச் சட்டத்தைப் பற்றி நாம் கதைக்க வேண்டும்.இதனைத் திருத்த வேண்டும்.இன்னும் இந் நாட்டிற்காக வெளிநாட்டில் சென்று தொழில் புரியும் பெண்களின் தேவைகளைப் பற்றியும் சரியாக கவனிப்பதில்லை. அவர்களை கவனிக்க வேண்டியது எமது முக்கியமான ஒரு பொறுப்பாகும்.

அரச நியமனங்கள் வழங்குவது இவ் அரசாங்கத்தில் குறைவாக காணப்பட்டாலும்,இருக்கின்ற அரச உதியோகத்தர்களிடமிருந்து சரியான முறையில் வேலைகளை பெற்றெடுக்கின்றோமா? அரச உத்தியோகத்தர்கள் வேலை செய்யாமல் பணம் சம்பாதிக்கிறார்கள் என்று மக்கள் மத்தியில் கருத்து நிலவுகின்றன. அவர்களின் மூலம் இந்நாட்டிற்கு தேவையான சேவைகளைப் பெறுவதற்கு நாம் ஏற்பாடு செய்ய வேண்டும்.

எமது நாட்டில் பல உற்பத்தியாளர்கள் இருக்கின்றார்கள். நானும் ஒரு உற்பத்தியாளராக இருந்திருக்கின்றேன். இன்று உற்பத்தியாளர்களுக்கு சரியான முறையில் வாய்ப்புக்களை கொடுப்பதில்லை. உற்பத்தியாளர்களின் உற்பத்திகளை தொலைக்காட்சிகளின் மூலம் விளம்பரப் படுத்தி அவர்களை ஊக்குவிக்க வேண்டும். அவ் ஊக்குவிப்பினூடாக இந் நாட்டில் உற்பத்தியாளர்களை அதிகரித்துக் கொண்டு நாட்டை அபிவிருத்தியடைய முடியும்

ரோஸ் பிரணாந்து அவர்களிடம் நான் கேட்டுக்கொள்வது என்னவென்றால் நல்ல முறையில், உளத்தூய்மையுடன் நாம் அனைவரும் ஒன்றினைந்து நேர்மையுடன் இந் நாட்டு மக்களுக்குசேவைகளை செய்ய வேண்டும் என்று கூறிக் கொண்டு இவ் யோசனையை முன்வைத்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொண்டு, මෙම යෝජනාවට ස්තුතිය එල කරමින්, මේ ඉදිරියට අපේ කටයුත්ත හොඳාකාරයට - මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉන්නවා. ඒ 104 දෙනා එකතුවී මේ රටට යහපත්, බස්නාහිර පළාතේ ජනතාවට හොඳ වැඩපිළිවෙළක් කිරීමට සෑම දෙනාම එක්රැස්වී කටයුතු කරමුයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තුතියි. මීළඟට ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට මම මූලාසනයට ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඊළඟට අපේ -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මෙතුමා ස්වාධීනව කටයුතු කරන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එදත් ස්වාධීනව කටයුතු කළේ. නීතියට අනුව. මීළඟට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 12.10 ]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ගෙනෙන ලද යෝජනාව දිහා බැලුවාම - මේක එක අතකින් සඳහන් කළා අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත්. මේකේ අදහස් ගණනාවක් තිබෙනවා. මෙහි කරුණු ගොඩාක්, මාන ගණනාවක් එතුමිය කියන්න උත්සාහ කරනවා. නමුත් මේ අවසාන අර්ථය දිහා බැලුවාම මේකේ පෙනෙන දේ තමයි ගරු මන්ත්‍රීතුමනි, අපි මේ දේශපාලනය කියලා මොකක්ද කරන්නේ කියලා තේරුම් ගන්න අවශ්‍ය වචන සියල්ල මේකේ තිබෙනවා. අවාසනාවකට අපි මේක මනාව පෙළගස්සගෙන, මනාව තේරුම් අරගෙන රට කොහෙටද යන්න ඕනෑය කියන තැනට ඒ කාරණා යොදාගෙන නැහැයි, තේරුම් අරගෙන නැහැයි, විග්‍රහ කරගෙන නැහැයි, ඊට අර්ථයක් දීලා නැහැයි කියන එක තමයි තේරෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාධ්‍ය ගැන කථා කරන වෙලාවේ අවාසනාවකට අපේ නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉවත්ව ගිහිල්ලා. එතුමා ඉන්නවාද? එතුමා සීට් එකේ නැහැ. සමාවෙන්න. ඔබතුමා කථා කරන කොට කිව්වා, මාධ්‍යයේ සත්‍යය නැහැයි කියලා. මට ඒක ගැන වචනයක් කියන්න ඕනෑ වුණා. ඇත්තටම මම එහෙම කිව්වේ ඇයි? එහෙම කිව්වේ, අද මාධ්‍යය දිහා බැලුවාම ගරු මන්ත්‍රීතුමනි, අද මාධ්‍ය ඇතුළේ මේ සමාජ යථාර්ථයේ සැබෑ පිළිබිඹුව නැහැ. ඒ අර්ථයෙන් තමයි මම කිව්වේ, මේ මාධ්‍යයේ ඇත්ත නැහැයි කියලා.

**[ගරු සුසිල් කිඳෙල්පිටිය]**

සැබෑ පිළිබිඹුව මාධ්‍යය ඇතුළෙන් අපට එළියට එන්නේ නැහැ. ඒ වාගේම අද තිබෙන්නේ, මේ පවතින මේ සමාජ අර්බුදයේ මිත්‍යාදෘෂ්ටික විග්‍රහයක්. ඒකයි අද මාධ්‍යයට වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ඉන්නේ පසුගාමී අසංවර්ධිත මාධ්‍යය සංස්කෘතියක් ඇතුළේ. අපි නූතන මාධ්‍යයේ නව මාන සොයාගෙන ගිහිල්ලා නැහැ. අපි ඊට මෙහා තැනක හිර වෙලා ඉන්නේ. මේක තමයි යථාර්ථය. අපි තේරුම් ගන්න ඕනෑ දේ තමයි රාජ්‍ය මාධ්‍යය පවතින රජයට යටයි. පෞද්ගලික මාධ්‍යය හිමිකාරීත්වයට යටයි. මේ හිමිකාරීත්වය ඇතුළේ තිබෙන්නේ අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ආර්ථික අරමුණක් තමයි. ඒකෙන් බැහැර වෙන්න බැහැ. මොකද අසන්නා සහ නරඹන්නා විද්‍යුත් මාධ්‍යයට විශේෂයෙන්ම අවසානයේදී ව්‍යවසායික කොටස්කාරයෙක් විතරයි. Take holder කෙනෙක් විතරයි. ඔහුට පෙනෙන්නේ ව්‍යවසාය කොටස්කාරයෙක්. පෙරලා ඔහු බලන්නේ ඔහුගේ ලාභය උපයා ගැනීම. හැබැයි, කිසියම් මාධ්‍යයකට, මාධ්‍ය හිමිකාරීත්වයට අවශ්‍ය නම් එතැනින් එහා දේශපාලන න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කරන්න, එක්කෝ ඒක සැබෑ ජනතා අරමුණ වෙනුවෙන් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් වෙනත් ආර්ථික අරමුණක් වෙන්න පුළුවන්. එතැනින් එහා දෙයක් වෙන්න බැහැ. ඒ නිසා සමහර වෙලාවට මාධ්‍යය තුළ දේශපාලනය අපට දකින්න ලැබෙන්නේ. සමහර වෙලාවට තමන්ගේ දේශපාලන අරමුණු සැබෑ ලෙසම ජනතා දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න වෙන්න පුළුවන්. එහෙම නැත්නම් තෘප්ත නොවුණු තමන්ගේ ආර්ථික අරමුණු සඳහා කරන උත්සාහයක් වෙන්න පුළුවන්. මේක තමයි සැබෑ විග්‍රහය. ඒ නිසා අපි ඉන්නේ අද කොහෙදෝ තැනක අතරමං වෙලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මම කියන්න කැමැතියි. දැන් සංවර්ධනයේ වැදගත්ම අංගය මොකක්ද? අංගයන් ගණනාවක් තිබෙනවා. වැදගත්ම දේ තමයි ජනතාව ආකල්පමය වශයෙන් පොහොසත් කිරීම. ඒ වාගේම නීතිගරුක කිරීම. දැන් අපට මොකද වෙලා තිබෙන්නේ? ඇයි අපි මේ දිළිඳු භාවය පතුලටම ගිලිලා ඉන්නේ? දැන් උදාහරණයක් බලන්න. ස්විස්ටර්ලන්තය කියන රට. ස්විස්ටර්ලන්තය කියන්නේ, ලෝකයේ 19 වැනි විශාලතම ආර්ථිකය. මෙපමණ විශාල ආර්ථිකයක් දරන ස්විස්ටර්ලන්තයේ සමහරවිට හිතන්න පුළුවන් අපේ රටට වඩා විශාලයි කියලා. වර්ග කිලෝ මීටර් 41,000 යි. කෙනෙකුට හිතන්න පුළුවන් අපට වැඩිය ස්විස්ටර්ලන්තයේ ජනගහනය ඇතියි කියලා. ස්විස්ටර්ලන්තයේ ඉන්නේ ලක්ෂ 79 යි. එහෙමනම් හිතන්න පුළුවන්. ඒ එකක්වත් නොවෙයි. ස්වාභාවික සම්පත් ඇති කියලා. දියමන්ති ඇති. රත්තරං ඇති. ස්විස්ටර්ලන්තයේ ඒත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම සරල ආදායම් මාර්ග ටිකක් තිබෙන්නේ. මොනවද? ඖෂධ. රසායනික ද්‍රව්‍යය. සංචාරක ව්‍යාපාරය. ඒ වාගේම පෙන්ගුවා මූල්‍ය කටයුතු ව්‍යාපාරය. මේවා තමයි ස්විස්ටර්ලන්තයේ ප්‍රධාන ආදායම් මාර්ග. හැබැයි, ලෝකයේ 19 වැනි විශාලතම ආර්ථිකය. අපට ස්විස්ටර්ලන්තයට වැඩිය භූමිය තිබෙනවා. අපට ස්විස්ටර්ලන්තයට වැඩිය මානව සම්පත තිබෙනවා. අපට ස්විස්ටර්ලන්තයට වැඩිය ස්වාභාවික සම්පත් තිබෙනවා. හැබැයි, අපි කොහේද ඉන්නේ? ඇයි අපි එතැන ඉන්නේ? ඇයි අපි මෙච්චර පසුගාමී? අපි මොකක්ද කරලා තිබෙන්නේ? පාලකයා කරන්න ඕනෑ වැඩේ අපෙ රටේ පාලකයා කරලා නැහැ. මොකක්ද? ජනතාව ආකල්පමය වශයෙන් පොහොසත් කරන වැඩේ අපි කරලා නැහැ. ස්විස්ටර්ලන්තය එතැනට යන්නේ කොහොමද? මෙහි පාලන යාන්ත්‍රණයක් තිබෙනවා. ඒ යාන්ත්‍රණය ඉතාම මනාව සකස් වුණු නීති පද්ධතියක් විසින් හසුරුවනු ලබනවා. නීතිය ක්‍රියාත්මක වන බවට පාලකයෝ වගබලා ගන්න. පාලකයෝ නීතිය අනුව කටයුතු කරනවා. පාලකයෝ නීතිය ආරක්ෂා කරනවා. අපේ රටේ මොකද වෙලා තිබෙන්නේ? අපේ රටේ පාලකයෝ නීතිය ආරක්ෂා කරන්නේ නැහැ. පළමුවෙන්ම තමන් පෙන්වන්න ඕනෑ තමන් නීතිය ආරක්ෂා කරනවා කියලා.

අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි මේ සභාවේ ඉන්න හැමදෙනාම පිළිගන්නවා, අපේ රටේ අද දේශපාලන අර්බුදයක් තිබෙනවා කියලා. දේශපාලන අර්බුදයේ තීරණාත්මක දිනය බවට හෙට දවස පත් වෙලා තිබෙනවා. අපි හැමෝම, මෙතැන ඉන්න 104 දෙනාගේම හෘද සාක්ෂිය දන්නවා. රට දේශපාලනික වශයෙන් ව්‍යාකූල වෙලා. ආරාජික වෙලා. හැබැයි, අපි ඒක අපේ හිතේ තියාගෙන ඉන්නවා. අපි ඒකට ලේබලයක් ගහන්නේ නැහැ. වෙනස වෙලා තිබෙන්නේ, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ - ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමන්ලා ඒකට

ලේබලයක් ගහනවා. මේක ධනේෂ්වරයේ අර්බුදයක්. හැබැයි, අපි ලේබලය ගහන්නේ නැති වුණාට අපි දන්නවා මෙතැන බරපතළ දේශපාලන අර්බුදයක් තිබෙන බව. එහෙමනම් අපි මේ දිළිඳුකමේ වෙළිලා, ගිලිලා ඉන්නේ ඇයි? ඉන්නේ, පාලකයා තමන්ගේ වැඩේ, තමන්ගේ වගකීම, මූලික දේ, සංවර්ධනයේ මූලික අංග ටික ක්‍රියාත්මක කරන්න මැදිහත් නොවුණු නිසයි. හැබැයි, අපට ඊට අවශ්‍ය ශක්‍යතාවය තිබෙනවා.

එක්සත් ජාතීන්ගේ නියෝජිතයෙක් ලංකාවට ආපු වෙලාවක කියලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

*"ශ්‍රී ලංකාව නැමති රට ඉදිරියට යන්න දෙන්නේ නැත්තේ කුණු වී ගිය දේශපාලන යයි"* කියලා.

මේ කුණු වී ගිය දේශපාලනය තමයි අපේ රට ඉස්සරහාට යන්න දෙන්නේ නැත්තේ. නිවැරැදි දේශපාලනයක් නැතිකම තමයි මේකට හේතුව. අපට නිවැරැදි දේශපාලනයක් තිබුණා නම් සංවර්ධනය ළඟා කරගන්න පුළුවන්. හැබැයි, අපි සත්‍යයට වඩා මුලා වෙලා ඉන්නේ ඇයි? අපි දේශපාලනඥයන්ව පත් කර ගන්නේ ඇයි? රටේ ජනතාව දේශපාලනඥයන්ව පත් කර ගන්නේ තමන්ට නොලැබී ගිය, තමන්ට ලබා ගත යුතු, තමන්ගේ බලාපොරොත්තු ටික ඉෂ්ට කරගන්න. තමන්ට මුදලක් සොයා ගන්න. තමන් ශක්තිමත් වෙන්න. ඇත්තටම දේශපාලනඥයන් පෙනෙන්නේ ඡන්දදායකයාට හරියට සමාජයේ ඉංජිනේරුවෙක් වාගේ. Social Engineer. ඔහු තමයි මේකේ මැවුම්කරුවා. නිර්මාණකරුවා. හැබැයි, ඒ සමාජ ඉංජිනේරුවරයාගේ කාර්යභාරය අපේ රටේ දේශපාලනඥයන් කරනවාද? ජනතාව දේශපාලනඥයන්ගෙන් බලාපොරොත්තු වන දේ ඡන්ද අරන් ගිහිල්ලා තමන්ට කර ගන්නවා. තමන්ගේ ගේ හදා ගන්නවා. තමන්ගේ වාහනය ගන්නවා. අපිත් ඔක්කොම ඉල්ලනවා. අපි ඉල්ලනවා නේ? අපේ පර්මිට් එකටත් සියලු දෙනා සටන් කරනවා නේ? අවසානයේ වාහනය නේ. අපි ඉල්ලනවා. හැබැයි, අපි පෙරළා හිතන්නේ නැහැ, ඡන්දය දීපු මිනිහා ගැන. අපි හිතන්නේ සේවාදායකයෙක් කියලා. ආයිත් සැරයක්අපේ දේශපාලනඥයනුත් හිතන්න පුරුදු වෙලා තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Take holder. මෙයා අපේ ව්‍යවසායික සහකරුවෙක් කියලා. මෙයා ව්‍යවසායික සහකරුවෙක් නොවෙයි. අපට බැරි වෙලා තිබෙනවා, දේශපාලනඥයන් හැටියට මෙය නිර්මාණය කරන වැඩේදී, මේ සියලුදෙනාම එකතු කරගෙන මේක සාමාජීය වැඩක් ලෙස කරන්න. Public වැඩක් කරන්න. මහජන සුභ සිද්ධිය සඳහා කරන වැඩක් කියලා සියලු දෙනා එකතු කරගන්න. එහෙම එකතු කර ගත්තේ නැත්නම් මේක ජනතාවගේ සහ අපේ සාමූහික ව්‍යාපාරයක් කර ගන්නා තුරු අපට බැහැ, අපේ මේ ගරු මන්ත්‍රීතුමීය කියපු ඉලක්කයට යන්න. මේක හරි අමාරු වැඩක්. හැබැයි, අවාසනාවකට අපි මේක තේරුම් අරගෙන නැහැ. ඒ නිසා මේ වාගේ විචාරශීලී කථිකාවතක් අවශ්‍යයි. මෙතුමීය කියන කාරණයට. අවසානයේදී මේ යෝජනාවෙන් කියන්න හදන්නේ මොකක්ද? අවසාන අර්ථය තමයි, රට බලාපොරොත්තු වන සංවර්ධන ඉලක්කයට යන්න අවශ්‍ය සියලු මාන අපි විසින් අකර්මන්‍යය කර අවසන්. මේ කුණු වී ගිය දේශපාලනය විසින් එය අකර්මණ්‍යය කර අවසන්. එහෙමනම් නැවත මේකට ජවයක් දෙන්නේ කොහොමද? නැවත මේකට ගාමක බලයක් දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය අපි හමුවේ තිබෙනවා. ඒක තමයි මේ සාකච්ඡාවේ හරය විය යුත්තේ. නමුත් අපට මොකද වෙලා තිබෙන්නේ? අප තුළ දේශපාලන අවංකභාවය සහ පාරිශුද්ධ භාවය නැති වෙලා ගිහිල්ලා තිබෙනවා.

අද පවතින දේශපාලන අර්බුදය මොකක්ද? අග්‍රාමාත්‍යවරයාට විශ්වාසභංගයක් ගේන්නේ ඇයි? අග්‍රාමාත්‍යවරයාගේ විශ්වාසභංගයෙන් පස්සේ ජනාධිපතිවරයාට දෝෂාභියෝගයක් ගේනවා කියන්නේ ඇයි? එකම හේතුවයි. මොකක්ද ඒ? අපි අවංක නැහැ. අවංකභාවය අපෙන් ගිහිල්ලා. අපේ පාරිශුද්ධභාවය කියන එක අපෙන් ගිහිල්ලා. මෙතැනම අපේ පිරිහීමක් තිබෙනවා. අඩුම ගණනේ මෙතුමියගේ යෝජනාවේ තිබෙනවා. අපේ ආගමික ඉගැන්වීම් - අපි බහු භාෂා ගණනාවක් කථා කරන, ආගම් ගණනාවක් අදහන ජාතීන් ඉන්න රටක්. හැබැයි සියලු ඉගැන්වීම්වල, සියලු ආගමික ඉගැන්වීම්වල හරය අඩුම ගණනේ මේ රට සංවර්ධනය කරගන්න වැඩේදී නායකයින්ගේ, පාලකයින්ගේ කියවීම බවට, විශ්වාසය බවට පත් කරගන්න අපි අසමත් වෙලා තිබෙනවා. ඒකයි මේ අර්බුදය. එහෙමනම් මේ යථාර්ථය අපි අද පිළිගන්න ඕනෑ. හැබැයි, අපි තේරුම් ගන්න ඕනෑ කාරණයක් තමයි, දේශපාලන අවංකභාවය සහ පාරිශුද්ධභාවය මත තීරණය වන්නක්ම නොවෙයි. ඇයි මම එහෙම කියන්නේ? ගිය

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

සැරේ මැතිවරණයේදී අපි මොකද කිව්වේ, ඊට කලින්. අපි කිව්වා, මහින්ද රාජපක්ෂ මහත්මයලා හොරකම් කළා කියලා. අපි කිව්වා, පැවතුණු ආණ්ඩුව වංචාවෙන්, දූෂණයෙන්, අවිනීතියෙන් රට පාලනය කළයි කියලා. හැබැයි පසුගිය පළාත් පාලන ඡන්දයේදී කපලා ඡන්දය දුන්නා. හැබැයි, ඒ ඡන්දය දුන්න රටේ ජනතාව නොදැන නොවෙයි. හොරකම්, වංචා, දූෂණ සිද්ධ වුණා කියලා නොදැන නොවෙයි ඡන්දය දුන්නේ. දැනගෙන දුන්නේ. දේශපාලනඥයා අවංක නැහැයි කියලා ජනතාව දන්නවා. දේශපාලනඥයා පාරිශුද්ධ නැහැයි කියලා ජනතාව දන්නවා. හැබැයි ගෙඩිය පිටින් ඡන්දය දුන්නා. ජනතාව ඒක විශ්වාස කරන්නේ නැහැ. ඒක නිසා මේක තේරුම් අරගෙන ඕනෑ අපි ඉස්සරහාට යන්න. හැබැයි, අපි හිතුවොත් මම අර කලින් කිව්වා වාගේ ඡන්දදායකයා, මහජනතාව යනු ව්‍යවසායික කොටස්කාරයෙක්, Take holder කෙනෙක් කියලා හිතුවොත් මේ වැඩේ යන්න බැහැ. ඒ නිසා දේශපාලනඥයාට සිද්ධ වෙනවා, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමන්ලා විශ්වාස කරනවා වාගේ මේක ජනතා ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන්න. මේක තමයි මේ සමාජ සටන. එතුමන්ලා විශ්වාස කරන්නේ.

ජනතා විමුක්ති පෙරමුණට දේශපාලන දර්ශනයක් තිබෙනවා. අවාසනාවට අපි විවිධ මත දරනවා. ඒ කියන්නේ, දක්ෂිණාංශක කියලා අපි විවිධ මත දරන අයට වඩා එතුමන්ලා දාර්ශනික පැත්තෙන් ඉස්සරහා ඉන්නවා. එතුමන්ලාට දැක්මක් තිබෙනවා. දේශපාලන දර්ශනයක් මත පදනම් වුණු. ඒ නිසා මම කියන්නේ, මේක ජනතාවගේ ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරගන්න තුරු, මේක ජනතාව එක්ක එකට නැඟිටින්න ඕනෑය කියන විශ්වාසය මත පදනම් වුණු ව්‍යාපාරයක් බවට පරිවර්තනය වෙන්න නම්, සමාජ ව්‍යාපාරයක් බවට පරිවර්තනය වන තුරු අපට, මේ යථාර්ථයට මුහුණ දෙන්න වෙනවා. සමාජ, ආර්ථික, දේශපාලන වෙනසක් මේ රටේ ඇති කරන්නේ නැතිව මේ සංවර්ධනය කියන එක ළඟා කරගන්න අපට අමාරුයි. ඒ නිසා අපි මේක තේරුම් අරගෙන ඉස්සරහාට යා යුතුයි කියලා මා විශ්වාස කරනවා. මොකද, අද රටේ වෙලා තිබෙන්නේ මොකක්ද? ආයතන සියල්ල දේශපාලනීකරණය වෙලා. ඒ වාගේම දේශපාලනීකරණය කරනු ලැබූ ආයතන සියල්ල අකර්මණ්‍යය කරලා ඒවායේ පරිපාලනය කළමනාකරණය දුර්වල කරලා. ඒ නිසා අපි ඉන්න සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදය විසඳන්න නම් අපට මේකේ වෙනසක් කරන්න වෙනවා. ඒ නිසා මෙය අපි දකින ද්‍රව්‍යමය දියුණුව පමණක් නොවෙයි. ආධ්‍යාත්මික පැත්තෙත් බරපතළ විපර්යාසයකට මේ සමාජය භාජනය විය යුතුයි කියලා මම දැඩි ලෙස විශ්වාස කරනවා. මම කැමැතියි අවසාන වශයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහත්මාගාන්ධි වරක් කියලා තිබෙන කාරණයක් මතු කරන්න. ඒ කියපු කාරණය මේ තුළින් ඇත්ත වශයෙන් තහවුරු වෙනවා කියලා මා විශ්වාස කරනවා. මහත්මා ගාන්ධිතුමා කියනවා,

*"ආචාර ධර්ම සහ ආගමේ ශාඛාවක් ලෙස දේශපාලනය ගාන්ධි දුටුවේ ය. එය බලය සහ ධනය සඳහා වූ අරගලයක් නොව, දුගීභාවයේ ගිලී සිටින මිලියන සංඛ්‍යාවක් සඳහා යහපත් දිවියක් ලබා දීමටත්, මනුෂ්‍ය වර්ගයාගේ ගුණාත්මක බව දියුණු කිරීමටත්, ඔවුන් නිදහසට සහ සහෝදරත්වයට පුහුණු කිරීමටත් ආධ්‍යාත්මික ගුණධර්ම සහ සමාජ සංහිඳියාව ළඟා කර ගැනීම සඳහාත් දැඩි කැපවීමකින් කරන පරිශ්‍රමයකි දේශපාලනය."*

අන්න ඒ ආධ්‍යාත්මික අර්ථයවත් තේරුම් ගන්නා තුරු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කියන ඉලක්කයට යාම ලෙහෙසි නැහැ. හැබැයි, අපට අවශ්‍ය ශක්‍යතාවය තිබෙනවා. ප්‍රශ්නය තිබෙන්නේ, මේ කුණු වී ගිය, විකෘති වී ගිය දේශපාලන ක්‍රමවේද යයි. බොහොම ස්තුතියි.

[අ.භා. 12.27 ]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය මේ සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව සලකා බලන මොහොතේ මා අතිශයින්ම ඇයට ස්තුතිවන්ත වෙනවා. ගරු මන්ත්‍රීවරුන් 104 දෙනාටම කිසිම බෙදීමකින් තොරව පැහැදිලි වූ මානුෂිකත්වයකින් යුතුව තමන්ගේ දේශපාලන අනන්‍යතාවය පාවිච්චි කරමින්, තමන්ගේ රට පිළිබඳව තමන් සිතන මතය, තමන්ගේ රටට අද වෙලා තිබෙන දේ, විය යුතු දේ පිළිබඳව ඉතා විවෘතව කිසිදු දේශපාලන පක්ෂයකට හිත රිදවන්නේ නැතිව කථා කරන්න සුදුසු මාතෘකාවක් ඉදිරිපත් කිරීම පිළිබඳවත්, එය ඉතා අතිශයින්ම

ජාතික වශයෙන් වැදගත් කාරණාවක් බව කාටත් අවබෝධ කරගෙන ක්‍රියා කරන්න හැකි පරිසරයක් සකස් කර දීමත් පිළිබඳව මම ස්තුතිය පළ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ ඉතිහාසය, වර්තමානය සහ අනාගතය මේ රටේ අපි ප්‍රාර්ථනා කරන පරිසරය, සෞභාග්‍යමත් රටක්, නිදහස් නිවහල් ජාතියක් මේ රට තුළ නැවත ජනිත කරන්නේ කෙසේද? ඒ සඳහා රෝස් ප්‍රනාන්දු කියන මන්ත්‍රීවරිය දකින ආකාරය කුමක්ද කියන එක පිළිබඳව අප මුලින්ම දකිනවා වාගේම ඇයට මගේ ගෞරවය සහ ප්‍රශංසාව මේ මොහොතේ පළමුව පුද කරන්න කැමැතියි.

ශ්‍රී ලංකාව භව භෝග සම්පත්වලින් අඩුවක් නැති, මුළු ලෝකයේම ගෞරවයට පාත්‍ර වුණු යුගය, මහා පරාක්‍රමබාහු රජතුමාගේ කාලය තුළ පෙරදිග ධාන්‍යාගාරය හැටියට අපේ රට ගෞරවයට පාත්‍ර වුණු යුගය, ඒ යුගයේ පැවතුණු රාජ්‍ය පාලන ක්‍රමය කුමක්ද කියන එක පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කළොත් අපට හිතන්න වෙන්නේ පරාක්‍රමබාහු රජතුමා ඒකාධිපතියෙක් ද? එහෙම නැත්නම් සොඳුරු ආඥාදායකයෙක් ද? එහෙම නැත්නම් කුමන ආකාරයේ ආර්ථික ප්‍රතිපත්තියක් මත එවැනි දෙයක් මේ රට තුළ ක්‍රියාත්මක කළේද කියන කාරණාවයි. සමහරවිටක හිතෙන්න පුළුවන් ඒ කාලයේ වන විට ලංකාවේ අදට වැඩිය ජනගහනය අඩු කාලපරිච්ඡේදයක් වෙන්න ඇති කියලා. නමුත් ඉතිහාසය ගැන කථා කරන කොට කියන්නේ, ලංකාවේ වැඩිම ජනගහනය වාර්තා වෙන්නේ මහා පරාක්‍රමබාහු රජු යුගයේ කියන කාරණාවයි. කෙසේ වෙතත් සිංහලයේ අවසාන රජතුමා, ශ්‍රී වික්‍රමසිංහ රාජසිංහ රජතුමන්ගේ යුගය වනතුරුත් ලංකාව විශාල ආර්ථික අර්බුදයකට මැදි වුණු වගක් සඳහන් වන්නේ නැහැ. රටට තිබුණු ප්‍රධාන අභියෝගය වරින්වර සිදු වුණු විදේශීය ආක්‍රමණ. ඒ විදේශීය ආක්‍රමණවලට මුහුණ දෙන්න සූදානමින් රජතුමා ක්‍රියා කළා මිස ඒ කාලයේ හිටපු රජවරු තමන්ගේ රටවැසියාට තිබෙන ආපදාවන්, ඔවුන් සතුටින් ජීවත් වෙනවාද කියලා සොයා බලන්න වෙස් වලාගෙන සාමාන්‍ය මිනිස්සු අතර ගැවසුනා කියන කාරණාත් ඉතිහාසයේ සඳහන් වී තිබෙනවා. ඒ නිසා ඒ හිටපු ආඥාදායකින්, එහෙම නැත්නම් ඒ රාජ්‍යතාන්ත්‍රය තුළ කටයුතු කරපු අය මොනතරම් ජනතාව කෙරෙහි උවමනාවක්, බැලීමක්, දැකීමක් තිබුණාද කියන කාරණාවත් ඒ තුළ මතුවන කාරණාවක්.

ඒ එක්කම රජතුමා මොන ආකාරයේ ක්‍රමවේදයක් තුළ තමන්ගේ නීති පද්ධතිය ක්‍රියාත්මක කළා ද කියන කාරණාවත් අපි සැලකිල්ලට ගත යුතුව පවතිනවා. මොකද හේතුව, ඔහු විසින් ගන්නා ලද තීන්දු තීරණ අනුව මහ දරුණු තත්ත්වයන්ට තමයි ජනතාවට මුහුණ දෙන්න සිද්ධ වුණේ. හිස ගසා දැමීමට, එහෙම නැත්සම් උල තියා මැරීමට, එසේත් නැත්නම් වෙනත් දඬු ගසේ ගසා දින ගණන් තබා දින ගණනාවක් නිරාහාරව තැබීම වාගේ මහා දරුණු නීති එකළ පැවතුණා. ඒ කාලයේත් මානව හිමිකම් සංවිධාන තිබුණා ද කියා මා දන්නේ නැහැ. නමුත් එවැනි ආකාරයට තමයි ඒ රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාවලිය පෙළගැසිලා තිබුණේ. 1815 මේ රටේ පාවා දීමෙන් පස්සේ 1818 වන කොට නැවත ශ්‍රී ලාංකීය ජනතාවට දැණුනා විජාතික බලවේග තුළ යටත් විජිතවාදීන් වශයෙන් ජීවත් වීම රටට අහිතකර ක්‍රියාවක් බව. ඒ කාලපරිච්ඡේදය අවසන් වෙලා 1948 අපි ඉංග්‍රීසින්ගෙන් නිදහස ලබනවා. නිදහස ලැබුවත් අපි ඉංග්‍රීසි කිරීටය යටතේ තමයි 1972 ජනරජ ව්‍යවස්ථාව මේ රට තුළ ජනිත වනතුරු අපි සිටියේ. රැජිණගේ අත්සන නැතිව අපට නිදහසේ යමක් කරන්න පුළුවන් පරිසරයක් මේ රට තුළ නිර්මාණය වී තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කොහොම වුණත් 1948 ලබපු නිදහසින් පසුව අපට, රටට ආවේණික ප්‍රතිපත්ති අපේ රටේ භූගෝලීය හා පාරිසරික තත්ත්වයන් පිළිබඳව දැඩි අධ්‍යයනයකින් යුතුව මේ කෘෂිකාර්මික එලදායි භූමියක් තිබෙන රට කොහොමද ආර්ථික වශයෙන් නිදහස් රටක් බවට පත් කර ගන්නේ කියලා හිතන්න අපේ රටේ දේශපාලනය කරන ප්‍රජාතාන්ත්‍රීය ප්‍රවාහයට ඇතුල් වුණු දේශපාලනඥයෝ එකට එකතු වෙලා සිතුවා නම් අද මේ ඛේදවාචකයේ ගොදුරක් බවට අප පත් වෙන්නේ නැහැයි කියලා මා පෞද්ගලිකව විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මා එසේ කියන්නේ, අදත් මේ විජාතික බලවේගවල ගොදුරක් බවට ශ්‍රී ලංකාව පත් වෙලා තිබෙන්නේ, මේ රටට ආදරය කරන ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකත්, කුඩා කුඩා දේශපාලන කණ්ඩායමනුත් එකට එකතු වෙලා, තමන්ගේ රට පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කරලා, එක් එක් විෂයය සම්බන්ධව උගත් විද්වත් මිනිසුන් එකතුව, විෂයය බද්ධ කාරණා පිළිබඳව දැඩි අධ්‍යයනයක් කරලා, අඩුම වශයෙන් වසර 50 කට ගැලපෙන ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කරගන්න අපොහොසත් වීමේ දැවැන්ත ඛේදවාචකය ප්‍රධාන හේතුවක්

[ගරු ජගත් අංගගේ]

වූ නිසාය. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද කල්පනා කරන්න ඕනෑ පළමු කාරණාව, අද දවස වන විටත් විජාතික බලවේග අප රට වෙනුවෙන් ඉදිරිපත් වෙලා ඉන්නේ, සත්‍යවාදී වශයෙන් සහ අවංකවම අපේ රටේ අභිවෘද්ධිය, අනාගතය සහ යහපැවැත්ම මේ රට තුළ ගොඩනගන්න තිබෙන සැබෑ උවමනාව නිසාද? එහෙම නැත්නම් වෙනත් යටි අරමුණු ඔවුන් තුළ තිබෙනවාද කියන කාරණය. මේවා පිළිබඳව නිවැරැදිව සිතා බලන්න අපි අපොහොසත් වන තාක් කල් අපි ඔවුන්ගේ වහලුන් බවට පත් වෙනවා විනා අපට රටක් හැටියට නැඟී සිටීමේ හැකියාවක් මතු වෙන්නේ නැහැ.

ඒ නිසාම අද සිදු වෙලා තිබෙන්නේ, ජාතික ප්‍රතිපත්තියක් නැති, රට පුරා විසිරී සිටින විවිධ විෂයයන් පිළිබඳව රටේ අනාගතය නිර්මාණය කරන්න දායකත්වය ලබා ගන්න අපොහොසත් වුණු රටක පුරවැසියන් හැටියට ජීවත්වන අපට, අද දවස වන විට ඉතාමත් දරුණු ඛේදවාචකයන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා පමණක් නොවෙයි, ශ්‍රී ලාංකීය ආර්ථිකය බලාගෙන ඉද්දී කඩාගෙන වැටෙනවා. දවසින් දවස ඇදගෙන වැටෙනවා. පණ දෙන්න බැරි තරමට අසරණභාවයට පත් වෙනවා. මේ අසරණභාවයෙන් කොහොමද අපි නැඟී සිටින්නේ කියන කාරණාව අපට වරින් වර මතක් වෙනවා. කෙනෙකුට කියන්න පුළුවන්, රටේ අභ්‍යන්තර යුද්ධ. දැන් විජාතික බලවේගවල ආක්‍රමණවලට යුධමය වශයෙන් යටත් නොවුණු වකවානුවක 1948 නිදහසෙන් පස්සේ 1960 ගණන්වල ජනතා විමුක්ති පෙරමුණේ අර්බුදය මේ රටේ මතු වුණා. මම මේ ජනතා විමුක්ති පෙරමුණට පහර ගහන්නවත්, ඔවුන්ගේ අඩුපාඩුවක් කථා කරන්නවත් කියනවා නොවෙයි. ආයුධ සන්නද්ධ හමුදාවක් ජාතික හමුදාවත් සමග අරගලයක් ඇති වෙනවා. රටේ ජීවනාලිය බඳු තරුණයන් විශාල වශයෙන් සංහාරයට ලක් වෙනවා. මේ ක්‍රියාවම 1988, 89 වකවානුවෙත් සිද්ධ වෙනවා. නැවතත් රට ගොඩගන්න ඉන්න තරුණ පැටව් ටික, දරුවෝ ටික රටට අහිමි වෙනවා. මේ සියලු කරුණු කාරණා තුළ සිද්ධ වෙන්නේ රටට විනාශය විනා රටට යහපත නොවෙයි. දැන් ඒ කාරණාව එක්කම 1960 දශකයේ ආරම්භ වුණු L.T.T.E සංවිධානය, FLOT සංවිධානය, EPRLF. EPDP. මේ වාගේ සංවිධාන සමූහයක් ආයුධ සන්නද්ධ සංවිධාන හැටියට වාර්ගික අර්බුදයක් මතු කර ගන්නවා. මේ වාර්ගික අර්බුදය මත පුරා අවුරුදු 30 කට වැඩි කාලයක් රට ආයුධ සන්නද්ධ මිනිසුන්ගෙන් ගහන රටක් බවට පරිවර්තනය වෙනවා. රටේ ජීවත්වන මිනිස්සුන්ගේ ජීවිතවලට කිසිසේත්ම වටිනාකමක් නැති කාල යුගයක්. ඒ යුගය තුළ රටේ ආර්ථිකය ගොඩනැගෙනවා වෙනුවට රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමට ආණ්ඩුවලට සිද්ධ වෙනවා. ආර්ථිකය පිළිබඳව බොහෝ කරුණු කාරණා අමතක වුණු යුගයක් බවට පත් වෙනවා. යුද්ධයේ අවසාන භාගය 2009 වර්ෂය වන කොට රටේ ජනතාව මේ පීඩාවෙන් මානුෂික වශයෙන් කොපමණ වේදනා විඳිනාව ද කිව්වොත් පාලකයින්ට කියනවා, ආර්ථිකයට හෙන ගහලා ගියත් කමක් නැහැ. අපේ ජීවිත ආරක්ෂා කරගන්න වැඩ පිළිවෙළක් රටට අවශ්‍යයි කියන කාරණාව.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ පුරා අපි ලබපු අත්දැකීම් අවම වශයෙන් අනාගතය නිර්මාණය කරගන්න අපි උපයෝගී කර ගෙන තිබෙනවාද? නැද්ද? කියන කාරණාව අතිශයින්ම වැදගත් කාරණාවක් වෙනවා. මන්ද, ඒ බවක් අපට අදටත් නොපෙනෙන නිසා. 1988, 89 වකවානුවේ මේ රටේ ජනතා විමුක්ති පෙරමුණේ ඒ ක්‍රියාවලියේ නිරත වුණු තරුණ තරුණියන් දහස් ගණනක් තමන්ගේ ජීවිත අහිමි කරගන්න කොට එවකට හිටපු පාලකයෝ මේ පිළිබඳව සොයා බලලා මේ රටේ තරුණ අසහනය තුරන් කිරීමේ කොමිෂන් සභාවක් නිර්මාණය කරනවා. ඔවුන් නිර්දේශ කරනවා, තරුණයින් ප්‍රතිශතයක් අඩුම ගණනේ පළාත් පාලන මැතිවරණවලින් ඇතුල් වෙලා මේ රටේ පාලන තන්ත්‍රයේ කොටස්කරුවන් වෙන්න ඕනෑය කියලා. අඩුම වශයෙන් මෙවැනි ඛේදවාචකයන්ට මුහුණ දුන්නු රටක ප්‍රතිපත්ති නිර්මාපකයෝ මේ පළාත පාලන මැතිවරණය හදන කොට ඒ අයිතිවාසිකමත් තරුණයාට අහිමි කරනවාද? නමුත් අහිමි කරලා හෙට දවසේ අපි සුභවාදී අනාගතයක් ගැන කොහොම නම් හිතන්න ද කියන කාරණාව මේ තුළ නැවත ප්‍රතිනිර්මාණය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මොකද වෙලා තිබෙන්නේ? රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. 1978 වර්ෂයේ ජේ.ආර්. ජයවර්ධන ගරු ජනාධිපතිතුමා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දුන්නා. මැතිවරණ ක්‍රම සංශෝධනය කළා. ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් කළා. පසුගිය ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආණ්ඩු ක්‍රමය තුළ පැවතුණු බොහෝ ගති ලක්ෂණ වෙනස් කරලා අපේ රටට

ගැලපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැටියට තමයි ඒක ඉදිරිපත් කළේ. ඒ තුළ වුණු විවිධ අවාසනාවන්ත සිදුවීම්වලට පිළිතුරක් හැටියට තමයි මෙවර මේ කේවල ක්‍රමය, නැවත මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දෙන්න කියලා ඔවුන් මේ ක්‍රමය හඳුන්වා දුන්නේ. ඒ ක්‍රමය තුළ මොනතරම් ජාතික අර්බුද අද නිර්මාණය කරලා තිබෙනවාද කියන කාරණාව ඔබ දකිනවා. මම මේ ඡන්දය ගැන කථා කරනවා නොවෙයි. මැතිවරණ පවත්වන විධිය ගැන කථා කරනවා නොවෙයි. මම කථා කරන්නේ, රටක මූලික ලියවිල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේදී ඉතාමත්ම වැදගත් කාරණාවක් හැටියට රට ගැන නොසිතා කිරීම නිසා රටේ ආර්ථිකයට ඇති වන විනාශය සහ රටේ ජීවත්වන මනුෂ්‍යයින්ගේ මානුෂික වශයෙන් ඇති වන පිරිහීම පීඩාව සහ ඔවුන්ට සිදු වන අගතිය පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි මෙසේ පැමිණි ගමනේ ඊළඟට අපි අපෙන්ම ප්‍රශ්න කර ගන්නවා. දේශපාලනයේ නියැලිලා ඉන්න උඹ, උඹේ රටට ආදරය කරනවාද? උඹේ රටේ ජනතාවට ආදරය කරනවාද? උඹ ඔවුන්ට අවංකද? උඹ කරන කාරණාව තුළ උඹගේ ජීවිතයේ අවසානයේ උඹට වේදනාවක් හෝ සතුටක් දැනේවිද? මෙන්න මේ ටික අපි අපෙන්ම ප්‍රශ්න කර ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මූලාසනය හොබන ඔබතුමාට මම අවංකවම කියනවා. අද දවසේ මේ සභාවේ අසුන් ගෙන ඉන්න - මම අවංකවම විශ්වාස කරනවා. අපි තවමත් මේ රටට ආදරය කරන්නේ නැහැයි කියන කාරණය. මේ රටේ ජීවත්වන මනුෂ්‍යයාට අපි ආදරය කරන්නේ නැහැයි කියන කාරණාව. මේ රටේ ගහකොළ පරිසරයට, මේ උතුම් මාතෘ භූමියට අපි ආදරය කරන්නේ නැහැයි කියන කාරණාව. පැහැදිලිව කිව්වොත් අපි අවංක නැහැයි කියන කාරණාව මම ඉතාමත්ම නිර්භයව මේ සභාවේදී ඔබ ඉදිරියේ මේ හැන්සාඩ් වාර්තාවේ සටහන් වෙන්න ප්‍රකාශ කරනවා. මා එසේ ප්‍රකාශ කරන්නේ අපි එකිනෙකා පිළිබඳව හැසිරෙන විධිය, ඔවුන් කථා කරන වචන, ඔවුන්ගේ අවශ්‍යතාවයන්, ඔවුන් ඊළඟ මැතිවරණවලට සැරසෙන්න හදන විධිය,මේ සභාව තුළ එකිනෙකා පරයා ගිහිල්ලා තම තමන්ගේ අවශ්‍යතා ගැන හිතන හැටි, මේ සියලු දේ විනිවිද දකින කොට අපට හිතෙනවා, පැහැදිලිවම ඔබ ඔබේ රටට ආදරය නොකරන, ඔබ ඔබේ රටේ ජනතාවට ආදරය නොකරන, මේ උතුම් පරිසරයට, භූමියට ආදරය නොකරන, මමත්වය සහ ඔබ ගැන විතරක් හිතන මිනිසුන්ගේ සමූහයක් මේ සභාවේ අසුන් ගෙන සිටිනවයි කියලා. යම් කෙනෙකුගේ හිත රිදෙනවා නම් මට සමාවෙන්න. මම ඒ පිළිබඳව පෞද්ගලිකව මේ මටත් එක්ක මම මේ කියා ගන්නේ. මම ඔබට විතරක් කියන කාරණාවක් නොවෙයි. මේක මටත් එක්ක මම කියා ගන්නවා. මේ සියල්ල සිදු වන්නේ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන ලියවිල්ල මේ රටට අනුචිත ලියවිල්ලක් හැටියට, මේ රටට නොගැලපෙන ලියවිල්ලක් හැටියට, මේ රටේ මිනිස්සුන්ගේ මනස අර්බුදයෙන් අර්බුදයට පත් කරන ලියවිල්ලක් හැටියට ප්‍රකාශයට පත් වීමේ මහා සාපරාධී ක්‍රියාව නිසා. මේක තමයි සත්‍යවාදී කාරණාව.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ඇගේ සිතේ ජනිතවන අවංක සිතුවිල්ලක ප්‍රතිඵලයක් හැටියට මේ සභාවට මේ යෝජනාව ඉදිරිපත් කරද්දී මේ යෝජනාවේ යථාර්ථය සැබවින්ම මේ රට තුළ ජනිත කරන්න පුළුවන් නම් අපි හෙට දවසේ ජීවත් වන්නේ ශ්‍රී ලංකාව නැමති කේතුමතී නුවරයි. ඒ කේතුමතී නුවරට යා හැකි මාර්ගය තවමත් අප දැක නැහැ. එය මෙලොව තුළ පහළ වන දවස කවදා ද කියා මා දන්නේනැහැ. අද පාලකයින්ගේ මානසික තත්ත්වය තුළ නම් මේ දවස උදාවන තත්ත්වය පැහැදිලි නැහැ. අවිනිශ්චිතයි. ඒ නිසා මම අතිශයින්ම නැවත නැවතත් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරියක් වුණත්, ඇගේ හිතේ ජනිත වුණු මේ සිතුවිල්ලට මා හිස නමා ආචාර කරනවා. එය තමයි මේ මිහිමත සිදු විය යුතු කටයුත්ත. එය එසේ නොවීම පිළිබඳව, එය ප්‍රමාද වීම පිළිබඳව අපි කම්පාවෙන් බලා සිටිනවා. හෙට දවසේ අපි සියලුදෙනා මොන දේශපාලන මතය දැරුවත්, මොන දේශපාලන පක්ෂය නියෝජනය කළත්, මොන නායකයා යටතේ කටයුතු කළත් අපට පුළුවන් වුණොත් එහෙම එක තැනකට ඇවිල්ලා මේ පොළවට මිහිදන් වෙන්න ඉස්සෙල්ලා අපේ මාතෘ භූමිය මේ අගාධයෙන් ගොඩ ගන්න අපි කැප වෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපේ යුතුකම ඉෂ්ට කරන්න ඕනෑය කියලා අපේ හද තුළ යම්කිසි අදහසක් ජනිත වුණොත් ඒ මත භේදවලින් තුරන් වෙලා ඔබ ප්‍රාර්ථනා කරන ලෝකයට අපට යන්න පුළුවන් වේවි. ඒ දවස මෑත යුගයේ උදා වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.44 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුකොටම රෝස් ප්‍රනාන්දු අපේ ගරු මන්ත්‍රීතුමියට මෙවැනි සත්භාවයෙන් රටේ අනාගතය ගැන හිතලා, වර්ෂ හැත්තෑවක් තිස්සේ අපි අනාගත්ත හැටි, නා ගත්ත හැටි, ඇඟේ ගා ගත්ත හැටි කල්පනා කරලා එතුමිය හොඳ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කල්පනා කළේ - ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. රට හදන්නේ කොහොමද? මම මෙහෙට එන්න ඉස්සෙල්ලා මම කණ්ඩායම් රැස්වීම් කළා, එක්සත් ජාතික පක්ෂයේ බොරලැස්ගමුව නගර සභාවේ. අපේ කණ්ඩායම අරගෙන එනවා, තුන්වැනි වතාවටත් සභාපති පුටුවට පත් වුණු, අත්දැකීම් බහුල සභාපතිතුමා දාපු පළමුවැනි සහ දෙවැනි යෝජනා දෙක. මෙහි සභාපතිතුමා දාන පළමුවැනි යෝජනාව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

*"බොරලැස්ගමුව නගර සභාවේ කාර්යය කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මූලික නීති හා වෙනත් ලිඛිත නීතිවලින් ගරු සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට සභාපතිවරයාට පවරන මෙන් මේ සභාවට යෝජනා කරන්නීය."*

මේ අවුරුදු 10 ක් සිටිය සභාපතිවරයෙක් සභාවට යෝජනා කරනවා, සභාව සතු බලතල - ඒ කියන්නේ දැන් මේ අපේ සභාව නම් අපේ සභාවට බලතල එපා. මූලික නීතියෙන් තිබෙන. ඒවා ටික සභාපතිට දෙන්න. ඔහු ගෙනෙන දෙවැනි යෝජනාව,

*"බොරලැස්ගමුව නගර සභාවේ කාර්යය කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එහි වියදම් නගර සභා අරමුදලින් දැරීම සඳහා නගර සභා ආඥා පනතේ 38 වන වගන්තියේ සඳහන් සභාපතිවරයාට ඇති රුපියල් 10,000 ක සීමාව ලක්ෂ 25 දක්වා වැඩි කිරීමට යෝජනා කරමි."*

මේ අලුත් සභාවක සභාපතිවරයෙක්, දෙවරක් හිටපු සභාපතිවරයෙක් තුන් වන වාරයේ එන කොට ගෙනෙන යෝජනාව. Delicate authority එක දහ දාහයි. මේක ලක්ෂ 25 ක් කරන්න. කැබිනට් ඇමතිවරයෙකුටවත් නැහැ, තමන්ගේ අමාත්‍යාංශයේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේගොල්ලන්ට වග කියන්නේ කවුද? බස්නාහිර පළාත් සභාව. දැන් මේ යෝජනා දෙක දුන්නාම මේ යෝජනා භාර ගන්නේ කවුද? ඒ අදාළ ආයතනයේ ලේකම්වරයා හෝ ලේකම්තුමිය. කොමසාරිස්තුමියත් ඇති. දන්නවා ඇති. දැන් නගර සභාවක ලේකම් ධූරය දරන්න ඕනෑ පරිපාලන සේවා විභාගය සමත්, අඩුම ගණනේ දෙක ශ්‍රේණිය හෝ තුන ශ්‍රේණිය සමත් අය. අද එක්කෙනෙක්වත් එනවාද මේ නගර සභාවල සේවය කරන්න. පරිපාලන සේවය පාස් අය. නැහැ. කවුද ඉන්නේ? සුප්‍රා. සීනියර් ක්ලාක්ලා තමයි මේ නගර සභාවල ලේකම්වරු වෙලා ඉන්නේ. ඒ නගර සභා ක්‍රමය කඩා ගෙන වැටෙනවා. මේ අපි යටතේ තිබෙන්නේ. මේ රට හදන්න නොවෙයි මම කියන්නේ. මුලින්ම අපේ සභා ගැන. එතකොට මේ නිලධාරීන් සභාපති සහ මන්ත්‍රීවරු පුහුණු කරන්න ඉස්සෙල්ලා අඩුම ගණනේ මේ ලේකම්තුමියට බැරි වුණා කොමසාරිස්තුමියට යෝජනා දෙක පෙන්වලා අඩුම ගණනේ මේ දෙක න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවාද නැද්ද කියලා අහන්නවත් තරම් දැනුමක් නැහැ. මම ඇහුවාම එතුමිය මට කියනවා, නැහැ. සභාපතිවරයෙක් දෙන ඕනෑම යෝජනාවක් මම න්‍යාය පත්‍රයට දාන්න බැඳිලා ඉන්නවාලු. ඊට පස්සේ එතුමිය මට කියනවා, ආඥා පනතේ 13. 13 බැලුවාම ඒක 1978 දී අවලංගු කරලා. ඉතින් මේක තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යථාර්ථය. ඉතින් මෙහෙම නම් වෙන්නේ, මේ රටේ වෙනත් කාරණා මොනවාද? මම දැන් මේ එක සරල උදාහරණයක් කිව්වේ.

බස්නාහිර පළාත් සභාවේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රාර්ථනා කරන ලෝකය හදන්න පාර්ලිමේන්තුවට කියන්න ඉස්සෙල්ලා, වෙනත් තැන්වලට කියන්න ඉස්සෙල්ලා පළාත් සභාවට කියන්න. දැන් මේ රටේ පරිපාලන අගනුවර කොහේද? මේ දැන් අපි ඉන්න තැන. පිළියන්දල ඉඳන් එන්න පුළුවන් තනි බස් එකක් තිබෙනවාද? මහරගම ඉඳලා එන්න තනි බස් එකක් තිබෙනවාද? පිටකොටුවේ ඉඳන් එන්න එක බස් එකක් තිබෙනවාද? බස් කීයක බැහැලා ඕනෑද මේ පරිපාලන නගරයට ඇතුළු වෙන්න. එක්කෝ රාජගිරියෙන් බහින්න ඕනෑ. බැහැලා ත්‍රීවීල් එකක් අරගෙන එන්න ඕනෑ. දැන් මේ මොකද වුණේ. මේ පළාත් සභාවේ ප්‍රවාහන අමාත්‍යාංශය තිබෙනවා. ඇත යන්න ඕනෑ නැහැ. අපි පොඩි කාලේ 138 බස් එක කඩවත - මහරගම. මොකක්ද බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන

අධිකාරිය කළේ? මහරගම පිටකොටුව. පිටකොටුවෙන් කඩවත. දැන් එතකොට මහරගම මනුස්සයෙකුට කඩවත ගිහින් එන්න බස් දෙකක් ඕනෑ. දැන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිළියන්දල ඉඳන් මේ අගනුවරට එන කෙනෙකුට. පිළියන්දලින් බොරලැස්ගමුවට එන්න ඕනෑ. බොරලැස්ගමුවෙන් මහරගමට එන්න ඕනෑ. මහරගමින් මෙහෙට එන්න ඕනෑ. පැය කීයක්ද? කොහොමද මේ රටක් සංවර්ධනය වෙන්නේ. රටේ ජනතාව මාරු වෙනවා. දැන් උදාහරණයකට ගත්තාම ඉස්සර මිනිස්සු කොළඹ ආවා. ප්‍රවාහනය අඩු කාලේ, මාර්ග මෙපමණ දියුණු නැති කාලේ ගාල්ලේ ඉඳලා පැය එකහාමාරෙන් දෙකෙන් කොළඹ ආවා. අද ඒ මිනිස්සු එන්නේ නැහැ. අද කොළඹ එක පාසලක් ළඟ ඉඳන් අනික් පාසල ළඟට යන්න ට්‍රාන්ස්පෝට් එකේ පැයක් යනවා. මේ පළාත් සභාව, අපි පාරවල් කෑලි කීයකට කඩලා තිබෙනවාද? බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය එක පාර කෑලි පහකට කඩලා දීලා තිබෙනවා. මේ මොකුත් එපා. බස්වල කප්පම් ගන්න එක නවත්වන්න පුළුවන් වෙලා තිබෙනවාද අපට. පළාත් සභාවට. බැහැ. දැන් අපේ මිත්‍රයා, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා දැම්මා එක බස් එකක්. කොහොම හරි මහරගම ඉඳලා direct බස් එක මෙතැනට. සුමාන දෙකයි ආවේ. බස් එකට ගැහුවා. එන්න දෙන්නේ නැහැ. පෞද්ගලික බස් හිමියා. ව්‍යාපාරිකයා. අන්තිමට මොකක්ද වෙන්නේ? දේශපාලඥයා පොලීසියට කථා කරලත් කියන්නේ, අනේ මේක balance කරලා දෙන්න. ඉතින් මෙහෙම රටක රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රාර්ථනා කරන නෙදර්ලන්තය. ස්විස්ටර්ලන්තය. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රාර්ථනය කරන ඒ සුබිත මුදිත වූ දේශය හදන්න පුළුවන්ද? බැහැ.

ජනවාරි 08 වැනිදා බලයට පත් වුණු සමහරුන්ට මතක නැහැ මාව පත් කළේ කවුද කියලා. ඉතිහාසය අමතක වෙනවා ඇති මේ රටේ මිනිස්සුන්ට. සමහරුන්ව අපි ප්‍රවෘත්ති සාකච්ඡාවලට ගෙනාවාම වතුරෙන් ගොඩ දාපු මාලුවා වාගේ. වෙව්ලනවා. කථා කර ගන්න බැහැ. වතුර පොවනවා. හැබැයි, ඊට පස්සේ අවුරුදු දෙක තුනක් ගියාට පස්සේ තමන්ට එතැනට එන්න අත දීපු මිනිස්සුන්ට ගහනවා. ඒක තමයි ලංකාවේ ඉතිහාසය. ඒක තමයි ලංකාවේ ස්වභාවය. තමන්ව තැනකට ගෙනාවාට පස්සේ ඒ ගෙනාපු ව්‍යාපාරයට, ඒ ගෙනාපු ව්‍යාපෘතියට පහර දෙනවා. ඊට පස්සේ වෙන්නේ ඒ රටේ න්‍යාය පත්‍රය වෙනස් වෙනවා. දැන් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය, අපි දහසක් බලාපොරොත්තු තියා ගෙන යහපාලනය ගෙනාවා. අවසානයේ මොකක්ද වුණේ? යහපාලනයේ ප්‍රධාන පුරවැසියා යහපාලනය විවේචනය කරන්න ගත්තා. ගිය පෙබරවාරි මාසේ මොකද වුණේ. කුඩුපට්ටම් වුණා. රටේ රාජ්‍ය නායකයා රටේ අගමැතිට බණිනවා. ඉතින් මම කියන්නේ නැහැ. (බාධා කිරීම්) ඔබතුමන්ලාට දැන් යන එන මං නැතිව ඉන්නේ. අපි කියන විධියට ඉන්න වෙනවා. නැත්නම් කොහේ යන්න වෙයිද දන්නේ නැහැ. කොහේ යන්නද? අපි නේ මන්ත්‍රීකම් දුන්නේ. අඬ අඬ ඉල්ලලා. කෑ නොගහා ඉන්න. පක්ෂය ගැන කියන්න එපා. අවසානයේ ඉතිරි වෙන්නේ -

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

යහපාලනය කරන්නේ කොහොමද? ආපු ගමන් කෑවා නේ? පුදපු ගමන් කාපි යකා තමයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බාධා කරන්න එපා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

බැදුම්කරයක් දා ගෙන කා ගත්තා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රාර්ථනය කරපු ලෝකය, ඩී.එස්. සේනානායක මැතිතුමා ප්‍රාර්ථනා කළා, මීට අවුරුදු 70 කට ඉස්සෙල්ලා. මොකක්ද? සහජීවනය. මේ රටේ මිනිස්සු සියලු දෙනාම එකට ජීවත් වෙන්න ඕනෑ. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම්, බර්ගර් මිනිස්සු ඔක්කොම එකට එකතු වෙන්න ඕනෑ. සියලු දෙනාම එකතු වෙන්න ඕනෑ. එකතු වෙලා යන්න ඕනෑ. මොකක්ද මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමන්ගේ පක්ෂයේ සම්මේලනයට ගිහින් කියන්නේ. සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් සියලු දෙනාම බෞද්ධ, කතෝලික එකතු වෙන්න ඕනෑ. අපේ 70 වන

[ගරු නිරෝෂන් පාදුක්ක]

සංවත්සරයේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියන්නේ මොකක්ද? ඒකමයි. අවුරුදු 70 ක් ඩී.එස්. සේනානායක මහත්තයා ප්‍රාර්ථනා කරපු රට හදන්න මේ රටේ කිසිදු දේශපාලන නායකයෙකුට බැරි වුණා. ඊට පස්සේ ආපු අය. ජාතිවාදය, ආගම්වාදය, කුලවාදය. දැන් ගෝත්‍රවාදය. මේ රට කෑලි කෑලිවලට කඩලා දාලා. ඒ නිසා ජේන තෙක් මානයක එතුමිය ප්‍රාර්ථනා කරපු ලෝකය පේන්න නැහැ. මේක තමයි ඇත්ත කථාව. මේක තමයි තිත්ත වුණත් ඇත්ත කථාව. දේශපාලඥයෝ තමන්ගේ බලයට ඒමේ වුවමනාව මත තමන්ගේ න්‍යාය පත්‍ර එක එක විධියට සකස් කරනවා. එතකොට අවසානයේදී මේ රටේ ජනතාවට තමන් ප්‍රාර්ථනය කරපු තැනට යන්න බැහැ. ඒක තමයි ඇත්ත කථාව. මිනිස්සු ඡන්ද මධ්‍යස්ථානයේ පෝලිමේ පැය ගණනක් හිට ගෙන ඉන්නේ ඒකද?

දැන් මේ බොරලැස්ගමුව නගර සභාව. පෝලිමේ ගිහින් ඡන්දය දුන්නේ. ගම මහින්දට කියලා. දැන් කවුද වැඩ කරන්නේ. මහින්දද? නැහැ. පත් වෙන සභාපති. මේ දාලා තිබෙනවා ඒකාධිපති යෝජනා දෙකක්. ආරම්භක යෝජනා දෙක. හිටපු සභාපතිවරු ඉන්නවා මෙතැන. සභාව සතු බලතල සභාපතිට පවරන්න. මේක තමයි යථාර්ථය. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම කරලා මේ රටට යන්න බැහැ. සියලු දේශපාලඥයන්ට සංඝායනාවක් ඕනෑ. අපේ හාමුදුරුවනේ ඒක ඔබවහන්සේලාගේ සංඝායනාවක් නොවෙයි. මේ ඔක්කොම. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය කිව්වා, ගෝල්ෆේස් ගෙනැල්ලා හම ගහනවා කියලා. එක්කෙනෙකුටවත් ගහන්න බැරි වුණා. ඒ නිසා අපි ඔබතුමා ඉදිරියේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රාර්ථනා කරන රට හදන්න නම් දේශපාලන විනයක් මේ රටේ දේශපාලනයට ඕනෑ. ජාතික ප්‍රතිපත්තියක් ඕනෑ. මේ රටේ කවදාවත් ප්‍රතිපත්තියක් නැහැ. දැන් අපි බොහොම අමාරුවෙන් කිව්වා, පාසලේ 41 දාමු. 39 ට අඩු කරමු කියලා. අඩු කරන්න පුළුවන්ද? අපි ඔක්කොම කියනවා. රාජකීය විද්‍යාලයේ පන්ති කාමරයයි, පළාත් සභාවේ පන්ති කාමරයයි දෙකම එක දිග පළල. හැබැයි, රාජකීය විද්‍යාලයේ පන්ති කාමරයේ 55 යි.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

දූසිම් පහයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

තව පහක් දාලා. හැටයි. එතකොට ඒගොල්ලන්ට හුස්ම ගැනීමේ අපහසුවක් නැද්ද? තිබෙනවා. හැබැයි, ඒගොල්ලෝ රාජකීයයි. විසාකා එකට ගියාම. විසාකා එකේ පන්ති කාමරය. ඒකෙත් අර පිරුණු ගණනයි. අපේ වාගේ සමාන්තර නැහැ. සමාන්තරය ඔක්කොම ගිහිල්ලා. 60 යි 61 යි. එතකොට ඒගොල්ලෝ. හැබැයි, ඒගොල්ලෝ හොඳට ඉගෙන ගන්නවා. ඒක තමයි යථාර්ථය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. තමන් සමාජවාදීද? ධනවාදීද? කොමියුනිස්ට්ද? තමන්ගේ මන්ත්‍රී හැඳුනුම්පතෙන් දරුවාව කොළඹ ජාතික පාසලකට දා ගත්තා. හැබැයි, 2015 ජනවාරි 08 ට ඉස්සෙල්ලා. එදායින් පස්සේ ඒක නම් නැවතුනා. මන්ත්‍රී හැඳුනුම්පතට ළමයින් ඉස්කෝලේ දාන්න බැහැ. මේ ඔක්කොම දැම්මා. ඒක තමයි ඇත්ත. එතකොට ඒගොල්ලන්ට දම්වැල් 20 නැහැ. ඒගොල්ලන්ට සුදුසුකම තාත්තා පාර්ලිමේන්තු මන්ත්‍රී වීම. අද නොවෙයි. එදා ඉඳන් වුණා. 1948 ඉඳන්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය හදවතේ සියුම්ම තැනින් මේ යෝජනාව ගෙනැල්ලා කියලා අපට පේනවා. එතුමිය ප්‍රාර්ථනය කරනවා ශ්‍රී ලංකාවක්. ඒ ප්‍රාර්ථනය කරන ශ්‍රී ලංකාව - මේ රටේ කවුරුත් ඉල්ලා අස් වෙන්නේ නැහැ. එහෙම දේශපාලනය වෙන්නේ නැහැ. මහිලා සමිතියෙන්වත් ඉල්ලා අස් වුණු කෙනෙකු නැහැ ලංකාවේ. ග්‍රාම සංවර්ධන සමිතියෙන්වත් ඉල්ලා අස් වුණු කෙනෙකු නැහැ, ලංකාවේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි ගාමිණී ජයසූරිය.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගාමිණී ජයසූරිය මැතිතුමා ඉල්ලා අස් වුණා. එතුමා ගෙදර එන කොට එතුමාට ගිහි ගෙය කලකිරුණා. එහෙම නායකවරු කිහිපයක් ඉන්නවා. මම දැන් කියන්නේ මේ රටේ වර්තමාන තත්ත්වය ගැන. ඒ නිසා තමුන්නාන්සේලා සියලු දෙනාටම අපි කියන්නේ, මේ රෝස්

ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රාර්ථනා කරන ලෝකය හදන්න නම් අපට ගොඩක් දේවල් ඉගෙන ගන්න තිබෙනවා. ශ්‍රී ලාංකික සංකල්පය. තවදුරටත් දියුණු කරන්න ඕනෑ. අද මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි වුණේ. තමන්ගේ රාජකාරිය කරන තැන ගෝලයාට ගහන කොට අනික් හත් දෙනා බලාගෙන ඉන්නවා. මැරුණාට පස්සේ ලොකු බැනර් එකක් දානවා. ජාතිවාදය විසින් ඝාතනය කරන ලද අපේ මිතුරාට නිවන් සුව පතනවා කියලා. ෂෙඩ් එකක. හැබැයි, තමන් එක්ක උදේ වැඩ කරන්න ආපු මනුස්සයාට ගහනවා. හත් දෙනෙක් බලාගෙන ඉන්නවා. එහෙම තමයි. බේරන්නවත් උත්සාහ කරන්නේ නැහැ. හැබැයි, අවසානයේදී මහා ජාතිවාදී අරගලයක් බවට පත් වෙන්න ගියා.

මම මේ ළඟදී එක්තරා රූපවාහිනී චැනල් එකක දැක්කා, රවී ශාස්ත්‍රී ඉන්දියානු ක්‍රිකට් කණ්ඩායමේ කළමනාකාරවරයාව interview එකක් කරනවා. ඔහුගෙන් අහනවා, මොකක්ද ඔබට හිතෙන්නේ. මේක තමයි මම ක්‍රිකට් ගහන්න ගිය හොඳම දේශය. මේ රටේ පැය හතරක් ඇතුළත කාලගුණ තුනක් භුක්ති විඳීමේ හැකියාව තිබෙනවා. මේ රටේ කිසිදු හේතුවක් මත ආයිත් ත්‍රස්තවාදයට හෝ ඒකාධිපතියකට යාමට ඉඩ දෙන්න එපා. ආරම්භයේදීම එය විනාශ කරලා දාන්න. ආයිත් ඔබේ රටට ඒ කුරිරු යුද්ධයක සාපය නැවතත් උදා කර ගන්න එපා. මේ රට ඉදිරියට යන්න ඕනෑ. ඇයි ලංකාවට ඉන්දියන් සංචාරකයෝ එන්නේ නැත්තේ. ඇයි ඔවුන් මාලදිවයෙන් බහින්නේ. මට හිතාගන්න බැහැ. රවී ශාස්ත්‍රී කියන්නේ. මේ රටේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න පුළුවන්. මේ රටේ IT වලින් ගොඩක් ඉස්සරහාට යන්න පුළුවන්. මේ රට මේ ආසියාවේ හොඳම Trading hub එක කරන්න පුළුවන්. තමුන්නාන්සේලාගේ රට භූගෝලීය වශයෙන් හොඳ තැනක පිහිටලා තිබෙන්නේ. ඔබ රට ඉදිරියට යන්න අපි සුභ පතනවා. එහෙම තමයි කියන්නේ. හැබැයි, අපට එහෙම යන්න පුළුවන්ද? දේශපාලන නායකවරු දවසෙන් දවස, පැයෙන් පැය, විනාඩි පහෙන් පහ තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍ර වෙනස් කරනවා. බලය වෙනුවෙන්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය ප්‍රාර්ථනය කරපු ශ්‍රී ලංකාව එතුමියගේ හත් වන උත්පත්තියේදී හෝ ලංකාවේදී බලා ගන්නට ඇයට හැකියාව, වාසනාව ලැබේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 12.58 ]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා ගෙන ආපු යෝජනාව සම්බන්ධව යම් පොඩි අදහසක් දක්වන්න මටත් අවස්ථාවක් ලැබීම ගැන ඇත්තටම සතුටු වෙනවා. වසර 2500 කට වඩා ඉතිහාසයක් තිබෙන අපේ රට ගැන කථා කරන්න ගොඩක් දේවල් තිබෙනවා. අද තිබෙන තත්ත්වය ගැන ඉතාම කනගාටුයි. හැබැයි, ජාතියක් විධියට තවමත් එදා ඉඳන් ඉතිහාසය තුළ අද දක්වා ආපු ගුණාංග තිබෙන මිනිස්සු ගොඩක් ඉන්නවා. අපි හැමදාම කරන්නේ හැම කෙනෙකුටම ඇඟිලි දික් කරන එක. අපේ රටේ ගොඩක් අය පුරුදු වෙලා තිබෙනවා - මේ මෑතකදී මම රැස්වීමකට ගියාම හරක් ගැන කථා කළා. හරක් ගැන කථා කළාම එතැන හිටපු මහත්තයෙක් කිව්වා, හරක් ඉතින් ලේසියෙන් සොයා ගන්න පුළුවන් කියලා පාර්ලිමේන්තුවේ. එතකොට මම ඒ මහත්තයාගෙන් ඇහුවේ, ඒ හරක්ව පාර්ලිමේන්තුවට ඇරියේ මී හරක් වෙන්න ඇති කියලා. මොකද, ඒ හරක් කියන කොටස යවලා තිබෙන්නේ අපේම මේ මිනිස්සු කොටසක් විසින්. හැබැයි, විවේචනය කරනවා. දැන් බණිනවා. මේ හැම දේකටම දේශපාලඥයාම වගකිව යුතුද කියන ප්‍රශ්නයක් අපට තිබෙනවා. මේ රටේ ඡන්ද කාලේට රටට ජාතියට වැඩ කරපු උගත් බුද්ධිමත් මිනිස්සු ඉදිරිපත් වෙනවා. හැබැයි, මිනිස්සු ඡන්දය දෙනවාද? රටට ආදරෙයි කියන අය කවුරුත් ඒ මිනිස්සු දිහා බලලා ඡන්දය දෙනවාද? කවදාවත් ඡන්දය දෙන්නේ නැහැ. හැබැයි, දේශපාලඥයාව විවේචනය කරනවා. මම මේ දේශපාලඥයෝ කිව්වාම මේ රටේ යමක් කරපු හොඳ, වැදගත්, බුද්ධිමත් දේශපාලඥයෝ ඉන්නවා. හැබැයි, විෂබීජ කියන එක ඉක්මනට පැතිරෙනවා. හොඳ පැතිරෙන්නේ නැහැ. ඒ වාගේ මේ දේශපාලනය තුළ ජඩකම් කරන, හොරකම් කරන බලුකම් කරන දේශපාලඥයෝ පිරිසක් ඉන්න නිසා අද දේශපාලඥයාට තිබෙන ගරුත්වය නැති වෙලා තිබෙනවා.

මේ රටේ නිදහස් අධ්‍යාපනය අපේ මිනිස්සුන්ට ගෙනාවේ දේශපාලඥයෝ මැදිහත් වෙලා. මේ රටේ ගොඩක් දේවල් ගෙනාවේ දේශපාලඥයෝ මැදිහත් වෙලා. අද දේශපාලඥයාගේ කාර්යභාරය දේශපාලඥයා දන්නේ නැහැ. ඒකට හේතුව තමයි දේශපාලඥයා හිතනවා,

[ගරු නිරෝෂා අතුකෝරළ ]

මළ ගෙදරකට යෑම, මඟුල් ගෙදරකට අත්සන් කිරීම, මෙවැනි දේවල් තමයි දේශපාලඥයාගේ කාර්යභාරය කියන එක. ප්‍රතිපත්ති හදන එක, ප්‍රතිපත්තිවලට වැඩ කරන එක කියන එක දේශපාලඥයාට අද අමතක වෙලා. මොකද, අපි දන්නවා මිනිස්සු ඡන්දය දෙන්නේ නැහැ මළ ගෙදරට ගියේ නැත්නම්. පාර්ලිමේන්තුවේ වැදගත් යෝජනාවක් ගෙනාවත්, ඒකට ගියේ නැති වුණත් මළ ගෙදරට යනවා. මොකද, දේශපාලඥයාට වැදගත් ප්‍රතිපත්තිය ගැන කථා කිරීම නොවෙයි. ඡන්දය ගන්න මළ ගෙදරට යන එක. මෙතැනට රට ආවේ කොහොමද? ඉතිහාසයේ එහෙම වුණාද? අද අපි සමහර අවස්ථාවලදී දොස් කියනවා. නමුත් මේ හැම එකක්ම කවුද ඉදිරිපත් කළේ? අපි කෘෂිකර්මාන්තය ගැන කථා කරනවා. මෙතුමා කිව්වා වාගේ, මේ රට පෙරදිග ධාන්‍යාගාරය කිව්වා. එදා කෝටි හයක් මේ රටේ ජනතාව හිටියා. රටට බත දුන්නා. හැබැයි, පොහොර තිබුණාද? පොහොර සහනාධාරය තිබුණාද? මේ පොහොර සහනාධාරය හඳුන්වා දුන්නේ කවුද? කෙමිකල් හඳුන්වා දුන්නේ කවුද? මේ රජයේ එවකට පත් වන මැති ඇමතිවරුන්ගේ කොමිස් එක අවශ්‍යතාවය මත මිනිස්සුන්ට විවිධ දේවල් මේ රටේ හඳුන්වා දුන්නා. හැබැයි, ඊට පස්සේ ඒවා වෙනුවෙන්ම ඒ පරපුරේ දේශපාලඥයාම සටන් කරනවා, ඒවා වැරදියි කියලා. මේ රටේ හැම දෙයක්ම විවිධ තනි පුද්ගලයන්ගේ අවශ්‍යතාවයක් මත විවිධ දේවල් හඳුන්වා දෙනවා. හඳුන්වා දුන්නාම පාරම්පරිකව ඉතිහාසය පුරා එන සියල්ලම වෙනස් වෙනවා.

අද අධ්‍යාපනයට මොකක්ද මේ රටේ වෙලා තිබෙන්නේ? මෙවර සාමාන්‍ය පෙළ විභාගයේ 73% ක් විභාගය පාස්. අද කියනවා, රජයේ සේවකයෝ රජයට බරක් කියලා. හැබැයි, 73% ක් සාමාන්‍ය පෙළ පාස් වුණාම මොකද වෙන්නේ? ඒ දරුවා නැවත කුඹුරට බහිනවාද? ඒ දරුවා වඩු බාසුන්නැහැ කෙනෙකු වෙනවාද? නැහැ. ඊට පස්සේ කෙළින්ම දොස්තරලා, එහෙම නැත්නම් කාර්යාල විතරයි වැඩ කරන්නේ. එතකොට මේ රටේ අධ්‍යාපනය සහ ආර්ථිකය අතර යම් ගැටළුවක් තිබෙනවා. මොකද, මහ පොළොවේ ඉන්නේ නැතිව තරු අල්ලන මිනිස්සුන්ට මහ පොළොවේ තිබෙන දේ දැනෙන්නේ නැහැ. මහ පොළොව දැනෙන්නේ නැති මිනිස්සුන්ට මේ රට කවදාවත් ගොඩ නගන්න හම්බ වෙන්නේ නැහැ. ඉස්සර එක්කෙනෙක් පළමුවැනියා කිව්වාම, පළමුවැනියාට වටිනාකමක් තිබුණා. අද පළමු වැනියෝ හය හතයි. මේ අධ්‍යාපන ක්‍රමය කොහොමද ලංකාවට හඳුන්වලා දුන්නේ. අද අධ්‍යාපන සහතිකය නැතිව අඩුම තරමින් වැසිකිලියක් හෝදන්නවත් යන්න බැහැ. ඉතින් මේ මිනිස්සුන්ගේ මනස කොහොමද හදන්නේ? කාර්මිකයෝ බිහි කරන්නේ කොහොමද? නිර්මාණශීලී මිනිස්සු බිහි කරන්නේ කොහොමද? අද දැනුම, දැනුම, දැනුම කියලා දැනුම මත පදනම් වුණු ක්‍රමයක් විතරයි මේ රටේ තිබෙන්නේ. මේ හින්දා මේ ගැන කතිකාවක් වෙන්න ඕනෑ. සමහර දේශපාලඥයෝ මේ රටේ ඇමතිකම් කරන කොට එයාලා හිතනවා එයාලා කැමැති දේවල් කෙරුවාම මේ රටේ මුළු ජනතාවටම ඒක හොඳයි කියන එක. ඒක හොඳ වෙන්නේ නැහැ කවදාවත්. ඒක එක්කෙනෙකුගේ මතයක් විතරයි. ඒ හින්දා මෙවැනි දේශපාලඥයෝ හින්දාමයි මේ රට විනාශ වෙලා තිබෙන්නේ. ඒ වාගේම මේ රටේ සමහර ජනතාව එදා කිව්වේ ගුරු මහත්තයා. ගුරු නෝනා. අද ගුරු මුදලාලි. අද පාසල් අධ්‍යාපනය විතරක් දරුවන්ට ඇතිද? අද දරුවෝ හැම කෙනෙකුම අමතර පන්තියකට යා යුතුයි. එතකොට ඒ ගුරු මුදලාලිලා ඉස්කෝලේ කියලා දෙන්නේ නැති එක ටියුෂන් පන්තියේදී කියලා දෙනවා. එදා වෙද මහත්තයා හිටියේ. අද වෙද මුදලාලිලා ඉන්නේ. අද නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත්තත් - හැම කෙනෙක්ම නොවෙයි. එතකොට ඒ සාධාරණය සමාජයට ඉෂ්ට කරනවාද? අද මේ රටේ වෙද මහත්තයා, ගුරු මහත්තයාට ඇඟිල්ල දික් කරනවා. අපි හැම කෙනෙකුම හැම කෙනෙකුටම ඇඟිල්ල දික් කරන්න පුරුදු වෙලා තිබෙනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඇයි බණත් එහෙමයි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

බණ ගැන කියනවා නම්, මම ඔබතුමාට උත්තරයක් දෙන්න ඕනෑ. ලෝකයේ රටවල් ගත්තොත් එහෙම - මම යුරෝපයේ අවුරුදු විසි ගණනක් ජීවත් වුණු මනුස්සයෙක්. ආගන්තුක සත්කාර තිබෙන එකම රට ශ්‍රී ලංකාව. දූෂණ අතින් අපි පත්තරවල දැක්කාට අද තාත්තලා අතින් දූවලා 70% ක් යුරෝපයේ දූෂණය වෙනවා. නමුත් මේ රටේ අපේ හාමුදුරුගොල්ලෝ ටික මේ තරම්වත් බණ කියන හින්දා

තමයි සදාචාරය කියන එක මේ රටේ අද ඉතිරි වෙලා තිබෙන්නේ. අද බෞද්ධ පදනමක් මේ රටේ තිබෙන නිසා, අපේ හාමුදුරුවෝ ටික කට කැඩෙනකල් උදේ ඉඳන් හවස් වෙනකල් බණ ටික කියන නිසා තමයි මේ තරමටවත් මේ රටේ මේ සදාචාරය ඉතිරි වෙලා තිබෙන්නේ. මොකද, අපේ රටේ මිනිස්සුන්ට කොපමණ දොස් කිව්වත් මේ රටේ මිනිස්සු වෙනුවෙන් උණු වෙන මිනිස්සු ඉන්නේ. බලන්න, ගං වතුර එන්න. ඇමරිකාවේ ගං වතුරක් ඇවිල්ලා 40,000 ක් මැරුණාම ලංකාවේ සුනාමි ඇවිල්ලත් බඩගින්නේ මැරුණේ නැහැ එක්කෙනෙක්වත්. මොකද, මිනිස්සු ක්‍රියාත්මකයි. හැබැයි, රජය මැදිහත් වෙන්නේ නැතිව ඇමරිකාව වාගේ රටවල්වල මිනිස්සු එන්නේ නැහැ. මැදිහත් වෙන්නේ නැහැ. නමුත් අපේ රටේ මිනිස්සු ගෙදර රස කෑමක් ඉව්වත් ඒකෙන් පොඩ්ඩක් එහා ගෙදර මිනිස්සුන්ට දෙන්න පුරුදු වෙලා තිබෙනවා. මේ මනුස්සකම තිබෙන මිනිස්සු තවමත් මේ රටේ ඉන්නවා. ඒ මනුස්සකම මේ රටේ තිබෙනවා. ඒ නැතිකමක් නොවෙයි. අද විවිධ දේවල් නිසා මේ මනුස්සකම් සියල්ල යටපත් වෙලා තිබෙනවා.

අද මේ රටේ දේශීය ආර්ථිකය නගා සිටුවන්න කියලා තිබෙනවා. මේ දේශීය ආර්ථිකය නගා සිටුවන්න මොනවාද කරන්නේ. අද ඉන්දියාව වාගේ රටක එක ගම්මානයක, එක කාන්තාවක් තමයි පොඩියට පටන් අරගෙන තිබෙන්නේ පපඩම් හදන්න. අද ඉන්දියාවට, ලංකාවට ආසියාවේ සියලු රටවල්වලට මුළු ලෝකයට ඒ ගමෙන් තමයි පපඩම් අදින්නේ. හැබැයි, ඉන්දියාවට කොහෙන්වත් පපඩම් ගේන්නේ නැහැ. හැබැයි, ලංකාවේ දේශීය කර්මාන්තයට අවස්ථාවක් දෙනවාද? පන් වියන කෙනාට පන් ටික ගන්න බැහැ. ඒකට ගහන tax එක වැඩියි. හැබැයි, පිටරටින් ගේන පන්වල tax එක අඩුයි. ලංකාවේ වගා කරන එකට වැඩිය ඒක ගන්න එක ලාභයි. දේශීය ආර්ථිකය නගා සිටුවන්න කිව්වාට, දේශීය ආර්ථිකය නගා සිටුවන්න කිසි දෙයක් මේ රටේ මම දන්නේ නැහැ පත් වුණු කවුරුවත් කරලා තිබෙනවාද කියලා. හැබැයි, කථාවෙන් මේවා ඔක්කොම ක්‍රියාත්මක කරනවා. අපි මහ පොළොවේ කාන්තාවෝ එක්ක වැඩ කරන හින්දා මේකේ අමාරුව හොඳට දන්නවා. අද හඳුන්කූරක් නිෂ්පාදනය කරලා වෙළඳපොලට දාන්න බැහැ. ඉන්දියාවෙන් ඊට වඩා ගොඩක් ලාභෙට හඳුන්කූරු මේ රටට ගේනවා. ඉතින් මේ දේශීය ආර්ථිකය නගා සිටුවන්නේ කොහොමද? අද බලය මත සල්ලි මත සියල්ල පදනම් වෙලා තිබෙන්නේ. මිනිස්සුන්ගේ මනුස්සකම් සියල්ල නැති වෙලා තිබෙන්නේ. හැබැයි, දේශපාලඥයෝ මම කියනවා, ඡන්ද කාලෙට බෙදිලා ඉල්ලුවාට කමක් නැහැ. හැබැයි, අපට එකට වැඩ කරන්න බැරි ඇයි? හොඳ දේට අත උස්සන්න බැරි ඇයි? හොඳ දේට සහයෝගය දෙන්න බැරි ඇයි? අපේ මිනිස්සු හොඳ වුණත්, නරක වුණත් මම යූඑන්පී නම් මම ශ්‍රී ලංකා නම්, මම ජනතා විමුක්ති පෙරමුණේ නම් ඒ මතයේම තමයි ඉන්නේ. හොඳ දේට කථා කරන්නේවත් නැහැ. හොඳ දෙයක් ජනතා විමුක්ති පෙරමුණෙන් ගෙනාවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ගෙනාවත්, එක්සත් ජාතික පක්ෂයෙන් ගෙනාවත් අපට පුළුවන් වෙන්න ඕනෑ, මේ රටට අපි ආදරේ නම් ඒකට සහයෝගය දෙන්න. හැබැයි, හොඳ දෙයක් ගෙනෙන කොට, පනතක් හරි ඒකට අපි විරුද්ධ වෙනවා නම් අපේ දේශපාලන වාසිය තකා මේ රට කවදාවත් ගොඩ නගන්න හම්බ වෙන්නේ නැහැයි කියන එක අපි අනිවාර්යයෙන්ම කියනවා. මොකද, ගොඩක් මේ රටේ එවැනි අය තමයි ඉන්නේ. ඒ හින්දා මේ රට හදන්න නම් -

මම නම් වැඩියෙන්ම මගේ ජාතියටයි, මගේ ආගමටයි ආදරෙයි. මොකද, මගේ අම්මා කොපමණ නරක වුණත් මම මගේ අම්මාට ආදරෙයි. ඊට පස්සේ තමයි මේ රටේ අනික් හැම අම්මලාටම ආදරේ. ඒ වාගේ මගේ රට වෙනුවෙන්, මගේ ජාතිය වෙනුවෙන් මම කරන්න පුළුවන් ඉහළම දේ කරලා තමයි අනික් ජාතිය වෙනුවෙන් කරන්නේ. හැබැයි, එහෙමයි කියලා අපි අනික් ජාතීන්ට විරුද්ධ වෙන්නේ නැහැ. පොල් වත්තේ ගොටුකොල හැදෙන්න පුළුවන්. ගොටුකොළ අපි උගුල්ලලා දාන්නේ නැහැ. පොල්වත්තේ ගොටුකොළ හැදෙන්න පුළුවන්. හැබැයි, පොල්වත්තට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා අපි සියලු දෙනාම මේ රටට අවංකව වැඩ කරන්න පුළුවන් නම් - අපි මේ පළාත් සභාවට එනවා. යෝජනා ගේනවා. අද වෙනකල් එකක් සම්මත වෙලා තිබෙනවාද? මොනවාද සම්මත වෙලා තිබෙන්නේ? කථිකා කරලා වැඩක් තිබෙනවාද? අද මම මෙතැනට වෙලා ඉන්නේ නැතිව ගෙදරට වෙලා හිටියා නම් අද මළ ගෙවල් දෙක තුනකට ගිහිල්ලා ඡන්ද ටිකක්වත් ගන්න හදා ගන්න පුළුවන්. සම්මත වෙනවා. ඉෂ්ට වෙන්නේ නැහැ. ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපේ මොකක්ද කාර්යභාරය. මන්ත්‍රීවරු විධියට අපි වැටුපක් ගන්නවා. ඒ වැටුපට අපෙන් වැඩ ගන්නවාද? අද අමාත්‍යාංශ පහක් තිබෙනවා. අපි මොකද කරන්නේ?

[ගරු නිරෝෂා අතුකෝරළ ]

අද පෙර පාසල් අධ්‍යාපනයට මොකද වෙලා තිබෙන්නේ? රෙජිස්ටර් පෙර පාසල් ලංකාවේ කීයද තිබෙන්නේ? අද පෙර පාසල් අධ්‍යාපනය ගැන කවුරුවත් බලනවාද? දරුවන්ට පොඩි කාලේ මොනවාද උගන්වන්නේ. අද කිසිම ප්‍රතිපත්තියක් නැහැ. එක පෙර පාසලක ඉංග්‍රීසි ලියන්න උගන්වනවා. එක පෙර පාසලක කථා කරන්න උගන්වනවා. අපට නමුත් කියන්නේ මොකක්ද? පුංචි කාලේ, කුඩා කාලේ ළමයින්ට අකුරු උගන්වන්න එපා කියලා. හැබැයි, රජයේම ඉස්කෝලේ එකේ පන්තියට ගන්න කොට අහනවා, ලියන්න පුළුවන්ද කියලා. ලියන්න පුළුවන් නම්, විභාගය පාස් නම් විතරයි ගන්නේ. එතකොට මොකක්ද මේ රටේ තිබෙන ප්‍රතිපත්ති. මේ රට හදන්න නම් මේ රටට ආදරය කරන, මේ රටේ ඉඳගෙන ඇමරිකාවට ප්‍රතිපත්ති හදලා වැඩක් නැහැ. මේ රටේ දරුවන්ට Tab හම්බ වෙනවා නම් හොඳයි. හැබැයි, කන්න නැති, ඉගෙන ගන්න නැති, ඉගෙන ගන්න පුටුවක් නැති ඉස්කෝල කීයක් මේ රටේ තිබෙනවාද? අපි අවශ්‍යතාවයන්, අත්‍යවශ්‍යතාවයන් මේ රටේ හඳුනාගන්න ඕනෑ.

මේ රටේ ප්‍රධාන මාර්ග හැදෙනවාට කැමැතියි. වරායවල් හැදෙනවාට කැමැතියි. හැබැයි, ගමේ පාරේ ලෙඩාව ගෙනියන්න බැහැ. පාරක් නැහැ. ඒවා හැදෙන්නේ නැහැ. ඒවා කථා කරන්නේ නැහැ. දේශපාලඥයා කරන්න ඕනෑ. ප්‍රාදේශීය සභාවෙන් කරන වැඩේ අද දේශපාලඥයා කරන්නේ. පොලීසියෙන් කරන වැඩේ අද දේශපාලඥයා කරන්නේ. මේකද අපි බලාපොරොත්තු වෙන රට? මම හිතන්නේ මේ රටේ අපේ ජනතාව අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ රටේ මාරු කරන්න ඕනෑ ජනතාව. මේ රටේ ජනතාව වෙනස් වෙන්න ඕනෑ. මේ රටේ හිතන විධිය වෙනස් වෙන්න ඕනෑ. ආධාර ලැබෙනවා, ප්‍රතිපාදන ලැබෙනවා කිව්වාම ඡන්දය දෙනවා. ඡන්දය හෙට නම් අද කිලෝ දහය දහය හාල් දුන්නොත් එයාට ඡන්දය දෙනවා. අපි කොපමණ දේවල් වෙනස් කළත් වැඩක් නැහැ. ඒ මනුස්සයාගේ මනස හදන්න බැරි නම්. ඉතින් මිනිස්සු වෙනස් වෙන්න ඕනෑ. මම නම් කියන්නේ මිනිස්සු නැවත තාත්තලාගේ දණිස්සේ ඉඳන් ගන්න ඕනෑ. නැත්නම් වෙනස් කරන්න බැහැ මේ හිතන ක්‍රමය. මොකද, තමන්ගේ පුද්ගලික, තමන්ට වදින තැනදී තමන් කථා කරනවා. හැම තිස්සේම අපි ආත්මාර්ථකාමීයි. මේකෙන් පොදු ජනතාවට මොකක්ද වෙන්නේ කියන එක හිතන්නේ නැහැ. මිනිස්සුන්ට පොදුවේ හිතන්න පුළුවන් නම් මේ රට මීට වඩා ගොඩක් සුන්දර වෙනවා.

ඉතින් මහජනතාවත්, මම ඇතුළු අපි සියලු දෙනා මෙතුමා කිව්වා වාගේ මේ සියලු දෙනා මේ ක්‍රමයට වගකිවයුතුයි. ඒ හින්දා මේ ක්‍රමය වෙනස් කරන්න නම්, මීට වඩා රටට ආදරය කරන, රටේ මහ පොළොවට දැනෙන රටේ මිනිස්සුන්ගේ මනස තේරුම් ගන්න පුළුවන්. විශේෂයෙන් අධ්‍යාපන ඇමති කෙනෙකු එන්න ඕනෑ. මොකද, මේ රට වෙනස් කරන්න නම් අධ්‍යාපනයට තමයි පුළුවන්.

අද අපි ත්‍රීරෝද රථ රියදුරන්ට බණිනවා. අවුරුදු 18 පහු වුණු ගමන් ත්‍රීවීල් එකක් අරගෙන හයර් එකේ යනවා කියලා. හැබැයි, මේ රටේ දේශපාලඥයාට තේරුම් ගන්න බැහැ අපි තවමත් අපේ රටේ මිනිස්සු කැමැති පවුලත් එක්ක එකතු වෙලා ඉන්න. ඇයි ත්‍රීරෝද රථයක් ගන්නේ? උදේට දරුවාව ඉස්කෝලේ දාන්න පුළුවන්. දවල්ට ඇවිල්ලා ගෙදර නෝනායි දරුවෝ එක්කයි කන්න පුළුවන්. හවසට ඇවිල්ලා තේ එකක් බීලා යන්න පුළුවන් හයර් එකක් යන ගමන්. මොකද, අපි තවම පවුල වටා බැඳුනු මිනිස්සු ඉන්නේ. අපි පවුලට ආදරෙයි. අපි අම්මා තාත්තාට ආදරෙයි. අපි නෑදෑයෝ බලන්න යනවා. අපි තවම පවුලත් එක්ක ගැට ගැහුනු, බැඳීමක් තිබෙන ජාතියක්. මෙන්න මේ ජාතියේ හැඟීම තේරුම් ගන්න බැරි නම් මේ රටේ නායකයන්ට මේ රට හදන්න බැහැ. මේ රටේ නායකයෝ මේ රටේ මහ පොළොවේ මිනිස්සුන්ගේ හැඟීම තේරුම් ගන්න ඕනෑ. මොකද, තමන් සුරංගනා ලෝකයේ නම්, මහ පොළොවේ නැතිව තරු අල්ල අල්ලා මේ රට කවදාවත් හදන්න බැහැ. ඉතින් මම ප්‍රාර්ථනා කරනවා. මම මේ රටට ආදරෙයි. මම අවුරුදු විසි ගණනක් යුරෝපයේ හිටපු කෙනෙක්. මොකද, ඒ රටවල්වල තිබුණු හැම දෙයක්ම දැකපු කෙනෙක්. විඳපු කෙනෙක්. ඒ නිසා මම මේ රටට ආදරෙයි. පැයක් ඇතුළත දේශගුණය සීතල නම් සීතල, රස්නේ නම් රස්නය විඳින්න පුළුවන් ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව. මේ රට රකින්න ඕනෑ. මේ රට ආරක්ෂා කරන්න ඕනෑ. ඒකට මේ රටට ආදරය කරන මිනිස්සු මේ රටේ පත් වෙන්න ඕනෑ. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා. මෙවැනි යෝජනාවක් ගෙනාපු එක ගැන. මටත් අවස්ථාවක් ලැබීම ගැන ස්තුතිවන්ත වෙමින් එකට එකතු වෙලා මේ රට ගොඩ නගමුයි කියන යෝජනාව ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.14 ]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා විසින් ඉදිරිපත් කළ යෝජනාවට ඉතාම ඕනෑකමින් සහ බොහොම තාර්කිකව අදහස් ඉදිරිපත් කරපු අපේ උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා, සිරිකමල් පිලිෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා, ෂාෆි රහීම් ගරු මන්ත්‍රීතුමා, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා සහ නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමිය ඇතුළු ඒ සියලුම මන්ත්‍රීතුමන්ලාට මම ස්තුතිය ප්‍රකාශ කරනවා. මම හිතන්නේ අපගේ සභා කාලය බොහොම වැදගත් දෙයකට අද යොමු කළාය කියලා. සමස්තයක් හැටියට ගත්තාම අපේ යෝජනාවේදී මේ රට හරි තැනකට ගමන් කළ යුතුයි. ඒ වාගේම කඩිනම් සීඝ්‍ර සංවර්ධනයක්, ඒ කියන්නේ රට විනාශ වන සංවර්ධනයක් නොවෙයි. හැම දෙයක්ම ආරක්ෂා කර ගෙන කඩිනම් සංවර්ධනයකට ආර්ථික සංවර්ධනයකට ගමන් කළ යුතුයි කියන යෝජනාව අපි ඉදිරිපත් කළේ. ඉතාම සාමකාමීව ඒ විවාදය පැවැත්වුණා. ඒ වාගේම මම හිතන්නේ කිසිම කඩාකප්පල් කිරීමක්, බාධා කිරීමක් නැතිව බොහොම වැදගත් විධියට මේ සංවාදයට සම්බන්ධ වීම ගැන සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. වෙනදාට වැඩිය අපි දකිනවා මේ පළාත් සභාව ක්‍රමානුකූලව හරි අතකට ගමන් කරනවාය කියලා.

ඇත්ත වශයෙන්ම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. පුංචි පුංචි අඩුපාඩුකම් ඕනෑම තැනක තිබෙන්න පුළුවන්. අපේ වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කියා සිටියේ සාමාන්‍ය දේශපාලනයේ මෙවැනි දේ සිද්ධ වෙනවාය කියන එක. නමුත් මොන දේ කොතැන සිද්ධ වුණත්, හරි දේ කඩිනමින් කරලා රටට යථාර්ථවාදී යහපත් ආර්ථිකයක් අරගෙන දීම, ඒ වාගේම ඒ යුතුකම් හරියට කාල වේලාවට ඉෂ්ට කිරීමට තමයි මහජනතාව අපිව පත් කරලා එවලා තිබෙන්නේ. විශේෂයෙන්ම දෙන දේ කාලා වෙන දේ බලාගෙන ඉන්න නොවෙයි මහජනතාව අපිව පත් කරලා එවන්නේ. ඉතින් මේ සියල්ල අවබෝධ කර ගෙන මා විශේෂයෙන්ම සඳහන් කරනවා. අවසාන වශයෙන් අද මෙතැන තිබෙන විදුලි ආලෝකය අපට ලැබෙන්නේ නැහැ, යම්කිසි කෙනෙක් ඒ නිර්මාණය කල්පනා කරලා කෙරුවේ නැත්නම්. අද අපි ඉන්න තාක්ෂණය අපට ලැබෙන්නේ නැහැ, යම්කිසි කෙනෙකු කල්පනා කරලා ඒ දේ නිර්මාණය කළේ නැත්නම්. ඒ වාගේ තමයි දේශපාලන නායකයෝ හැටියට ඒ අවශ්‍ය නිර්මාණය අපි කෙරුවේ නැත්නම් මේ රට හරි තැනකට යන්නේ නැහැ. ඒ නිසා ඒ සියලු අදහස් ප්‍රකාශ කිරීම්වලට ස්තුති කරමින්, ඒ වාගේම ගරු සභාපතිතුමා, ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා ඇතුළු සාවදානව කටයුතු සම්පාදනය කළ කාර්ය මණ්ඩලය ඇතුළු සියලුම දෙනාට ස්තුති කරමින් මෙම යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීම පමණක් නොවෙයි. ඒ වාගේම අපටත් තවත් දුරටත් හිතන්න දේවල් ඉදිරිපත් කළ සියලු දෙනාටම ගෞරවනීය ස්තුතිය ප්‍රකාශ කරමින් යෝජනාව සභා සම්මත කිරීමෙන් අනතුරුව රජය වෙත යැවීමක් අපි සිද්ධ කරනවා. ඒ අවශ්‍ය නිලධාරීන් වෙත යැවීමක් සිද්ධ කරනවා. ඒ සියල්ල ඉටු කරන්න කියන දේ ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. සියලු දෙනාටම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීමනි, "දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි" යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

# කල් තැබීමේ යෝජනා යටතේ අසනු ලබන ප්‍රශ්න
# QUESTIONS RAISED UNDER MOTION FOR ADJOURNMENT

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමනි, කාර්ය පටිපාටි 30(1) යටතේ සෞඛ්‍ය අමාත්‍යතුමාට මම ප්‍රශ්න ටික ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සති දෙකක කාලයක් ඉල්ලනවා. මේ අවස්ථාවේදී ඇමතිතුමා නොමැති නිසා. මීළඟ න්‍යාය පත්‍රයට -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු මන්ත්‍රීතුමනි, මේක මතු කරන්න ඕනෑ. දැන් මමත් සමහර වෙලාවට විශේෂ වැදගත්කමකින් යුත් ප්‍රශ්න සභාව කල් තබන අවස්ථාවේ අහනවා. හැබැයි, මේ සභාවේ ඒවාට කවදාවත් උත්තර දෙන්නේ නැහැ. මොකද, ඒ දාන්නේ ඇත්තටම එදිනට අපට උත්තර ඕනෑ ප්‍රශ්න නිසා. නමුත් පුරුද්දකට ගිහිල්ලා තිබෙනවා. මේ අමාත්‍ය මණ්ඩලය හැමදාම කරන්නේ, ඒක සති දෙකකට ගල් ගැනීම. ඒක අපට අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. අපට න්‍යාය පත්‍රයට දාන්න පුළුවන්. ඒ නිසා ඒක නරක පූර්වාදර්ශයක් වෙලා තිබෙන්නේ. මොකද, අපිත් ඒකට ඉඩ දෙනවා. දැන් ඒක නරකට ගිහිල්ලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නය කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ ප්‍රශ්න මෙතුමා කිව්වා වාගේ අද දවසට වැදගත්. මොකද, අපට දැනුවත් ආරංචියක් තිබෙනවා හෙට දවසේ පත්වීම් වගයක් ප්‍රදානය කිරීමට නියමිතයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ප්‍රශ්නය

අ. 2017, 2018 වසර දෙකේදී පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කළ බඳවා ගැනීම් මොනවාද? එක් එක් තනතුරු වශයෙන් කොපමණ සංඛ්‍යාවක්ද?

ආ. ආදේශක හෝ තාවකාලික සෞඛ්‍ය කාර්ය සහායක ලෙස 2017 දී පළාතේ රෝහල්වල බඳවා ගැනීම් කොපමණ සිදු කළේද? බඳවා ගත් පදනම පැහැදිලි කරන්න.

ඇ. 2018 වර්ෂයේ පළාත් රෝහල් සේවය සඳහා තවත් සෞඛ්‍ය කාර්ය සහායකවරුන්/වරියන් බඳවා ගන්නේද? ඔවුන් කී දෙනෙක්ද? බඳවා ගන්නේ කවර පදනමකින්ද?

ඈ. තාවකාලික සේවයට පිරිසක් බඳවා ගෙන සේවයේ යොදවා සිටියදී ස්ථිර සේවය සඳහා සෞඛ්‍ය කාර්ය සහායකවරුන්/වරියන් පිරිසක් බඳවා ගන්නේද?

මේක දැන් පවතින ප්‍රශ්නයක්. Prevailing issue. දැන් හෙට දවසේ මතු වන ප්‍රශ්නයක් මේ අහන්නේ. ඇමතිතුමා නොදන්නා කාරණාවකුත් නොවෙයි. මේක හොඳට ඇමතිතුමා දන්න කාරණයක්. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මතු කරපු කාරණය ගරු ඇමතිතුමනි. මේක ඇත්තටම නරක පූර්වාදර්ශයක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා** *[ලලිත් එල්ලාවල මහතා]*
Hon. Presiding Member *[ Mr. Lalith Ellawala ]*

පැහැදිලිවම ගරු මන්ත්‍රීවරයෙකු මේ සභාව කල් තබන අවස්ථාවේදී ප්‍රශ්නයක් අහන්නේ එවෙලේම ඒ උත්තර ටික ලබා ගැනීම සඳහා. අපි මේ ගැන ගරු සභාපතිතුමාවත් දැනුවත් කරනවා. මේ අමාත්‍යතුමන්ලාත් සමඟ සාකච්ඡා කරලා අනිවාර්යයෙන්ම සභාව දවසට මේ අමාත්‍යවරු සියලු දෙනා සභාවේ රැඳී සිටින්න. මොකද, පැහැදැලිවම මාසයකට එක දවසයි දෙකයි තිබෙන්නේ. එදාට අපේ අමාත්‍යවරු මෙතැන ඉන්නවා නම් මේ අනවශ්‍ය ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට නිසි ලෙස උත්තර දෙනවා. ඇත්තටම ඒ පිළිබඳව අපි ඉදිරියේදී සභාපතිතුමාව දැනුවත් කරනවා. සියලු අමාත්‍යවරුන්ට සභාවේ රැඳී සිටින ලෙස දැනුවත් කරන්නය කියලා. ඒකත් එක්කම අපි ඒ අදාළ අමාත්‍යවරයාව දැනුවත් කරනවා. කඩිනමින් ඔබතුමාට මේකට අවශ්‍ය පිළිතුරු ලබා දෙන්න කියලා.

# කල් තැබීම
# ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා** *[ලලිත් එල්ලාවල මහතා]*
Hon. Presiding Member *[ Mr. Lalith Ellawala ]*

"දැන් මම මෙම සභාව කල් තබනවා."

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.22 ට, 2018 මැයි මස 08 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 01.22 p.m till 9.30 a.m. on 08.05.2018*